ස්තූතිය

පර්යේෂණ කටයුතු සඳහා මුදලින් ආධාර කිරීම, පර්යේෂණ කාර්ය මණ්ඩලය හුවමාරු කිරීම සහ පුහුණු කිරීමේලා පහසුකම් සැළසීම සඳහා අරමුදල් සැපයූ ආයතන හා විදේශීය රාජ්‍යයන්ටත් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයටත් මෙම මධ්‍යස්ථානය සිය ස්තූතිය පිරිනමන අතර, ඔවුන් දැක්වූ සහයෝගය පිළිබඳ කෘතඥතාවය ද මෙහිලා සඳහන් කරමි.

මෙම මධ්‍යස්ථානයේ කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක කර ගැනීම සඳහා ඊට නන් අයුරින් සහයෝගය දැක්වූ, ආධාර කලා වූ සමස්ථ කාර්ය මණ්ඩලයටත්, සභාපති ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය මෙයින් පිරිනැමේ.

ඉංජි. ශවින්ද්‍රනාත් ප්‍රනාන්දු
සභාපති
ශ්‍රී ලං. ජා. ඉ. ප. සහ සං. මධ්‍යස්ථානය

පටුන

මාතෘකාව	පිටු අංකය
1. පනත්, නීති සහ ව්‍යවස්ථාපිත පාලනය	02-03
2. අධ්‍යක්ෂ මණ්ඩලය සහ සංවිධාන ව්‍යුහය	04-06
3. සභාපතිතුමාගේ පණිවිඩය	07-08
4. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ විධායක කාර්ය මණ්ඩලය	09-11
5. මානව සම්පත	12-17
6. 2016 වර්සයේදී කාර්යසාධනය පිළිඹිබු කරලීම	18-32
7. සුභාසාධක සහ ආගමික කටයුතු	33
8. 2016.12.31 දිනට තත්ව ප්‍රකාශය	34
9. 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් වර්ගීකරණය කායී පදනම මත විදහා පෑම	35
10. 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය	36
11. 2016.12.31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ වත්කම්/ ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය	37
12. මූලික ගිණුම් ප්‍රතිපත්ති	38-44
13. 2016.12.31 දිනට ගිණුම්කරණ සටහන්	45-51
14. 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව	52-59
15. විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පැහැදිළි කිරීම	60-67

01. පනත්, නීති හාවස්ථාපිත පාලනය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ ප්‍රතිපාදන අනුව 1974 වර්ෂයේදී පිහිටුවන ලද අතර වර්තමානයේ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. දේශීය කර්මාන්ත, තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රයන්හි දියුණුව හා ප්‍රගමනය උදෙසා ව්‍යවස්ථාපිත පනතේ අරමුණු පෙරදැරිව ආයතනයේ කාර්යභාරය ඉටුකරනු ලබන අතර ජා ඇල, ඒකල, කාර්මික ජනපදය තුළ පිහිටුවා ඇත.

ආයතනයේ දැක්ම, පරමාර්ථය සහ මෙහෙවර පහත දැක්වේ.

දැක්ම

"දකුණු ආසියාවේ ප්‍රමුඛතම
ඉංජිනේරු පර්යේෂණ සහ
සංවර්ධන මධ්‍යස්ථානය
බවට පත්වීම"

අභිමතාර්ථය

"ශ්‍රී ලංකාවේ
සමාජ ආර්ථික සංවර්ධනය සඳහා
වන ඉංජිනේරුමය මැදිහත්වීම."

මෙහෙවර

"නව නිපැයුම් සහ ආයතනයේ කාර්ය මණ්ඩලය මෙන්ම
ආයතනය පිළිබඳ උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන්ගේ
නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය වන සංස්කෘතියක්
ආයතනය තුල ඇති කරමින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා
සෘජුව බලපෑමක් කළහැකි ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන කටයුතු
සිදුකරමින් ඉංජිනේරු තාක්ෂණයන් සංවර්ධනය,
අත්පත් කරගැනීම,
භාවිතා කිරීම හා පැවරීම"

මධ්‍යස්ථානය පිහිටුවන ලද පනතට අනුව වන අරමුණු වනුයේ :

1. ශ්‍රී ලංකාවේ නව සොයාගැනීම් සහ නිර්මාණ කුසලතාවන්ට ධෛර්ය දීමෙන්ද, ඒවායේ සංවර්ධනයට ආධාර දීමෙන්ද, දේශීය තාක්ෂණය සංවර්ධනය සඳහා අවශ්‍ය ආයතනික ක්‍රම ඇති කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම

2. සාමූහික ප්‍රයත්නයන් ඵලදායි අයුරින් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ විවිධ කර්මාන්තයන්හි සහ ආයතනයන්හි තාක්ෂණික ශිල්පීය ඉංජිනේරු සහ පර්යේෂණ කුසලතාවයන් ඒකාබද්ධ කිරීම පිණිස පහසුකම් සැළස්වීම.

3. රටේ සම්පත් දායාදයන්ට සහ ජාතික ක්‍රම සම්පාදනයේ අරමුණු වලට අනුකූල වන තාක්ෂණික ශිල්පීය ක්‍රම උපයුක්ත කිරීමට සහ ඒවා යොදා ගැනීමට වගබලා ගැනීම

4. අවශ්‍ය වූ විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි උචිත ආයතනයන්ට ඍජු ආකාරයෙන් සහ වක්‍ර ආකාරයෙන් තාක්ෂණික ශිල්පීය ක්‍රම මාරු කිරීමේ උපක්‍රම පරීක්ෂා කිරීම සහ ඒ ආයතනයන්ට උපදෙස් දීම.

5. උචිත තාක්ෂණික ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීමෙන් රටේ මානුෂික හා ද්‍රව්‍යමය සම්පත් වලින් විශේෂයෙන්ම ශ්‍රම සහ අමුද්‍රව්‍ය සම්පත් වලින් උපරිම උපයෝජණය අත්කර ගැනීමට අනුබල දීම.

6. ඉංජිනේරු ශිල්පීය සැළසුම් පර්යේෂණ පිළිබඳ තාක්ෂණික දත්තයන් සහ ලේඛණානයනය ජාත්‍යාන්තර හා ජාතික නියෝජිත ආයතනයන්ගේ සහයෝගයෙන් යුක්තව අඛණ්ඩව සමීක්ෂණය කිරීම සඳහා කටයුතු පිළියෙල කිරීම.

7. කාර්මික, වාණිජ සහ වෙනත් අරමුණු සඳහා යන්ත්‍ර භාවිතා කරන්නන් විසින් ඉල්ලුම් කරනු ලැබූවිට ආදර්ශ යන්ත්‍ර සහ නියමු යන්ත්‍රාගාර අරපිරිමැස්මෙන් යුක්තව සැළසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරීක්ෂා කර බැලීම.

8. රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි ව්‍යවසායනයට අඛන්ඩ උපදේශක සේවාවන් සැලසීම, රටේ ඉංජිනේරු සහ කාර්මික සැළසුම් පදනම මෙන්ම පර්යේෂණ හැකියාවන් පුළුල් කිරීම සඳහා පර්යේෂණ කටයුතු භාර ගැනීම සහ පුහුණු කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම.

9. ඉහත කී කරුණු වලට අදාළ ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සහ සම්බන්ධ කාර්යයන් සඳහා විධිවිධාන සැලැස්වීම.

02. අධ්‍යක්ෂ මණ්ඩලය හා සංවිධාන ව්‍යූහය

සභාපති

01. ඉංජි. ඩබ්.ජේ.එල්. ශවින්ද්‍රනාත් ප්‍රනාන්දු මයා (2016.05.03 සිට)
B Sc(Hon)Eng., M Eng, FIESL, MIET, C Eng.

02. ආචාර්ය.ටී.ඒ.ජී. ගුණසේකර මයා (2016.05.03 දක්වා)
M Eng(SL), M Sc(Hon) (Ire), PhD(Ire), MIE(SL), FIIE(SL), C Eng. I Eng.

අධ්‍යක්ෂ මණ්ඩලය

1. ඉංජි. ර්.ඒ.එස්.කේ. එදිරිසිංහ මහතා
C.Eng., MIET

2. ජී. චන්ද්‍රසිරි මහතා
B Com Degree

3. ඒ.එස්.ආර්. වෛද්‍යාසේකර මහතා
MBA(PIM-USJ), Chartered Marketer

4. ඉංජි. ඒ.එස්. සමරසිංහ මහතා
C.Eng

5. ඩී.ජී .නිලූකා කුමාරි මහත්මිය
Master of Business Studies, CBA

6. ඒ.එච්.එම්. අන්වර් මහතා

අධ්‍යක්ෂ ජනරාල්/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ඉංජි. ඩී.ඩී.ඒ. නාමල් මයා
M Eng (Energy Technology), Bsc Eng (Hons), C Eng, MIE(SL)

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

අනුමත බඳවාගැනීමේ පරිපාටියට අනුව සංවිධාන ව්‍යුහය



කාර්යාලය

28/17බී, කාර්මික ජනපදය
ඒකල, ජා ඇල.

තැපැල් සංකේත අංකය

11380

ඇමතුම් විස්තර

+ 94-011-2236284
+ 94-011-2236384
+ 94-011-2236307
+ 94-011-5354597

+ 94-011-2233153

nerdcentre@nerdc.lk

www.nerdc.lk

බැංකු කරුවෝ

- ලංකා බැංකුව - ජා ඇල
- ලංකා බැංකුව - ආයතනික ශාඛාව
- මහජන බැංකුව - ජා ඇල

විගණකවරු

විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව

03. සභාපතිතුමාගේ පණිවිඩය

දිවයිනේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ කාර්යසාධනය ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

නව තාක්ෂණයන්, නිෂ්පාදනයන් හා නවෝත්පාදන සපයමින් රටේ තිරසාර ආර්ථික සහ සමාජීය සංවර්ධනයට දායක වෙමින් ආයතනය පිළිබඳ උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන්ට මෙන්ම පොදු ජනතාවට ප්‍රතිලාභ සළසමින් නර්ඩ් මධ්‍යස්ථානයේ කාර්යභාරය 2016 වර්ෂය තුලද සාර්ථකව ඉටු කරන ලදි. මධ්‍යස්ථානය මගින් නව තාක්ෂණය මත පදනම් වූ ස්වයං රැකියා අවස්ථාවන් ඇති කිරීම සම්බන්ධයෙන් ප්‍රමුඛ කාර්යභාරයක් සිදුකරයි. කර්මාන්තයන්හි කාර්යක්ෂමතාවය හා ඵලදායීත්වය ඉහළ නංවාලීමට හා සම්පත් ඵලදායී ලෙස උපයෝජනය යනාදී ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන්ද 2016 වසර තුලදී මධ්‍යස්ථානය විසින් ක්‍රියාකාරී ලෙස දායක වී ඇත. නව නිපැයුම්කරුවන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පහසුකම් සැළසීම සහ පාසල් සිසුන් මෙන්ම මහජනතාව අතර විද්‍යා හා තාක්ෂණික දැනුම ප්‍රචලිත කිරීමෙහිද අඛන්ඩව නියැලී සිටිනු ලබයි.

නර්ඩ් මධ්‍යස්ථානයේ පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් අතර සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය තුල සිදුකරනු ලබන නර්ඩ් පිරිමැසුම්දායක ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය නිරන්තරයෙන්ම ප්‍රමුඛස්ථානයක් ගනී. සාම්ප්‍රදායික උළු මෙන්ම ඇස්බැස්ටස් රැලි තහඩු වලට විකල්පයක් ලෙස සිමෙන්ති සහ වැලි මිශ්‍රිත සෙවිලි තහඩු නිෂ්පාදන තාක්ෂණය හඳුන්වා දීම, පැති බැමි සඳහා පෙර සවි- පෙර නිමි කොන්ක්‍රීට් පැනල් භාවිතා කිරීමේ තාක්ෂණය, ‘L’ හැඩැති පෙර සවි- පෙර නිමි කොන්ක්‍රීට් තරප්පු නිෂ්පාදන තාක්ෂණය, වියදම් පිරිමැසුම්දායක පියැසි සැකිලි නිර්මාණය, සිමෙන්ති ස්ථායී සම්පිණ්ඩිත පස් ගල් වලින් ඉදි කරන ලද බිත්ති සඳහා තීන්ත අලේපනයන් හඳුන්වාදීම යනාදී තාක්ෂණයන් 2016 වසර තුල ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා හඳුන්වා දෙනු ලැබූ තාක්ෂණයන් වන අතර මේ තුලින් ඉදිකිරීම් සඳහා ගතවන කාලය, පිරිවැය අවමකර ගැනීම සහ සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිත කිරීමට හැකිවී ඇත.

වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ සියළුම තාක්ෂණික ශිල්පීය ප්‍රමිතීන් සහ පිරිවිතර ඇතුලත් තාක්ෂණික අත්පොතක් සකස්කර එළිදැක්වීමට හැකිවීම 2016 වසර තුලදී අප විසින් සිදුකරනු ලැබූ සුවිශේෂී වැයමකි. මෙම අත්පොත පිරිවැය ඵලදායි ඉදිකිරීම් තාක්ෂණය භාවිතා කරන්නන් සහ භාවිතා කිරීමට බලාපොරොත්තුවෙන පාර්ශවයන් මෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැලෙන සියලු පාර්ශවයන් සඳහා මහඟු පිටුවහලක් වනු නොඅනුමානය.

මිරිදිය වාරි ඇල මර්ගයන්හි මෙන්ම මිරිදිය මත්ස්‍ය අභිජනන ජලාශවල පිරී පවතින වල් පැලෑටි ඉවත් කිරීම සඳහා යන්ත්‍ර නිර්මාණය කිරීම, පොල් නිෂ්පාදන කර්මාන්තය සඳහා යන්ත්‍රෝපකරණ හඳුන්වාදීම, ගුණාත්මකව දුම් මාලු සැකසීමේ උඳුන් ඒකකයක් නිෂ්පාදනය, කිරි දෙවීමේ යන්ත්‍ර වැඩිදියුණු කිරීම, අර්ධ ස්වංක්‍රීය ආප්ප සෑදීමේ යන්ත්‍රය වැඩිදියුණු කිරීම යනාදිය 2016 වර්ෂය තුල සිදුකරන ලද කැපී පෙනෙන පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් වේ. තවද, රෝගීන්ගේ තුවාලවලට ප්‍රතිකාර කිරීමේදී උපයෝගී වන අධි පීඩන ඔක්ෂිජන් කුටීරයක් නිර්මාණය කිරීම, ගොඩනැගිලිවල ස්ලිප් ෆෝර්ම් බිත්ති ඉදිකිරීම යාන්ත්‍රිකකරණය සඳහා යන්ත්‍ර පද්ධතියක් හඳුන්වාදීම, ගොඩනැගිලි කළමනාකරණ පද්ධති සඳහා වූ දත්ත එක්රැස් කිරීමේ මොඩියුලය හඳුන්වාදීම සහ රථ ගාල්වල වාහන ගාල් කළ හැකි අවකාශය ප්‍රධාන දොරටුවේදීම හඳුනාගැනීම සඳහා වන අවශ්‍ය තාක්ෂණය හඳුන්වාදීම යනාදී පර්යේෂණ ව්‍යාපෘතිද 2016 වසර තුල සිදුකරනු ලැබූ පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් අතර වේ.

ෆෙරෝ සිමෙන්ති සහ පෙරසවි කොන්ක්‍රීට් තාක්ෂණයෙන් යුත් අධි පාලම් ඉදිකිරීම, අඩු වපසරියකින් යුත් අප ජල පද්ධති හඳුන්වාදීම යනාදී නියමු ව්‍යාපෘතිද 2016 වර්ෂය තුල සාර්ථකව නිම කරන ලදි. ආයුර්වේද ක්ෂේත්‍රය සඳහා අවශ්‍යය යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය කිරීම, අත් යන්ත්‍ර පේෂ කර්මාන්තයේ රෙදිපිළිවල තත්වය පරීක්ෂා කිරීම සඳහා යන්ත්‍රයක් නිර්මාණය කිරීම යනාදිය 2016 වර්ෂය තුලදී සිදුකරන ලද නර්ඩ් තාක්ෂණය පදනම් කරගත් වාණිජ්‍ය ව්‍යාපෘති අතර ප්‍රධාන වේ.

නර්ඩ් මධ්‍යස්ථානය විසින් කර්මාන්ත සඳහා තාක්ෂණික සේවාවන් සැපයීමේදී යම් යම් ක්ෂේත්‍රයන් සඳහා සුවිශේෂී නිපුණතාවයන් අත්පත් කරගනිමින් තාක්ෂණික සේවාවන් සැපයීම සිදු කරනු ලබයි. ඒ අනුව, බලශක්ති හා පාරිසරික කළමනාකරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ තාක්ෂණික සේවාවන් සඳහා වූ ඉල්ලුම නිරන්තරයෙන් වැඩිවෙමින් පවතින අතර මේ වනවිට එම සේවාවන් සපයන කර්මාන්ත හා වාණිජ්‍ය ආයතන ප්‍රමාණය 1000 කට අධික වේ.

නර්ඩ් මධ්‍යස්ථානය විසින් සිදුකරන අප ජලය පරීක්ෂා කිරීම සහ ශබ්ද මට්ටම් මැනීම යන පාරිසරික කළමනාකරණ සේවාවන් සඳහා වන රසායනාගාර සඳහා “ISO 17025 තත්ව සහතිකය සහ ප්‍රනීතනය” ලබාගැනීමට 2016 වසරේදී සමත් වීම තුලින් කර්මාන්ත හා සේවා ලාභීන්ට වඩාත් ප්‍රශස්ථ සේවාවක් අඛණ්ඩව සැපයීමට මධ්‍යස්ථානයට හැකියාව ලැබී ඇත.

ඉහත කී පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වලට අමතරව කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින ඉල්ලුමට සිරිලන පරිදි සිවිල් ඉංජිනේරු, විදුලි/ විද්‍යුත් ඉංජිනේරු, බලශක්ති හා පාරිසරික කළමනාකරණය, කෘෂි ඉංජිනේරු සහ පසු අස්වනු තාක්ෂණය යනාදී ඉංජිනේරුමය ක්ෂේත්‍රයන්හි උපදේශණ සේවාවන් සැපයීමෙහිලා නර්ඩ් ආයතනය 2016 වසර තුලදී නිරත විය. සුළු හා මධ්‍ය පරිමාණ මෙන්ම මහා පරිමාණ කර්මාන්තයන් සඳහා නිවැරදි යාන්ත්‍රික ක්‍රම, ඉංජිනේරු සැළසුම්කරණය හා නිමැවුම්කරණය, කර්මාන්ත ක්‍රියාවලි අධීක්ෂණය, පරීක්ෂණාගාර සේවාවන්, පාරිසරික කළමනාකරණය සහ ඉදිකිරීම් යනාදී ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වූ විවිධාකාරවූ තාක්ෂණික සේවාවන් ලබාදීම නිරන්තරයෙන් සිදුකරනු ලබයි. තවද, දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි සිටින කාර්මාන්තයන්හි නියුතු පුද්ගල කණ්ඩායම් සඳහා පාරිසරික හා බලශක්ති කළමනාකරණය, නර්ඩ් ආයතනයේ සංවර්ධිත තාක්ෂණය, යාන්ත්‍රික උපකරණ නිෂ්පාදන හා පාලන ක්‍රමවේද, කාර්මික යෙදවුම් ස්වයක්‍රීයකරණය, ව්‍යවසායකත්ව හැකියාවන් වර්ධනය කිරීම මෙන්ම කාර්මික සෞඛ්‍ය හා ආරක්ෂණය යනාදී විෂය පථයයන් යටතේවූ විශේෂ පුහුණු වැඩසටහන් පැවැත්වීම ද 2016 වසර පුරාම සාර්ථකව සිදුකර තිබුණි.

තාක්ෂණික පැවරුම් ක්‍රියාවලිය, නර්ඩ් මධ්‍යස්ථානයේ තවත් ප්‍රධානතම කාර්යයක් වන අතර 2016 වර්ෂයේදී තාක්ෂණික පැවරුම් 17 ක් සහ නර්ඩ් තාක්ෂණයන් සඳහා නිකුත් කරන වාර්ෂික බලපත්‍ර අළුත් කිරීම් 59 ක් සාර්ථකව සිදුකර ඇත. නර්ඩ් ආයතනය විසින් හඳුන්වාදෙනු ලැබූ තාක්ෂණයන් පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන්ද 2016 වර්ෂය තුල පවත්වා ඇත. 2016 නොවැම්බර් මස 19 දින පවත්වනු ලැබූ නර්ඩ් විවෘත දින ඉංජිනේරු සහ තාක්ෂණික ප්‍රදර්ශනයද ඒ සඳහා වූ එක් ප්‍රයත්නයක් වේ. 2016 ජාතික විද්‍යා සතියට සමගාමීව නර්ඩ් පර්යේෂණ සමුළුවද පවත්වන ලදි. නර්ඩ් තාක්ෂණයන් ප්‍රචලිත කිරීම සඳහා මාධ්‍ය වැඩසටහන් 2016 වර්ෂය පුරා ආයතනය විසින් සංවිධානය කරනු ලැබ ඇත.

රාජ්‍ය අංශයේ පර්යේෂණ සහ සංවර්ධන ආයතනයන්හි පර්යේෂණ ඉංජිනේරුවන් සඳහා ක්‍රියාත්මක වන අඩු වැටුප් හා දීමනා පරිපාටීන් තුල දක්ෂ පර්යේෂණ ඉංජිනේරුවන් ආයතනයට බඳවාගැනීමේ හා රඳවාගැනීමේ ගැටළුව හමුවේ ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා සෘජු බලපෑම් ඇති කළ හැකි ඉංජිනේරුමය තාක්ෂණයන් සංවර්ධනය කිරීම, අත්පත් කර ගැනීම, අනුගතවීම හා පැවරීම උදෙසා වූ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්හි නියැලීම සඳහා වූ ආයතනයේ මෙහෙවර ඉටු කිරීම කිසිවිටෙකත් පහසු කාර්යයක් නොවන බැව් සඳහන් කරමි. කෙසේ වෙතත් මෙම අභියෝගයට මුහුණදීමේ ක්‍රමෝපායක් ලෙස මධ්‍යස්ථානය විසින් කාර්ය මණ්ඩලය අභිප්‍රේරණ ක්‍රමවේද ලෙස ධාරිතාවය නංවාලීමේ සහ කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා දේශීය හා විදේශීය වශයෙන් අවස්ථාවන් සැළසීම නිරන්තරයෙන් සිදු කරමින් පවතී. දැනුම් ආර්ථිකයක් සඳහා මූලික පදනම වන මෙවැනි ආයතන වල පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් වඩාත් ඉහළ නංවාලීම උදෙසා රාජ්‍ය ආයතනයන්හි පර්යේෂකයන් සඳහා විශේෂයෙන්ම ඉංජිනේරු පර්යේෂකයන් සඳහා තරඟකාරී ආකර්ෂණීය වැටුප් හා දීමනා පරිපාටියක් ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයින්ට කාලය එළඹ ඇති බව කිව යුතුමය.

ඉහත සඳහන් මධ්‍යස්ථානයේ සියලු කර්තව්‍යයන් සාර්ථකව මෙහෙයවමින් රටේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනයක් වශයෙන් මෙම මධ්‍යස්ථානය පත්කිරීම උදෙසා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්, ඉංජි. ඩී ඩී. ආනන්ද නාමල් මහතා විසින් ලබාදෙන නායකත්වය බෙහෙවින් ප්‍රශංසනීය වේ. ඔහු සමග එක්ව ආයතනයේ උන්නතිය උදෙසා ආයතනයේ කාර්යයන් සාර්ථකව මෙහෙයවීමට ලැබීම සැබවින්ම සතුටට කරුණකි. එමෙන්ම 2016 වසරේදී මධ්‍යස්ථානයේ අරමුණු ලඟාකරගැනීම සඳහා දායකත්වය ලබාදුන් අධ්‍යක්ෂ මණ්ඩලය, ඉහළ කළමනාකාරීත්වය ඇතුළු අධ්‍යක්ෂවරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, පර්යේෂණ කාර්යමණ්ඩලය සහ අනෙකුත් කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පුද කිරීම සඳහා මෙය අවස්ථාවක් කරගනිමි.

ඉංජි. ඩබ්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු
සභාපති

04. ජොෂ්ඨ කළමනාකරණ සහ විධායක කාර්ය මණ්ඩලය

සභාපති

01. ඉංජි ඉංජි. ඩබ්.ජේ.එල්. ශවින්ද්‍රනාත් ප්‍රනාන්දු මයා (2016.05.03 සිට)
B Sc(Hon)Eng., M Eng, FIESL, MIET, C Eng.

02. ආචාර්ය.ටී.ඒ.ජී. ගුණසේකර මයා (2016.05.03 දක්වා)
M Eng(SL), M Sc(Hon) (Ire), PhD(Ire), MIE(SL), FIIE(SL), C Eng. I Eng.

අධ්‍යක්ෂ ජනරාල්

ඉංජි. ඩී.ඩී.ඒ. නාමල් මයා
M Eng (Energy Technology), Bsc Eng (Hons), C Eng, MIE(SL)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)

ඉංජි. ජී.කේ.කේ.ඒ ද සිල්වා මයා
Msc (Building Technology), Bsc Eng (Hons), C Eng, MIE (SL)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සේවා)

ඒ. එච්. පියසිරි මයා
Msc (Management of Technology), Bsc Eng (Hons)

ඉංජිනේරු සහ අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තු වශයෙන්

කෘෂි ඉංජිනේරු සහ පසු අස්වනු තාක්ෂණික දෙපාර්තමේන්තුව	සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ (තාක්ෂණික) ඉංජි. කේ.වයි.එච්.ඩී. ශාන්ත මයා MSc Eng., BSc Eng, AMIE(SL)	අධ්‍යක්ෂ (තාක්ෂණික) ඉංජි ජේ. ඒ. සී. ක්‍රිෂාන්ති මිය BSc Eng, C Eng, MIE(SL)
ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු වයි.එම්.එම්.කේ. රණතුංග මිය NDT ඉංජි. ඒ.ජේ.ජී.එස්. දහනායක මයා - 2016.04.01 සිට BSc Eng, C Eng, MIE(SL) ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ ආචාර්ය කේ.එම්.ඩබ්. රජවත්ත මිය PhD, MSc, BSc. ජොෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු ඉංජි. පී.එම්.වයි.එස්. පතිරාජ මිය BSc Eng, MSc, AMIE (SL) පර්යේෂණ ඉංජිනේරු ඉංජි. එස්.ඒ.පී. ශලින්ද සිල්වා මයා BSc Eng, AMIE (SL) කේ.ඩී.එස්. පේමකුමාර මයා - 2016.03.23 දක්වා BSc Eng ඉංජි. පී.එෆ්. සුරේන් මයා - 2016.12.01 සිට BSc Eng, AMIE(SL) ඉංජිනේරු පී.ඒ.යූ.ඩබ්.කේ. පරණගම්පොල මයා NDES	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු ඉංජි. ඩබ්. ඩබ්. පී. කේ. පෙරේරා මයා M ENG (STRUCT), BSC ENG (HONS), C ENG , MIE (SL) ඩබ්. පී. ආර්. ඩී. වීරසිංහ මයා NDT, CEI PART I, IESL PART I ඉංජිනේරු ඩී.එම්.ඒ.කේ. දිගල මිය NDES (Civil Eng), CEI (UK) Part I කේ.එස්.එස්. වීරසිංහ මිය Special Apprentice (Civil Eng.), IESL (Part I) පර්යේෂණ ඉංජිනේරු ඉංජි. අයි.පී. බටුවිට මයා B Sc Eng, AMIE(SL) ඉංජි. ඒ.එන්.එස්. අමරදාස මයා B Sc Eng, AMIE(SL) ගෘහ නිර්මාණ ශිල්පී බී.ඩී.අර්. චාමිකා මිය MSc, B Sc

පුනර්ජනක බලශක්ති දෙපාර්තමේන්තුව

පර්යේෂණ විද්‍යාර්ථී (දෙපාර්තමේන්තු ප්‍රධානී)

ඉංජි. ජේ.ඒ.ඒ.ඩී. ජයසූරිය මයා
M Eng, BSc Eng, MIE(SL)

පර්යේෂණ විද්‍යාර්ථී

ඉංජි. ඩබ්.කේ.ආර්. පීරිස් මයා
MA (Buddhist Stud), BSc Eng, C.Eng. MIE(SL)

ඉංජි. එන්.කේ. එදිරිසිංහ මයා
MPhil, BSc Eng, MIE(SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු

ආචාර්ය ඒ.එස්.කේ. වරාහේන මයා
PhD, M Eng, B Sc Eng

පර්යේෂණ ඉංජිනේරු

ඊ.බී.යූ.සී. කුමාර මයා
BSc Eng (Hons)

ඊ. නදීශානි මෙනවිය - 2016.10.07 දක්වා
BSc Eng (Hons)

ඉංජි. ජී.එස්.ආර්. කොස්තා මිය
BSc Eng, AMIE(SL)

ඉංජි. එන්.එම්.ජේ.එස්. නිස්සන්ක මයා
BSc Eng, AMIE(SL)

ඉංජිනේරු

ඩබ්.ඒ.එල්.එස්. කරුණාවර්ධන මයා
HNDE

විදුලි හා විද්‍යුත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

පර්යේෂණ විද්‍යාර්ථී (දෙපාර්තමේන්තු ප්‍රධානී)

ඉංජි. එන්.ජී.ඩී. විජේසිරිවර්ධන මිය
M Eng, C Eng, MIE (SL)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. යූ.සී. බොතේජු මයා - 2016.04.04 සිට
MSc., BSc Eng. AMIE(SL)

පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. ඩී.ආර්.එස්.කේ. විමලරත්න මිය
BTech Hons, AMIE(SL)

වයි.එම්.ඒ.ජී.එස්.පී.කේ. කුලරත්න මෙනවිය
BSc Eng

ඉංජි. වයි.එස්.පී. වීරසිංහ මයා - 2016.02.01 සිට
BSc Eng. AMIE(SL)

ඉංජි. එච්.සී. ගනේගේ මිය - 2016.12.01 සිට
BSc Eng. AMIE(SL)

ඉංජිනේරු

එච්.ඩී.සී. හෙට්ටිආරච්චි මිය
NDT

සැළසුම් නිර්මාණ හා උපදේශකත්ව දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ (තාක්ෂණික)

ඉංජි. ඒ.ඒ.එස්.පී. ජයසිංහ මයා
BSc Eng (Hons), MBA, MIE(SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. එච්.එම්.එල්.යූ හේරත් මයා
BSc Eng, AMIE(SL)

ඉංජි. ඒ.අර්.සී. සල්ගාදු මයා
BSc Eng, AMIE(SL)

පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. එස්.පී. පෙරේරා මයා
EC (UK) Part I & II, NDT, AMIE(SL)

ඉංජිනේරු

එන්.ඒ.ඩී.ඩී.ජේ. ප්‍රසන්න මයා
NDT

පාලක - වැඩහල්

ඩබ්.එච්.එස්. රමල් සිල්වා මයා
NDES

බලශක්ති හා පාරිසරික කළමනාකරණ දෙපාර්තමේන්තුව

පර්යේෂණ විද්‍යාර්ථී /දෙපාර්තමේන්තු ප්‍රධානී

ඉංජි. කේ.ටී. ජයසිංහ මයා
M Eng, BSc Eng, C Eng, MIE(SL)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. එන්.පී.ටී. පෙරේරා මෙනවිය
MSc, BSc Eng (Hons.), AMIE(SL)

ඉංජි. ඒ.ජී.එම්.ටී. සිරිවර්ධන මෙනවිය
MSc, MEng, BSc Eng., AMIE(SL)

ආචාර්ය එස්.එම්. යං මෙනවිය
PhD, M Phil, MSc, BSc.

පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. එම්.ඩී. සහර්දීන් මයා
BSc Eng, AMIE(SL)

ඉංජි. කේ.පී.ඩී.ඩී. ජයසේකර මයා
BSc Eng (Hons), AMIE(SL)

ටී.කේ. ගීගනගේ මයා
BSc Eng. AMIE(SL)

තාක්ෂණික අලෙවි දෙපාර්තමේන්තුව	මෙකට්‍රොනික්ස් අංශය
අධ්‍යක්ෂ (තාක්ෂණික) ඉංජි.එම්.ඒ.එම්. ප්‍රනාන්දු මයා PG Dip (Energy) IESL Part I & II, CEng, MIE (SL)	**ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු (අංශ භාර ඉංජිනේරු)** ඉංජි. ඩී.එම්. පුංචිබණ්ඩා මයා BSc Eng, AMIE(SL)
ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු ඩී.වී. විමලසේන මයා NDT, Dip in Marketing (SL) **අලෙවි නිලධාරී** එස්. විජේසූරිය මයා MBS, BSc (Agriculture) Sp. **පර්යේෂණ විද්‍යාඥ** බී.ඩී.පී.එස්. රණවීර මිය - 2016.03.01 සිට MSc, BSc **පාලක - තාක්ෂණ උද්‍යානය** ඒ.ඒ.එන්.එස්. අධිකාරී මයා BSc	**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු** ඉංජි. එච්.පී.එච්. කුමාර මයා MSc Eng, EC(UK) PART I & II, AMIE(SL) **පර්යේෂණ ඉංජිනේරු** ඉංජි. එම්.ඒ.එන්. සුගන්දි මෙනවිය - 2016.05.02 දක්වා B Tech, AMIE (SL) එල්.එන්.ඒ. පෙරේරා මෙනවිය - 2016.07.31 දක්වා BSc Eng. (Hons) ඉංජි. එස්.එම්.එස්.එස්. සේනාරත්න මයා B Tech, AMIS(SL) ඉංජි. ජී.එම්.සී.එම්. රාජකරුණා මයා - 2016.12.01 සිට BSc Eng, AMIE(SL) ඉංජි. ඩබ්.එම්.එස්.පී.කේ. වනසිංහ මයා - 2016.12.05 සිට BSc Eng, AMIE(SL)
මානව සම්පත් දෙපාර්තමේන්තුව	**මූල්‍ය දෙපාර්තමේන්තුව**
අධ්‍යක්ෂ (මානව සම්පත්) ඩී.ඒ.එම්. මුණසිංහ මෙනවිය BSc (HRM), MBA (HRM), AM(IPM)	**අධ්‍යක්ෂ (මූල්‍ය)** ඩී.වී.එස්. පෙරේරා මිය ICMA Professional Part II, IPFA, ICEA
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ආර්. ගමගේ මයා B A (Social Sc.) Sp., MA in Sociology	**ගණකාධිකාරී** ජේ.එම්.ආර්.එස්. ජයසිංහ මයා BBA (Busi. Admin) Sp. , MBA, ICASL - Professional Part I
තොරතුරු තාක්ෂණ අංශය	**පුස්තකාලය**
ජාල පරිපාලක පී.පී. වික්‍රමසූරිය මයා BSc (Computing & Infor. Systems)	**පුස්තකාලයාධිපති** ඩී.එම්.ටී.පී.කේ. දේවගිරි මිය B A (Library Science) Sp., MSSc, ASLLA
අභ්‍යන්තර විගණන අංශය	**සැපයුම් අංශය**
අභ්‍යන්තර විගණක බී.පී. සුසන්ත කුමාර මයා HNDA	**සැපයුම් නිලධාරී** ආර්.එච්.ඒ. ජීවානන්ද මයා BSc (Physical Science)

05. මානව සම්පත කළමනාකරණය

සුවිශේෂී කාර්ය සාධනයක් තුලින් අරමුණු හා පරමාර්ථයන් සපුරාගැනීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්හි නියුතු ආයතනයන්හි ප්‍රධානතම වත්කම මානව සම්පත වේ. අනෙකුත් සම්පත් තුලින් යමක් සිදුවිය හැකි නමුත් යමක් ක්‍රියාවට නැංවීම සිදුකළ හැක්කේ නිසැකයෙන්ම මානව සම්පත තුලිනි. නිසි මගපෙන්වීම, මානව සම්පත ඵලදායීව උපයෝජනය කිරීම හා වැඩිදියුණු කිරීම තුලින් කාර්යක්ෂම සහ ඵලදායී සේවයක් ලබාගැනීම උදෙසා නර්ඩ් ආයතනයේ කළමනාකාරීත්වය නිරන්තරව උත්සාහ දරනු ලැබේ.

සුදුසුකම් සපිරි ඉංජිනේරු පර්යේෂකයින් සහ විද්‍යාඥයින් බඳවාගැනීම සහ රඳවාගැනීම ආයතනයේ මානව සම්පත් කළමනාකරණයේ හඳුනාගත් ප්‍රධානතම ගැටළුව වන අතර මෙය ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතන බොහෝමයක් මුහුණුදෙන පොදු ගැටළුවක් බවට පත්ව ඇත. විද්‍යාත්මක, පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් සම්බන්ධව ජාතික ප්‍රතිපත්තියක් ඇතිකිරීම, විද්‍යාත්මක හා ඉංජිනේරු පර්යේෂණ භාවිතයන් ජාතික සංවර්ධනය සඳහා අදාළ කරගැනීම, විද්‍යාඥයින්/ පර්යේෂකයින් රාජ්‍ය අංශය සඳහා බඳවාගැනීමේදී ඔවුන්ගේ වැටුප් හා ප්‍රතිලාභ වෘත්තීය රැකියා වෙළඳපොල අනුපාත අනුව කළමනාකරණය, අඛණ්ඩ පුහුණුව හා සංවර්ධනය යනාදිය සම්බන්ධයෙන් පුළුල් ඒකාබද්ධ උපාය මාර්ග ක්‍රියාත්මක කළ යුතුව ඇත.

වර්තමානයේ පවතින වැටුප් සහ දීමනා පරිපාටීන් යටතේ නිපුණතා සපිරි ඉංජිනේරු පර්යේෂකයින් බඳවාගැනීමේ සහ රඳවාගැනීමේ ගැටළුව මධ්‍යයේ වුවද උසස් අධ්‍යාපන අවස්ථාවන්, පුහුණු හා සංවර්ධන අවස්ථාවන් ලබාදීම, ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ/ වැඩමුළු සඳහා යොමුකිරීම යනාදී වූ ධාරිතා සංවර්ධන අවස්ථාවන් වලට යොමුකිරීම මෙන්ම වඩා යහපත් වැඩ පරිසරයක් ඇතිකරලීම සහ රැකියා සංවර්ධන අවස්ථාවන් සඳහා පහසුකම් සළසාදීම යනාදීවූ ක්‍රමෝපායන් අනුගමනය කරමින් නිපුණතා සපිරි පර්යේෂකයින්, විද්‍යාඥයින් බඳවාගැනීම සහ ඔවුන් මධ්‍යස්ථානයේ සේවයේ රඳවාගැනීම සඳහා වූ හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම කළමානාකාරීත්වය විසින් අනුගමනය කරමින් පවතී.

මධ්‍යස්ථානයේ 2016 වර්ෂයේ සමස්ථ කාර්යමණ්ඩල තොරතුරු සාරාංශය පහත පරිදි වේ.

සේවා ඛාන්ඩය	සංඛ්‍යාව
ඉහළ කළමනාකරණ මණ්ඩලය	3
ඉංජිනේරු කාර්ය මණ්ඩලය	50
විධායක කාර්ය මණ්ඩලය	10
කණිෂ්ඨ කළමණාකාර කාර්ය මණ්ඩලය	10
කළමනාකරණ සහකාර (තාක්ෂණික)	21
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	51
ප්‍රථමික මට්ටමේ කාර්ය මණ්ඩලය	145
එකතුව	**290**



5.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

5.1.1 2016 වසර තුල නව බඳවාගැනීම්

	නම	තනතුර	බඳවාගත් දිනය
1	වයි.එස්.පී. වීරසිංහ මයා	පර්යේෂණ ඉංජිනේරු	01/02/2016
2	එස්.ඩබ්.ඒ.ටී. සමරවික්‍රම මයා	කාර්මික සහකාර	01/02/2016
3	ඒ.ජී.එම්.ටී සිරිවර්ධන මෙනවිය	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	01/03/2016
4	ආර්.එම්.ආර්.එස්. විජයබණ්ඩාර මයා	විදුලි කාර්මික	01/03/2016
5	ජේ.පී.ජේ. ජයවික්‍රම මයා	අච්චු සාදන්නා	01/03/2016
6	එම්.ඩී.එච්. ප්‍රන්න්දු මයා	විදුලි කාර්මික	08/03/2016
7	එම්.එස්.වයි.වී.කේ. පෙරේරා මයා	කම්කරු	10/03/2016
8	ඒ.ජේ.ජී.එස්. දහනායක මයා	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	01/04/2016
9	ආචාර්ය. කේ.එම්.ඩබ්. රජවත්ත මිය	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ	01/04/2016
10	යූ.ජී. බොතෝජු මයා	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	04/04/2016
11	බී.කේ.ඒ. ධර්මරත්න මෙනවිය	කළමනාකරණ සහකාර	05/04/2016
12	ආර්.එස්. ප්‍රියදර්ශනී මෙනවිය	කළමනාකරණ සහකාර	05/04/2016
13	කේ.ඒ.සී. මධුසංක මයා	යන්ත්‍ර ශිල්පී	05/04/2016
14	එම්.එන්. මධුෂානි මෙනවිය	කළමනාකරණ සහකාර - ප්‍රදර්ශක	05/04/2016
15	තිලිණි විජේකෝන් මෙනවිය	කළමනාකරණ සහකාර - පරීක්ෂණ	05/04/2016
16	එම්.ඩී.ඕ.ජී. සේනානායක මයා	කළමනාකරණ සහකාර - පරීක්ෂණ	05/04/2016
17	පී.එච්.එස්.එල්. ධනපාල මෙනවිය	සැළසුම් ශිල්පී	05/04/2016
18	ජී.එල්. දේවසුරේන්ද්‍ර මයා	සැළසුම් ශිල්පී	05/04/2016
19	ඒ.ආර්. කස්තුරිරත්න මයා	විදුලි කාර්මික	05/04/2016
20	එච්.පී.එල්. සුදේශ් මයා	රියදුරු	05/04/2016
21	ආචාර්ය එස්.එම්. යං මෙනවිය	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ	25/04/2016
22	කේ.එස්.කේ.බී.එම්.ආර්.ඒ. ලෙනාවල මයා	පාලක - නඩත්තු	16/05/2016
23	ඩබ්. නවීන්ද්‍ර ප්‍රසාද් මයා	කම්කරු	16/05/2016
24	ජී.ඒ.ජී.පී. එස්.කේ. ගොඩපොල මයා	රියදුරු	25/05/2016
25	එන්.එම්.අයි.ඩී. නවරත්න මයා	කාර්මික සහකාර	01/06/2016
26	දිනුෂාන් නයනජිත් මයා	කාර්යාල සහායක	06/06/2016
27	සමීර සංජය මයා	රිය සහායක	06/06/2016
28	සමීර සෙනෙවිරත්න මයා	ආයුධ භාරකරු	06/06/2016
29	සංජය නිරෝෂන් මයා	ආයුධ භාරකරු	06/06/2016
30	ජී.එම්. සංගීත් මයා	පුස්තකාල සහායක	06/06/2016
31	බී.අයි.ජී.අයි. මධුෂානි මෙනවිය	කළමනාකරණ සහකාර - පරීක්ෂණ	06/06/2016
32	කේ.ටී. පියුමලි මෙනවිය	කාර්මික සහකාර	01/07/2016
33	බී.ඩී.ටී.කේ. ප්‍රියංකර මයා	යන්ත්‍ර ශිල්පී	01/07/2016
34	ට්.ඒ. ප්‍රසාද් චතුරංග මයා	යන්ත්‍ර ශිල්පී	01/07/2016
35	ඒ. මංජුලා දමයන්ති මිය	කාර්යාල සහායක	01/07/2016
36	එම්.ඩී.පී.එස්.කේ. ජයතිලක මයා	සැළසුම් ශිල්පී	04/07/2016
37	එච්.එම්.එස්. ශාන්ත හේරත් මයා	කාර්මික සහකාර	14/07/2016
38	ඩී.එම්.ටී. වර්ජිනියා මිය	කළමනාකරණ සහකාර	15/07/2016
39	පී.සී.එන්.පී. පෙරේරා මයා	කළමනාකරණ සහකාර	16/10/2016
40	එච්.සී. ගනේගේ මෙනවිය	පර්යේෂණ ඉංජිනේරු	01/12/2016
41	ජී.එම්.සී.එම්. රාජකරුණා මයා	පර්යේෂණ ඉංජිනේරු	01/12/2016
42	පී.එෆ්. සුරේන් පෙරේරා මයා	පර්යේෂණ ඉංජිනේරු	01/12/2016
43	එච්.ඩී.එච්. හිරන්ත මයා	වැද්දුම්කරු	01/12/2016
44	ජී.එස්. සමන්නාත් මයා	පෙදරේරු	01/12/2016
45	ඩබ්.එම්.එස්.පී.කේ. වනසිංහ මයා	පර්යේෂණ ඉංජිනේරු	05/12/2016
46	එන්.එම්.ජේ.එස්. නිස්සංක මයා	පර්යේෂණ ඉංජිනේරු	14/12/2016
47	ට්.ජී. දිලාන් සුමින්ද මයා	යන්ත්‍ර ශිල්පී	14/12/2016

5.1.2 2016 වසර තුල සේවයෙන් විශ්‍රාම ගැනීම්

	නම	තනතුර	විශ්‍රාමික දිනය
1	එම්.එන්.ආර්. ධර්මසේකර මයා	විද්‍යුත් කාර්මික	10/02/2016
2	එච්. සුනිල් පෙරේරා මයා	රියදුරු	16/05/2016
3	ජෙ.බී. ෂෙල්ටන් ඩයස් මයා	වැද්දුම්/ පැස්සුම්කරු	30/05/2016
4	එස්.එච්.ඒ. සෝමවීර මයා	කම්කරු	06/06/2016
5	ඩබ්.ඒ. වීරසිංහ මයා	වැදුම්කරු	01/07/2016
6	ආර්.කේ. වෛද්‍යාසේකර මෙනවිය	පරිපාලන නිලධාරී	27/07/2016
7	ඒ.ඒ. අමරසූරිය මයා	කළමනාකරණ සහකාර	15/09/2016
8	කේ.ඒ. ගුණරත්න මයා	සහකාර සැපයුම් නිලධාරී	02/11/2016

5.1.3 2016 වසර තුල සේවයෙන් ඉල්ලා අස්වීම්

	නම	තනතුර	ඉල්ලා අස්වූ දිනය
1	එන්.පී.ඒ. ගමගේ මෙනවිය	කාර්මික සහකාර	01/03/2016
2	කේ.ඩී.එස්. ප්‍රේමකුමාර මයා	පර්යේෂණ ඉංජිනේරු	23/03/2016
3	කේ.ආර්.ඒ.එස්.එස්. කස්තුරිරත්න මයා	විදුලි කාර්මික	11/04/2016
4	එම්.ඒ.එන්. සුගන්ධි මෙනවිය	පර්යේෂණ ඉංජිනේරු	02/05/2016
5	ජී.එල්. දේවසුරේන්ද්‍ර මයා	සැළසුම් ශිල්පී	16/05/2016
6	පී. බැසිල් සිල්වා මයා	වඩු කාර්මික	18/07/2016
7	එස්.ඩබ්.ඒ.කේ.ටී. සමරවික්‍රම මයා	කාර්මික සහකාර	28/07/2016
8	ඒ.එල්.එන්.ඒ. පෙරේරා මෙනවිය	පර්යේෂණ ඉංජිනේරු	31/07/2016
9	අයි.එස්. දික්කුඹුර මිය	කාර්මික සහකාර	07/09/2016
10	එච්.ඩී. මදුවන්ති මෙනවිය	කාර්මික සහකාර	19/09/2016
11	ඊ. නදීශානි මෙනවිය	පර්යේෂණ ඉංජිනේරු	07/10/2016
12	ඒ.ඒ. ලක්මාලි මිය	කළමනාකරණ සහකාර	08/10/2016
13	එච්.ඩබ්. ජගත් නිලමලරත්න මායා	කම්කරු	07/11/2016
14	ඒ.එන්.එම්.සී.එන්. අබේසිරි මයා	පර්යේෂණ ඉංජිනේරු	14/11/2016

5.1.4 2016 වසර තුල අභ්‍යන්තර බඳවාගැනීම්

	නම	පැවති තනතුර සහ සේවා බාන්ඩය	නව තනතුර සහ සේවා බාන්ඩය	දිනය
1	ඉංජි.එන්.පී.ටී. පෙරේරා මෙනවිය	පර්යේෂණ ඉංජිනේරු (AR 1)	පර්යේෂණ ඉංජිනේරු (AR 2)	01/03/2016
2	ඉංජි. පී.එම්. වයි.එස්. පතිරාජ මිය	පර්යේෂණ ඉංජිනේරු (AR 1)	පර්යේෂණ ඉංජිනේරු (AR 2)	01/12/2016
3	බී.ඩී.පී.එස්. රනවීර මිය	පාලක -කෞතුකාගාරය (JM 1-2)	පර්යේෂණ විද්‍යාඥ (AR 1)	01/03/2016

5.2 මානව සම්පත් සංවර්ධනය

ආයතනය විසින් සැම විටම මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රමුඛ අවධානය යොමු කරමින් ඒ සඳහා වූ පහසුකම් අඛණ්ඩව සැපයීමට නිරන්තර උත්සාහ ගනු ලැබේ. දැනුම, කුසලතා හා නිවැරදි ආකල්ප වර්ධනය කිරීම තුලින් නිපුණතා සපිරි ඵලදායී කාර්ය මණ්ඩලයක් නිරතුරුව මධ්‍යස්ථානය තුළ පවත්වාගැනීමට සැම විටම ක්‍රියා කරනු ලැබේ. ඒ සඳහා ධාරිතාවය ගොඩනැංවෙන සහ දැනුම, කුසලතා, ආකල්ප, නිපුණතා වර්ධනය කරලීමේ වැඩසටහන් සඳහා අදාළ කාර්යමණ්ඩලය යොමු කරවනුයේ ඔවුන්ගෙන් මධ්‍යස්ථානයට සිදුවන සේවාවන්, රාජකාරී වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස ලබාගැනීමේ අරමුණ මෙන්ම ඔවුන්ගේ පුද්ගල රැකියා සංවර්ධනයද ඉලක්ක කරගනිමිනි.

2016 වර්ෂයේදී නර්ඩ් මධ්‍යස්ථානය කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් පරිදි පුහුණු හා සංවර්ධන අවස්ථාවන් සළසා ඇත.

5.2.1 දේශීය පුහුණු වැඩසටහන්

පුහුණු හා සංවර්ධන අවස්ථාවන් සළසා දීම - සේවා ඛාණ්ඩ වශයෙන්

සේවා ඛාන්ඩය	පුහුණු අවස්ථාවන් සංඛ්‍යාව
ඉහළ කළමනාකරණ	7
ඉංජිනේරු	209
විධායක	82
කණිෂ්ඨ කළමනාකරණ	20
කළමනාකරණ සහකාර (තාක්ෂණික)	35
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	101
ප්‍රාථමික	109
එකතුව	**563**

සේවා ඛාන්ඩ මට්ටමෙන් ප්‍රතිශතයක් ලෙස



5.2.2 කාර්යස්ථානයෙන් බැහැරව සිදුකරනු ලැබූ නේවාසික පුහුණු හා සංවර්ධන වැඩමුළු

ආයතනයට අලුතින් බඳවාගන්නා ලද ඉංජිනේරු, විධායක, කණිෂ්ඨ විධායක සහ කළමනාකරණ සහකාර බාණ්ඩයන්ට අයත් කාර්ය මණ්ඩලයේ 31 දෙනෙකු වෙනුවෙන් 2016 ජූලි 20 සහ 21 යන දිනයන්හිදී නේවාසික පුහුණු වැඩසටහනක් තාක්ෂණ උද්‍යානයේදී පවත්වන ලදි.

5.2.3 උසස් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සපුරාලීම සඳහා පහසුකම්

2016 වසර තුල උසස් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කිරීම				
	නම සහ තනතුර	සුදුසුකම	ආයතනය	සම්පූර්ණ කරන ලද දිනය
01	ඉංජි. පී.එම්.වයි.එස්. පතිරාජ මිය ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	M.Sc/PG Diploma Course in Sustainable Process Eng.	මොරටුව විශ්ව විද්‍යාලය	01/07/2016

2016 වසර තුල හැදෑරීම අරඹන ලද උසස් අධ්‍යාපන අවස්ථාවන්					
	නම සහ තනතුර	සුදුසුකම/ පාඨමාලාව	ආයතනය	අරඹන ලද දිනය	අවසන් වීමට නියමිත දිනය
01	පී.ඒස්.ආර්. කොස්තා මිය පර්යේෂණ ඉංජිනේරු	M.Eng./PG Diploma Pro.in Energy Technology	මොරටුව විශ්ව විද්‍යාලය	06/02/2016	05/02/2018
02	ආර්. ගමගේ මයා සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)	Master in Labouer Relations and Human Resources Management - 2016/17	කොළඹ විශ්ව විද්‍යාලය	01/06/2016	31/05/2018
03	බී.ඩී.පී.එස්. රණවීර මිය පර්යේෂණ විද්‍යාඥ	M.Sc Degree Programme in Industrial and Environmental Chemistry 2016-2018	කැලණිය විශ්ව විද්‍යාලය	18/06/2016	17/06/2018
04	බී.පී. වික්‍රමසූරිය මයා ජාල පරිපාලක	M.Eng./PG Diploma in Information Tech. -2016	මොරටුව විශ්ව විද්‍යාලය	22/10/2016	21/10/2018
05	කේ.පී.ඩී.ඩී. ජයසේකර මයා පර්යේෂණ ඉංජිනේරු	M.Eng./PG Diploma in Environmental Eng. & Mgt.	මොරටුව විශ්ව විද්‍යාලය	21/10/2016	21/10/2018
2016 වසර කරගෙන යනු ලබන උසස් අධ්‍යාපන පාඨමාලාවන්					
01	බී.පී.එස්. කුමාර මයා අභ්‍යන්තර විගණක	MPM Programme	SLIDA	28/02/2015	27/02/2017
02	අයි.පී. බටුවිට මයා පර්යේෂණ ඉංජිනේරු.	PG Diploma/M.Eng in Highway &Traffic Eng.	මොරටුව විශ්ව විද්‍යාලය	24/07/2015	23/07/2017
03	එස්.එම්.එස්. සේනානායක මයා පර්යේෂණ ඉංජිනේරු	M.Sc/PG Diploma Course inIndustrial Automation	මොරටුව විශ්ව විද්‍යාලය	24/10/2015	23/10/2017
04	ටී.කේ. ගීගනගේ මයා පර්යේෂණ ඉංජිනේරු	M.Sc/PG Diploma Course in Sustainable Process Eng.	මොරටුව විශ්ව විද්‍යාලය	05/12/2015	04/12/2017
05	ඒ.ඒ.එන්.එස්. අධිකාරි මයා පාලක- තාක්ෂණ උද්‍යානය	MBA Degree (Master of Business Administration)	කොළඹ විශ්ව විද්‍යාලය	28/11/2015	27/11/2017

2016 වසර තුල වරලත් ඉංජිනේරු සුදුසුකම් සපුරාලීම				
	නම සහ තනතුර	සාමාජිකත්වය	ආයතනය	ලබාගත් දිනය
01	ඉංජි.ඉ.ඒ.එන්.කේ. එදිරිසිංහ මයා පර්යේෂණ විද්‍යාර්ථී	Member	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය	20/5/2016
02	ඉංජි. ටී.කේ. ගීගනගේ මයා පර්යේෂණ ඉංජිනේරු	Associate Member	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය	16/06/2016
03	ඉංජි. ඩබ්.එම්.එස්.පී.කේ. වනසිංහ මයා පර්යේෂණ ඉංජිනේරු	Associate Member	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය	01/07/2016
04	ජේ.ඒ.ඒ.ඩී. ජයසූරිය මයා පර්යේෂණ විද්‍යාර්ථී	Member	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය	07/10/2016
05	ඒ.ඒ.එස්.පී. ජයසිංහ අධ්‍යක්ෂ (තාක්ෂණික)	Member of Charter	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය	07/10/2016

5.3 විදේශ ශිෂ්‍යත්ව/ සම්මන්ත්‍රණ/ පුහුණු වැඩසටහන්/ වැඩමුළු සඳහා සහභාගී වීම

	නම සහ තනතුර	වැඩසටහන	රට	කාලපරිච්ඡේදය
01	ඉංජි. ජී.කේ.ඒ. ද සිල්වා මයා නි. අධ්‍යක්ෂ ජනරාල් (පර්.සහ සංව.)	2016 Seminar on Science and Technology Innovation for Developing Countries	චීනය	2016.05.26- 2016.06.15
02	ඉංජි. ඩී.ඩී. ආනන්ද නාමල් අධ්‍යක්ෂ ජනරාල්	The 2nd forum on China- South Asia Technology Transfer and Collaborative Innovation Twelfth Session of the Governing Council of APCTT and the high-level International Conference on Innovation Strategies for Sustainable Development	චීනය පකිස්ථානය	2016.06.12- 2016.06.14 2016.12.19- 2016.12.21
03	ඉංජි. ටී.කේ. ගීගනගේ මයා පර්යේෂණ ඉංජිනේරු	International Workshop on China-South Asia Technology Manager Training	චීනය	2016.08.04- 2016.08.23
04	ඉංජි. එස්.ඒ.පී.ඒ.එස්. සිල්වා මයා පර්යේෂණ ඉංජිනේරු	International Workshop on China-South Asia Technology Manager Training	චීනය	2016.08-.04- 2016.08.23
05	ඉංජි. ඒ.ඒ.එස්.පී. ජයසිංහ මයා අධ්‍යක්ෂ - තාක්ෂණික	International Training Workshop on Business R & D Building from the perspective of GVC	චීනය	2016.09.04- 2016.09.23
06	ඉංජි. කේ.ටී. ජයසිංහ මයා පර්යේෂණ විද්‍යාර්ථී	Multicounty Observational Study Mission on Advanced Energy Technology	ඉරානය	2016.10.01- 2016.10.05
07	ඉංජි. ඩබ්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු මයා සභාපති	International Convention of Science, Technology and Innovation	කියුබාව	2016.10.31- 2016.11.04
08	ඩබ්.ඒ.එල්.එස්. කරුණාවර්ධන මයා ඉංජිනේරු	Evolving Energy Models in Emerging Economies – Post COP 21	ඉන්දියාව	2016.12.12- 2016.12.14

5.4 කාර්යස්ථ පුහුණු වැඩමුළු සංවිධානය

	වැටසහටන	කාලපරිච්ඡේදය	අදාළ සේවා ඛාණ්ඩයන්	සහභාගී වූ සංඛ්‍යාව
01	Training on ISO 17025:2005	2016/02/06,17,18	Relevant Eng/Sci/TA in RED/EMCM/E&E/Civil	17
02	Thinking Outside the Box	2016/04/29	ඉංජිනේරු, විධායක, කණිෂ්ඨ විධායක, කළමනාකරණ සහකාර	89
03	Workshop on results based management & organizational result frame work	2016/07/13,14	ඉංජිනේරු සහ අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය	57
04	In house Motivational training program – NO I Can't yes I Can	2016/09/19	ප්‍රාථමික ශිල්පීය සහ ශිල්පීය නොවන	100
05	Workshop on professional presence	2016/10/03	ඉංජිනේරු, විධායක, කණිෂ්ඨ විධායක, කළමනාකරණ සහකාර	65
06	In house Motivational training program – NO I Can't yes I Can	2016/11/08	කළමනාකරණ සහකාර සහ ප්‍රාථමික ශිල්පීය සහ ශිල්පීය නොවන	87

5.5 අනෙකුත් සමාජ සත්කාරක සේවාවන් - 2016

ආධුනිකයින් සඳහා කාර්මික පුහුණු අවස්ථාවන් සළසාදීම

විශ්වවිද්‍යාල හා පිළිගත් වෘත්තීය/කාර්මික පුහුණු ආයතනයන් විසින් යොමු කරනු ලැබූ ආධුනිකයින් 32 දෙනෙකු සඳහා මාස 3/ මාස 6/ වසරක වැනි කාල පරච්ඡේදයන්ට අදාළව වෘත්තීය/ කාර්මික පුහුණු අවස්ථාවන් සළසාදීම සිදුකර ඇත.

06. 2016 වර්ෂයේදී කාර්ය සාධනය පිළිඹිමු කිරීම

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, ආයතනයේ අභිමථාර්ථයන්ට හා අරමුණු වලට අනුකූලව විවිධ ඉංජිනේරුමය ක්ෂේත්‍රයන් තුල පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකිරීම් හා ඒවා ප්‍රචලිත කිරීම, පුහුණු කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩ සටහන්, ඉදිකිරීම් කාර්යයන් ආදී විවිධ ක්‍රියාකාරකම් හී නියැලෙමින් 2016 වසර තුළ රටේ ආර්ථිකය සංවර්ධනයට දායකත්වය ලබාදෙන ලදි. නව තාක්ෂණ, නිෂ්පාදන, ක්‍රමවේද හඳුන්වා දීම, විවිධ කර්මාන්ත ක්ෂේත්‍රයන්හි ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහල නැංවීම. ආයෝජන සඳහා කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අවස්ථාවන් ඇති කිරිම. තාක්ෂණික දැණුම වැඩි කිරිම සහ පාරිසරික ආරක්ෂාව සඳහා ඇති අවස්ථා වැඩි දියුණු කිරිම, සම්පත් භාවිතය ප්‍රශස්ත කරලීම, යනාදී ලෙසින් ක්‍රියාවට නංවන ලදි.

6.1 2016 වසර තුළ සිදු කරන ලද ප්‍රධාන පොදු ක්‍රියාකාරකම්

6.1.1 සිමෙන්ති හා වැලි මිශ්‍රිත සෙවිලි තහඩු නිපදවීමේ තාක්ෂණය හඳුන්වාදීම

ආයතනය මගින් හඳුන්වාදුන් සිමෙන්ති ,වැලි මිශ්‍රණයෙන් නිෂ්පාදනය කරන සෙවිලි තහඩු තාක්ෂණය යොදා ගනිමින් වර්ග අඩි2500 ක පමණ මහලක් ඉදිකිරීමේ නියමු ව්‍යාපෘතියක් දැනට වසර කිහිපයකට පෙර නිම කරන ලදි .පසු ගිය වසර කිහිපයක කාලය තුල මෙම තාක්ෂණය පිළිබඳ අධ්‍යයන කිරීමෙන් පසු ඇස්බැස්ටස් සෙවිලි තහඩු වෙනුවට මෙම නව සිමෙන්ති වැලි තහඩු නිෂ්පානය රටට හඳුන්වා දීම සිදුකරන ලද අතර ඒ සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උනන්දුවක් දක්වන පාර්ශවයන් සහ උළු සහ ඇස්බැස්ටස් නිෂ්පාදන ආයතන සහභාගි විය .

6.1.2 බලශක්ති හා පාරිසරික කළමනාකරණ මධ්‍යස්ථානයේ නවීකරණය කරන ලද ගොඩනැගිල්ල විවෘත කිරීම

6.1.3 පිරිවැය ඵලදායි ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ අත්පොත එළි දැක්වීම

,



කොන්ත්‍රාත්කරුවන්, සේවාලාභීන්, උපදේශකවරුන් සහ ගෘහ නිර්මාණ ශිල්පීන් සඳහා පිරිවැය ඵලදායි ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳව සුදුසු තාක්ෂණික අත්පොතක් නොතිබීම සැලකිය යුතු අඩුපාඩුවක්ම පැවතුනි. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ එම අවශ්‍යතාවය සපුරාලමින් නර්ඩ් ආයතනය මගින් සියලුම තාකෂණික ප්‍රමිතීන් සහ පිරිවිතර අඩංගු වනසේ මෙම අත්පොත ප්‍රමිතියන්ට අනුකූලව පිළියෙල කර ඇත .පිරිවැය ඵලදායි ඉදිකිරීම් තාක්ෂණය යොදා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින ගෘහ නිර්මාණ ශිල්පීන්ට මෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැලෙන්නන් සඳහා මෙය මහඟු පිටුවහලක් වේ.

6.1.4 පෙරසවි, පෙරනිමි කොන්ක්‍රීට් පැනල් වලින් ඉදි කරන පැති බැම්ම - නියමු ව්‍යාපෘතිය

අවසන් කරන ලද නියමු ව්‍යාපෘතිය - දළුපිටිය

අසාර්ථක වූ වැරගැන්වූ කොන්ක්‍රීට් පැති බැම්මක් - කොත්මලේ

වර්තමානයේ, පවතින ඉඩම් හිඟය හේතුවෙන් සාමාන්‍ය නිවාසවලට පවා පැති බිම් දැමීමේ අවශ්‍යතාවයක් පවතී. වර්තමානයේ භාවිතා කරන පැති බැම් තාක්ෂණය සඳහා විශාල අවකාශයක් සහ පිරිවැයක් අවශ්‍ය වෙයි. ඉහත සඳහන් ගැටළුවලට විසඳුමක් ලෙස ආයතනය මගින් අඩු ඉඩක් සහ අඩු පිරිවැයක් සහිත පෙරසවි - පෙරනිමි කොන්ක්‍රීට් පැතිබැම් තාක්ෂණය හඳුන්වා දෙන ලදි.

මහර ප්‍රාදේශිය සභාවේ දළුපිටිය සායනික ගොඩනැගිල්ල අසල මෙම නව තාක්ෂණය යොදා ගනිමින් සෑදූ පැති බැම් යෙදීමේ නියමු ව්‍යාපෘතිය මේ වන විට අවසන් කර ඇත. එය අඩි 8ක උසකින් සහ අඩි 30ක දිගකින් යුක්ත වෙයි. ඒ සඳහා රු. 250,000.00ක මුදලක් වැයවී ඇත. එම මුදල RCC පැති බැම්මකට සාපේක්ෂව 15% ක මුදල් ඉතිරිය. අවශ්‍යවන ඉඩ ප්‍රමාණය සැලකීමේදී, එය Random Rubble Masonry පැති බැම්මට සාපේක්ෂව 80%ක ඉතිරියකි.

6.1.5 විවෘත දින ප්‍රදර්ශනය මධ්‍යස්ථානයේ තාක්ෂණ උද්‍යානයේදී පැවැත්වීම

අප රටේ පොදු මහජනතාව අතර නර්ඩ් තාක්ෂණය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීම සඳහා එක් දින ඉංජිනේරු හා තාක්ෂණික ප්‍රදර්ශනයක් 2016නොවැම්බර් 19 දින මධ්‍යස්ථානයේ තාක්ෂණික උද්‍යානයේදී පවත්වන ලදි. එම ප්‍රදර්ශනය මධ්‍යස්ථානයේ සේවය කරලු සියලු සභාපතිවරුන්ගේ සහභාගීත්වයෙන් උත්සවාකාරයෙන් විවෘත කරනු ලැබූ අතර එය සනිටුහන් කිරීම සඳහා රුක්රෝපණ වැඩ සටහනක්ද ක්‍රියාත්මක කරන ලදි.

ආයතනය මගින් හඳුන්වා දී ඇති නව තාක්ෂණයන්, නිෂ්පාදනයන්, ක්‍රමවේද හා ඉටු කරණු ලබන සේවාවන් පිළිබඳ මහජනතාව වෙත ප්‍රදර්ශණය කිරීම සඳහා එම ප්‍රදර්ශනය තුලදී, ප්‍රායෝගික ආදර්ශන, නිරූපන, දැනුවත් කිරීම්, උපදේශන සේවා සැපයීම, ජනතාව මුහුණදෙන ඉදිකිරීම් ගැටළු විසඳීම සඳහා ගොඩනැගිලි සායනයන් පැවැත්වීම, පාරිසරික ගැටළු නිරාකරණය සඳහා උපදෙස් දීම, ඉංජිනේරු කෞතුකාගාරය අය කිරීමකින් තොරව නැරඹීම සඳහා අවස්ථාව සලසා දීම මෙන්ම ළමුන් සඳහා දැණුම සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් පැවැත්වීම.

6.1.6 රසායනාගාර සඳහා අයි.එස්.ඕ. – 17025 ප්‍රනීතන සහතිකය ලැබීම

SLAB

Certificate of Accreditation

Environmental Laboratory
Energy & Environmental Management Centre
National Engineering Research and Development Centre

Chemical & Mechanical Testing

TL 060-01

14 June 2019

කර්මාන්ත හා සේවාල ලාභීන්ට වඩා ප්‍රශස්ත සේවාවක් ලබාදීම සඳහා 2016 වසරේදී, බලශක්ති හා පාරිසරික කළමණාකරන මධ්‍යස්ථානය මගින් සිදු කරනු ලබන අපජලය පරීක්ෂා කිරීම සහ ශබ්ද මට්ටම් මැනීම සේවාවන් සඳහා ISO 17025 තත්ව සහතිකය සහ ප්‍රනීතනය ලබා ගන්නා ලදි.

6.1.7 මධ්‍යස්ථානය විසින් හඳුන්වා දෙනු ලැබූ තාක්ෂණයන්, නිෂ්පාදන, ක්‍රමවේද මත පදනම්වූ පර්යේෂණ වාර්තා ඉදිරිපත් කිරීමේ සමුළුවක් පැවැත්වීම

මේ සඳහා පර්යේෂණ වර්තා 06 ක් ඉදිරිපත් කරනු ලැබූ අතර ඉන් හොඳම පර්යේෂණ වාර්තා 03 ඇගයීමට ලක්කරන ලදි.

6.2 2016 වසර තුල සිදු කරන ලද ප්‍රධාන පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්

රටේ ජාතික ආර්ථිකය නංවාලීම සඳහා නව නිෂ්පාදන, ක්‍රමවේද සහ තාක්ෂණයන් හඳුන්වාදීම අරමුණු කරගෙන පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතීන් කිහිපයක් 2016 වසර තුලද ක්‍රියාත්මක කරන ලදි .

6.2.1 මිරිදිය මත්ස්‍යය අභිජනන ජලාශවල ඇති වල් පැලෑටි ඉවත් කිරීම සඳහා යන්ත්‍රයක් හඳුන්වාදීම

මිරිදිය මත්ස්‍ය ජලාශ ,ජලජ වල් පැලෑටිවලින් පිරී පැවතීමද මිරිදිය මත්ස්‍ය කර්මාන්තයේ පවතින ප්‍රධාන ගැටළුවකි. ජල ධාරිතාවය අඩුවීම, ජලාශ ආශ්‍රිතව ජීවත්වන ජනතාවට ආර්ථිකමය සහ සෞඛ්‍යමය ගැටළු ඇතිවීම මෙහි අහිතකර ප්‍රතිඵල වේ. වර්තමානයේ මෙම වල් පැලෑටි අතින් ඉවත් කිරීම සිදු කරනු ලබන අතර ඒ සඳහා ගතවන කාලය, ශ්‍රමය සහ වියදම ඉතා අධික වේ .

දකුණු පළාත් සභාවේ ධීවර දෙපාර්තමේන්තුව මෙම ගැටළුව සඳහා දිගු කලක් තිස්සේ මුහුණ දී ඇති අතර එම ජලාශවලින් වල් පැලෑටි ඉවත් කර ගැනීම සඳහා සුදුසු යන්ත්‍රයක් නිෂ්පාදනය කර දෙන ලෙස සිදුකරනු ලැබූ ඉල්ලීමටකට අනුව මධ්‍යස්ථානය විසින් මෙම ජලජ පැලෑටි කපා ඉවත් කිරීම සඳහා අඩු වියදමකින් යුක්ත සහ පරිසර හිතකාමී යන්ත්‍රයක් නිපදවීම සඳහා පර්යේෂණ ආරම්භ කරන ලදී .මෙම යන්ත්‍රය ඔරුවක් මත තබා භාවිතා කිරීමේ හැකියාවක් පවතින අතර එහි ක්ෂේත්‍ර පරීක්ෂණ මේ වනවිට සිදු කෙරෙමින් පවතී .

6.2.2 පොල් නිෂ්පාදන කර්මාන්තය සඳහා යන්ත්‍රෝපකරණ හඳුන්වාදීම

පොල් වගාකරුවන් සහ පොල් කර්මාන්තයේ නියුතුවන් සඳහා පවතින ප්‍රධානම ගැටළු වනුයේ අවශ්‍ය කම්කරුවන් සොයාගැනීමේ අපහසුව සහ ඒ සඳහා අවශ්‍ය ශ්‍රමය සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවීම වේ. ඒ සඳහා විසඳුම් ලබාදීමේ අපේක්ෂාවෙන් පොල් ගෙඩි කැඩීම සහ පොල් ලෙලි ගැසීමේ කාර්යයන් පහසුවෙන් සිදුකළ හැකි සුදුසු යන්ත්‍ර සූත්‍ර මෙවලම් හඳුන්වාදීමට මෙම ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වේ. එහිදි පොල් ලෙලි ගැසීමේ කාර්යය සඳහා කුඩා පරිමාණ හා විශාල පරිමාණ යන්ත්‍ර නිර්මාණය කරමින් පවතින අතර ඒවායේ ක්ෂේත්‍ර පරික්ෂාවන්, සිදු කෙරෙමින් පවතී. පොල් ගෙඩි කැඩීම සඳහා හඳුන්වා දුන් පොල් කඩන කෙක්ක ද ක්ෂේත්‍ර පරික්ෂාවන් මේ වන විටත් සිදුකර ඇත.

6.2.3 දුම්මාළු සැකසීමේ උඳුන

දැනට වෙළඳපොළේ පවතින දුම්මාළු මිලෙන් වැඩිය .ඒවායේ (PAH) පොලිසයික්ලික් ඇරෝමැටික් හයිඩ්රෝකාබන සැලකිය යුතු ප්‍රමාණයක් ඇති බැවින් එම නිෂ්පාදන වල ගුණාත්මකභාවය සතුටුදායක මට්ටමක නොපවතී .මෙය NARA ආයතනය සමඟ එක්ව සිදු කරන ව්‍යාපෘතියකි .මේ මගින් දුම්මාළුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට සහ ඵලදායීතාවය ඉහළ නැංවීම තුළින් පිරිවැය අඩු කිරීමට ද බලාපොරොත්තු වේ .මෙම උඳුනේ ධාරිතාවය කිලෝග්රෑම්25 ක් වන අතර මේ වන විට දුම්මාළු සැකසීමේ උඳුන් ඒකකයක් සම්පූර්ණ කර ඇති අතර තවත් උඳුන් ඒකකයක් නිම වෙමින් පවතී .

6.2.4 රොගීන්ගේ තුවාලවලට ප්‍රතිකාරයක් වශයෙන් අධි පීඩන ඔක්සිජන් කුටීරයක් නිපදවීමේ පර්යේෂණ ව්‍යාපෘතිය





දියවැඩියාවෙන් හෝ නිදන්ගත රෝග වලින් ඇති වූ තුවාල සඳහා අධි පීඩන ඔක්සිජන් කුටීර චිකිත්සාව පිළිගත් ප්‍රතිකර්මයකි. අනෙකුත් රටවල මෙය ඉතා ප්‍රචලිත ක්‍රමයක් වුවද ශ්‍රී ලංකාවේ එය එතරම් ප්‍රචලිත වී නොමැත. පිටරටින් ආනයන කරන ලද කුටීරවල මිල අධිකවීම මේ සඳහා බලපාන ලදී. මෙම ව්‍යාපෘතිය වෛද්‍යවරුන්ගේ ඉල්ලීම මත ආරම්භ කරන ලද අතර මේ වන විට O_2 (ඔක්සිජන්) කුටීරයක් හඳුන්වාදීම සඳහා පර්යේෂණ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. එහි නිෂ්පාදන කටයුතු සිදුකෙරෙමින් පවතී.

6.2.5 බිත්ති ඉදිකිරීම සඳහා යන්ත්‍ර පද්ධතියක් නිර්මාණය කිරීම

ගොඩනැගිලි වල බිත්ති ඉදි කිරීම සඳහා විශාල පිරිවැයක් අමු ද්‍රව්‍යවලට සහ කම්කරු කුලිය වශයෙන් වැයවේ. මේ සඳහා නර්ඩ් ආයතනය මගින් කපරාරුව අවශ්‍ය නොවන සිමෙන්ති, ගල් කුඩු මිශ්‍රණයෙන් ඉදි කරන ස්ලිප්ෆොම් බිත්ති තාක්ෂණය හඳුන්වා දී තිබුණ ද ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පවතින අඩුපාඩු, දුර්වලතාවයන් හේතුවෙන් බලාපොරොත්තු වූ ආකාරයට එම තාක්ෂණය ජනප්‍රිය නොවීය.

මේ පිළිබඳව සිදු කරණ ලද පුළුල් අධ්‍යයනයකින් පසු ස්ලිප්ෆොම් බිත්ති ඉදි කිරීම සඳහා හයිඩ්‍රොලික් පද්ධතියෙන් ක්‍රියා කරනු ලබන යාන්ත්‍රික පද්ධතියක් හඳුන්වා දෙනු ලැබිණ. දැනට එම යන්ත්‍ර පද්ධතියේ පර්යේෂණ අවධිය නිමකර නිෂ්පාදන වැඩිදියුණු කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

6.2.6 අර්ධ ස්වයංක්‍රීය ආප්ප සෑදීමේ යන්ත්‍රය වැඩිදියුණු කිරීම

ආප්ප සෑදීමේ ක්‍රියාවලියේ ඵලදායීතාවය වැඩිකිරීම සහ ආප්පවල ගුණාත්මකතාවය වැඩිදියුණු කිරීම සඳහා රුහුණු විශ්ව විද්‍යාලය සමඟ ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ව්‍යාපෘතිය මේ වන විට අවසන් අදියරයේ පවතින අතර එම තාක්ෂණය අදාල පුද්ගලයන්ට පැවරීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. මෙම යන්ත්‍රයෙන් පැයකට ආප්ප 350ක් නිෂ්පාදනය කිරීමේ හැකියාවක් පවතී.

6.2.7 වැඩි දියුණු කරන ලද කිරි දෙවීමේ යන්ත්‍රය හඳුන්වාදීම

මේ වන විට යන්ත්‍රයේ නිෂ්පාදන කටයුතු අවසන් වී ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා ගොවින් වෙත යන්ත්‍ර 10ක් ලබාදී ඇත. එහි ප්‍රතිඵල මත සිදු කල යුතු වෙනස්කම් හා දියුණු කිරීම් හඳුනාගෙන ඇති අතර එම වෙනස්කම්, දියුණු කිරීම් සිදු කිරීමට නියමිතය. මෙම යන්ත්‍රය මගින් කිරි දෙවීමේ ක්‍රියාවලියේ නිෂ්පාදන නාස්තිවීම් අවම කරගත හැකි අතර ක්‍රියාවලියේ වේගය වැඩිකර ගැනීමේ හැකියාවක්ද ඇත.

6.2.8 අර්ධ ස්වයංක්‍රීය ඖෂධ බහාලුම් කවර නිෂ්පාදන යන්ත්‍රය ප්‍රවර්ධනය කිරීම

ඖෂධ බහාලුම් කවර නිෂ්පාදන කර්මාන්තකරුවන්ගේ ඇති ඉල්ලුම මත මෙම ව්‍යාපෘතිය අවසාන අදියරයේ පවතී. මේ වනවිට ව්‍යාපෘතිය අවසන් අදියරයේ පවති. මෙම යන්ත්‍රයේ අපේක්ෂිත නිමැවුම් ධාරිතාවය පැයකට කවර 1000ක් වන අතර කවරයේ විශාලත්වය මි.මී.70 x මි.මී. 95 වෙයි.

6.2.9 ගොඩනැගිලි කළමණාකරන පද්ධති සඳහා වූ දත්ත එක්රැස් කිරීමේ සර්ව මොඩියුලය හඳුන්වාදීම - Universal Data Acquisition Module

ගොඩනැගිලි කළමණාකරන පද්ධතියේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා සහ කර්මාන්ත පද්ධති ස්වයංක්‍රීය කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මේ වනවිට මෙම පද්ධතියේ නිර්මාණ කටයුතු අවසන් කර ඇති අතර එය කර්මාන්තයන්හි යෙදීමේ යෝග්‍යතාවය සහතික කිරීම සඳහා පරීක්ෂණ සිදු කරමින් පවතී. මේ වනවිට ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

6.2.10 "L" හැඩැති පෙරසවි - පෙරනිමි කොන්ක්‍රීට් තරප්පු පෙළ හඳුන්වාදීම

සම්ප්‍රදායික තාක්ෂණය මගින් නිවාස වල ඉදි කරන තරප්පු පෙළ/පඩිපෙළ සඳහා විශාල මුදලක් වැය වන හෙයින් "L" හැඩැති පෙරනිමි කොන්ක්‍රීට් තරප්පු පෙළ හඳුන්වා දෙන ලදි. පර්යේෂණ කටයුතු නිම කර ඇති අතර නියමු ව්‍යාපෘතියක් ද සිදුකර ඇත. මෙම තාක්ෂණය යොදා ගනිමින් පඩි පෙල ඉදි කිරීමේදී 25% කට වැඩි ආර්ථික වාසියක් ලබා ගැනීමට පාරිභෝගිකයන්ට හැකිවේ.

මෙහි විශේෂ ලක්ෂණයන් වනුයේ පඩිපෙලෙහි නැග්ම ආවරණය වීම, ආකර්ශනීය නිමාවක් පැවතීම සහ ශක්තිමත් භාවය ඉහල මට්ටමක පැවතීම වේ.

6.2.11 වියදම් පිරිමැසුම්දායක පියැසි සැකිල්ලක් නිර්මාණය කිරීම

දැව සඳහා යන අධික මිල අඩුකර ගැනීමේ අරමුනින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. දැනට පර්යේෂණ කටයුතු අවසන් කර ඇති අතර නියමු ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු යොදමින් පවතී.

6.2.12 සිමෙන්ති ස්ථායි සම්පින්ඩිත පස් ගල් (CSCSB) වලින් ඉදි කරන ලද බිත්ති සඳහා තීන්ත ආලේපනයන් හඳුන්වාදීම

CSCSB බ්ලොක් ගල් වලින් සාදන ලද බිත්ති ආලේප කිරීම සඳහා වෙළඳ පොලේ තීන්ත වර්ග භාවිතා කිරීම ඉතා පිරිවැය අධික වන අතර CSCSB වල ස්වාභාවික පෙනුමද අඩුවීමට හේතුවේ. මේ සඳහා විශේෂිත වූ තීන්ත ආලේපයක් හඳුන්වා දෙනු ලැබූ අතර දැනට නියමු ව්‍යාපෘතියද නිම කර ඇත.

6.2.13 වාහන ගාල් කරන ස්ථාන වල (Parks) වාහන ගාල් කල හැකි අවකාශය ප්‍රධාන දොරටුවේදීම හඳුනා ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණය හඳුන්වා දීම

වර්තමානයේදී ප්‍රසිද්ධ ස්ථානවල (වෙළඳ සංකීර්ණ සහ කාර්යාල යනාදී) වාහන ගාල් කිරීමේදී රියදුරන්ට ඇතිවන දුෂ්කරතා මග හැරවීම සඳහා මෙම පර්යේෂණය සිදු කරන ලදි. දැනට පර්යේෂණ කටයුතු සහ ක්ෂේත්‍ර පරීක්ෂණද නිම කොට ඇත. මෙහි නියමු ව්‍යාපෘතිය ඩයලොග් සමාගමේ කාර්යාල රථගාල සඳහා සිදු කිරීමට නියමිත අතර ඒ සඳහා අවබෝධතා ගිවිසුම සැකසෙමින් පවතී. නව තාක්ෂණයට අනුව හිස්ව පවතින වාහන ගාල් කරන ස්ථාන ගොඩනැගිල්ලේ ප්‍රධාන ගේට්ටුව අසලදීම හඳුනා ගැනීමට හැකියාව ලැබීම මෙහි ඇති විශේෂත්වය වේ.

6.3 නියමු ව්‍යාපෘති

නර්ඩ් ආයතනය මගින් හඳුන්වා දෙන ලද නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ, මෙවලම් සහ තාක්ෂණයන් ක්‍රමවේද, ජනතාව අතර ප්‍රචලිත කිරීමේ, ආදර්ශනය කිරීමේ සහ තවදුරටත් හැදෑරීම් කටයුතු සඳහා සිදු කරනු ලැබූ පහත සඳහන් නියමු ව්‍යාපෘති 2016 වසර තුලදී අවසන් කරන ලදි.

6.3.1 අඩි පාලම් ඉදි කිරීම්

ෆෙරෝ සිමෙන්ති තාක්ෂනයෙන් සහ පෙරසවි කොන්ක්‍රීට් තාක්ෂණයෙන් යුත් අඩි පාලම් 2ක් නර්ඩ් ආයතනයේ තාක්ෂණික උද්‍යානය තුල ප්‍රතිස්ථාපනය කර ඇත.

6.3.2 අඩු වපසරයක් සහිත අපජල පද්ධතිය

කුඩා ප්‍රමාණයේ වාහන සේවා ස්ථාන වල අපවිත්‍ර ජලය ක්‍රමානුකූලව පරිසරයට මුදා නොහැරීමෙන් ඇති වන පාරිසරික ගැටළු අවම කිරීම සඳහා මෙම අපජල පද්ධතිය හඳුන්වා දෙන ලදි. නියමු ව්‍යාපෘතියක් වශයෙන් ඒකල ප්‍රදේශයේ වාහන සේවා ස්ථානයක මෙම අපජල පිරිපහදු පද්ධතියක් ස්ථාපිත කල නියමු ව්‍යාපෘතිය සාර්ථකව නිම කරන ලදි.

6.4 ඉදිකිරීම් සඳහා උපදේශන සේවා සැපයීම

6.4.1 වෛද්‍ය නිලධාරි ගොඩනැගිල්ල ඉදිකිරීම - වාද්දුව



පිරිමැසුම්දායක ගොඩනැගිලි තාක්ෂණය භාවිතයෙන් ගොඩනැගිලි දෙකක් ඉදි කිරීම සඳහා උපදේශක සේවා සැපයීමට නියමිතය. දැනට සැලසුම් කටයුතු නිමකර ලංසු කැඳවීම් පත්‍රිකා සකසා ඇත. උපදේශක සේවාවේ වටිනාකම මිල රු. මිලියන 2.8

සේවාලාභියා : ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක

6.4.2 ස්තූපයක් ගොඩනැගීම - විමල මහා විහාරය, කොටුගොඩ



කොන්ක්‍රීට් තලාද මත ඇතුලත හිස් අවකාශය සහිත කොටුවට ආවරණයක් පමණක් යොදා ගෙන චෛත්‍ය ඉදි කිරීම මෙහි අරමුණය. දැනට සැළසුම් කටයුතු නිමකර ඇත.

උපදේශක සේවාවේ වටිනාකම රු.113,000.00

6.4.3 ආදාහනාගාර 2ක් ඉදි කිරීම සඳහා උපදේශන සේවා සැපයීම / හම්බන්තොට ඉදි කරනු ලැබූ ආදාහනාගාර 02 සඳහා

උපදේශන සේවා ගාස්තු : රු 400,000/- කි.
මේ වනවිට ව්‍යාපෘතියෙන් 75% ක් පමණ සම්පූර්ණ කර ඇත.

6.5 ඉංජිනේරු සැලසුම්කරණය සහ නිමැවුම්කරණය සඳහා අවශ්‍ය සේවාවන් සැපයීම

මෙම සේවාවන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ලබාදෙයි. එවැනි ප්‍රධාන සේවාවන් වනුයේ;

- සංකීර්ණ අච්චු නිවැරදිව සැලසුම් කිරීම හා නිෂ්පාදනය කිරීම .
- අච්චු නිර්මාණය කිරීම සහ සංශෝධන සිදු කිරීම.
- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීම.
- සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදන කර්මාන්ත සඳහා උපදේශන හා ආධාරක සේවා සැපයීම.

ඉහතින් සඳහන් කල සේවාවන් සඳහා ලැබුණ ආදායම් පහත දැක්වේ.

සේවාව	වටිනාකම (රු. මිලියන)
- සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම	- 1.41
- සංරචක නිෂ්පාදනය කිරීම	- 0.67
- පරීක්ෂා කිරීම් සඳහා	- 1.23
- පුහුණු වැඩ සටහන් සඳහා	- 0.27

6.6 කර්මාන්ත සඳහා සේවා සැපයීම

6.6.1 පහත සඳහන් සේවාවන් සඳහා කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු සේවාලාභීන්ගේ ඉල්ලීම මත සේවා සැපයීම සිදු කර ඇත

- බලශක්ති ආශ්‍රිත සේවා
- බලශක්ති විගණනය කිරීමේ සේවා
- කාර්යක්ෂම බලශක්ති උපයෝගීතා පද්ධති නිර්මාණය කිරීම.
- කාර්මාන්ත ක්‍රියාවලි අධීක්ෂණ සේවා
- බොයිලේරු විශ්ලේෂණය සහ සුසර කිරීම
- බොයිලේරු tunning පද්ධති නිර්මාණය කිරීම
- වායුසමීකරණ පද්ධති නිර්මාණය කිරීම

- ISO 50000 තත්ව සහතිකය යටතේ උපදේශන සේවා සැපයීම
- බලශක්ති කළමණාකරනය සහ සංරක්ෂණය පිළිබඳ දැණුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- පරිසර හිතකාමී සේවාවන් සැපයීම
- පාරිසරික වායු තත්ව පරීක්ෂාවන් සිදු කිරීම
- කාර්මික විමෝචන සහ දූවිලි පාලන පද්ධති නිර්මාණය කිරීම
- ශබ්දමය මිණුම් සහ ඒවායේ පාලන පද්ධති සැලසුම් කිරීම
- පාරිසරික කළමණාකරණ කිරීම පිළිබඳ දැණුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.
- අපජල පරීක්ෂාව හා අපජල පිරිපහදු පද්ධති සැලසුම් කිරීම

6.6.2 බලශක්ති හා පාරිසරික කළමනාකරණ පද්ධති මගින් කර්මාන්ත සඳහා සිදුකරන ලද සේවාවන්හි වටිනාකම

ක්‍රියාවලිය	වටිනාකම (රු. මිලියන)
- පාරිසරික රසායනාගාර පද්ධතිය	- 1.34
- කර්මාන්ත සඳහා පාරිසරික ගැටළු විසඳීම	- 0.71
- නීති රෙගුලාසිවලට අනුකූල ව පාරිසරික නිරීක්ෂණ සහ සේවාවන් සැපයීම	- 4.62
- බොයිලර් වල ක්‍රියාවලිය ඇගයීම සහ ඉන් පිටවන වායු විශ්ලේෂණය කිරීම	- 5.7
- කර්මාන්ත ක්‍රියාවලිය අධීක්ෂණය සහ උපදේශක සේවා	- 1.2
- පුහුණු වැඩ සටහන්	- 0.18
- බලශක්ති විගණනය කිරීම	- 0.28

6.7 ආයතනය මගින් හඳුන්වා දුන් තාක්ෂණයන් මත පදනම් වූ වාණිජ ක්‍රියාකාරකම්

6.7.1 දේශීය ආයුර්වේද අංශය සඳහා යන්ත්‍රෝපකරණ සැකසීම

නර්ඩ් ආයතනය මගින් ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා යන්ත්‍රෝපකරණ කිහිපයක් හඳුන්වා දී ඇත. ආයුර්වේද ඖෂධ සඳහා අවශ්‍ය කොළ සහ ඇට වර්ග කුඩු කිරීමේ යන්ත්‍ර නිෂ්පාදනය කර සහ හයිඩ්‍රොලික් ජැක් භාවිතයෙන් ක්‍රියා කරන යූෂ ඉවත් කරගැනීමේ යන්ත්‍ර දිවයිනේ විවිධ ප්‍රදේශවල දේශීය වෛද්‍යවරුන්ගේ සමිති වෙත භාර දී ඇත. ඒවායේ වටිනාකම් පහත පරිදි වේ.

ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා යන්ත්‍රපෝකරණ සැකසීම

යන්ත්‍රයේ නම	නිම කරන ලද යන්ත්‍ර සංඛ්‍යාව	වටිනාකම (රු)
හයිඩ්රොලික් ජැක් භාවිතයෙන් ක්‍රියා කරන තෙල්/යූෂ ගැනීමේ යන්ත්‍රය	10	645,000/-
කොළ සහ ඇට වර්ග කුඩු කිරීමේ යන්ත්‍රය	07	408,000/-
මඤ්ඤොක්කා පෙති කපනය	01	30,000/-

6.7.2 රෙදිපිළිවල තත්වය පරීක්ෂා කිරීමේ අරමුණින් අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය සඳහා යන්ත්‍රයක් හඳුන්වාදීම

අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය මගින් නිපදවනු ලබන රෙදිවල ගුණාත්මකභාවය සහතික කර ගැනීමට අවශ්‍ය යන්ත්‍රයක් බස්නාහිර පලාත් සභාවේ කර්මාන්ත අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව නිෂ්පාදනය කරන ලදි.

මේ වන විට යන්ත්‍රයේ නිර්මාණ කටයුතු අවසන් වී ඇති අතර එය රු.798,000/-ක වටිනාකමකින් යුක්ත වෙයි. මෙම කර්යය අවසන් කර බස්නාහිර පලාතේ කර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.

6.8 පර්යේෂණාගාර සේවාවන්

කර්මාන්ත සහ ඉදිකිරීම් ක්ෂේත්‍රවල අවශ්‍යතාවලට අනුව මෙම පර්යේෂණාගාර සේවාවන් සිදු කරන ලදි.

6.8.1 සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ සිදු කරන ලද රසායනාගාර පරීක්ෂණ

රසායනාගාර පරීක්ෂාවන්

පරීක්ෂණයේ නම	සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව	ආදායම (රු)
- කොන්ක්‍රීට් ගඩොල් වල සම්පීඩ්‍යතා ශක්තිය මැනීම	468	245,700/-
- සිමෙන්ති ගඩොල්වල සම්පීඩ්‍යතා ශක්තිය මැනීම	60	31,500/-
- පස් ගඩොල්වල සම්පීඩ්‍යතා ශක්තිය මැනීම	42	22,050/-
- බිම අතුරන ගල්වල සම්පීඩ්‍යතා ශක්තිය මැනීම	350	183,750/-
- කම්බිවල ශක්තිය පරික්ෂා කිරීම	42	50,400/-

6.8.2 විදුලි හා විද්‍යුත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ රසායනාගාරය මගින් සිදු කරන ලද පරීක්ෂනයන් හා පරීක්ෂණවල වටිනාකම්

පරීක්ෂණයේ නම	සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව	වටිනාකම (රු. මිලියන)
- ලාම්පු පරීක්ෂණ	225	1.3
- බැටරි පරීක්ෂණ	06	0.15
- ක්‍රමාංකනය කිරීමේ සේවා	23	0.15

6.9 පුහුණු වැඩ සටහන් හා දැණුවත් කිරීමේ වැඩසටහන්

6.9.1 නර්ඩ් ආයතනයෙන් සංවර්ධිත තාක්ෂණයන් සඳහා පැවැත්වූ පුහුණු වැඩ සටහන්

කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතුවන්ගේ තාක්ෂණික හා කාර්මික දැණුම වැඩි දියුණු කිරීම සඳහා මෙන්ම තාක්ෂණය ප්‍රචලිත කිරීම සඳහා පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. එම පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

නර්ඩ් ආයතනයෙන් හඳුන්වා දුන් තාක්ෂණයන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන්.

වැඩසටහනේ නම	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව	ආදායම (රු.)
- සිමෙන්ති ස්ථායි සම්පින්ඩිත පස් ගල් නිපදවීම සඳහා පුහුණු පාඨමාලාව	06	85	322,000/-
- ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා පිරිවැය ඵලදායී ඉදිකිරීම් තාක්ෂණය (නර්ඩ් තාක්ෂණය) ලබාදීම සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන්	04	75	44.000/-
- පෙරසවි කොන්ක්‍රීට් ගොඩනැගිලි උපාංග නිෂ්පාදනය	04	200	100,000/-
- නර්ඩ් ආයතනය මගින් ප්‍රවර්ධිත තාක්ෂණය මත පදනම් වූ ස්වයං රුකියා අවස්ථා නිර්මාණය කිරීම දැණුවත් කිරීම	04	210	100,000/-
- තිරසාර බලශක්ති අධිකාරිය හා නව නිපැයුම් කරුවන්ගේ කොමිසම සමඟ ඒකාබද්ධව සිසුන් හා ගුරුවරුන්ගේ බලශක්ති කළමනාකරණය පිළිබඳ දැණුම දියුණු කිරීම	04	146	100,900/-
- අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවයෙන් විද්‍යා ගුරුවරුන්ගේ විද්‍යා දැනුම වැඩි කිරිම සඳහා විශේෂ වැඩසටහන්	08	343	44,000/-

6.9.2 කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු පුද්ගලයින්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන්

කර්මාන්තයන්හි පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමෙන් පසු එම කර්මාන්තයන්හි නිරත පුද්ගලයන්ගේ අදාල ක්ෂේත්‍ර වල දැනුම වැඩිදියුණු කිරිම සඳහා පුහුණු වැඩ සටහන් ගණනාවක් පවත්වන ලදි.

පුහුණු වැඩසටහනේ නම	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව	ආදායම (රු)
- ගොඩනැගිලි ඉදිකිරීමේ මූලික සිද්ධාන්ත	01	31	102,415/-
- ව්‍යවසායකත්ව සංවර්ධනය	01	21	27,810/-
- ජීව වායු ඒකක සෑදීම, ක්‍රියාකාරිත්වය සහ නඩත්තු කිරිම	01	13	71,500/-
- කාර්මික පොම්පවල න්‍යායාත්මක හා ප්‍රායෝගික දර්ශක	01	23	158,000/-
- ආදාහනාගාර ක්‍රියාකාරිත්වය සහ නඩත්තු කිරීම	01	60	170,000/-
- පරිමිත මූලද්‍රව්‍ය ආකෘති නිර්මාණය සහ විශ්ලේශණය	01	08	48,000/-
- රසායනික ද්‍රව්‍ය වලින් ආරක්ෂා වීම සහ අනතුරු දායක රසායනික ද්‍රව්‍ය ආරක්ෂා සහිතව ගබඩා කිරිම	01	53	189,000/-
- Programmable Logic Control Programme	11	140	709,322/-
- Industrial – 1 සහ පාලන පද්ධතිය	02	30	135,000/-
- කාර්මික යෙදුම් සඳහා වායුව භාවිතා කිරීම	04	50	250,000/-
- Forklift නඩත්තු කිරීම	02	43	225,000/-
- රථවාහන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්	01	05	30,000/-

6.10 තාක්ෂණ ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම්

ආයතනය මගින් හඳුන්වා දුන් නිෂ්පාදන හා තාක්ෂණ ප්‍රචලිත කිරීම අපගේ ප්‍රධාන වගකීමකි. නමුත් මේ දක්වා සිදු කල ප්‍රචලිත කිරීමේ ක්‍රියාමාර්ගයන් ප්‍රමාණවත් නොවිණි. ඒ සඳහා, පුවත්පත් ලිපි, පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් පැවැත්වීම සහ ප්‍රදර්ශනවලට සහභාගීවීම සිදු කරන ලදි. 2016 වසර තුලදී සිදු කල ක්‍රියාකාරකම් පහතින් දැක්වේ.

- ටෙක්නො ප්‍රදර්ශනය, ගොඩනගමු ශ්‍රී ලංකා ප්‍රර්ශනය ඇතුළුව ජාතික මට්ටමේ ප්‍රදර්ශන 11 ට සහභාගි වීම

- දිනමිණ සහ තරුණි පුවත්පත් ඇතුළුව ජාතික මට්ටමේ පුවත්පත්වල ලිපි 15 ක් ප්‍රකාශයට පත් කරන ලදී.

- ජාතික රූපවාහිනියේ සහ ස්වාධීන රූපවාහිනියේ වැඩ සටහන් හතරක් පවත්වා ඇත.

- නර්ඩ් තාක්ෂණ උද්‍යානයේ දී "විවෘත දින" ප්‍රදර්ශනයක් පවත්වන ලදි. එය මහජනතාවට කිසිදු අයකිරීමකින් තොරව විවෘත වූ අතර දෙදහසකට අධික පිරිසක් එයට සහභාගී වීඇත. එහිදී මහජනතාවගේ නිවාස බලශක්ති ක්ෂේත්‍රයට අදාළ ගැටළු විසදීම සදහා ගොඩනැගිලි සායනයක් සහ බලශක්ති සායනයක් ද පවත්වන ලදී.

6.11 නර්ඩ් තාක්ෂණ පැවරුම් ක්‍රිකාරකම්

2016 වර්ෂය තුලදී ව්‍යවසායකයින් සඳහා තාක්ෂණ පැවරීම් සිදු කල අතර නව තාක්ෂණයක් සඳහා පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් කිරීම සිදු කරන ලදි.

6.11.1 තාක්ෂණ පැවරුම් පිළිබඳ විස්තර

තාක්ෂණ පැවරුම්

පවත්වන තාක්ෂණයන්	තාක්ෂණ පැවරුම්ලාභීන් ගණන
පිරිවැය ඵලදායි ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය	11
සම්පින්ඩිත සිමෙන්ති වලින් ස්ථාවර කරන ලද පස් ගඩොල් නිෂ්පාදනය (CCSB)	01
CCSB සාදන උපකරණය (අතින් ක්‍රියාත්මක)	01
ෆෙරෝ සිමෙන්ති වලින් නිෂ්පාදිත අඩි පාලම් ඉදිකිරීම	01
පෙරසවි කොන්ක්‍රීට් අඩිපාලම් ඉදි කිරීම	01
පෙරසවි කොන්ක්‍රීට් තලාද නිෂ්පාදනය	01

6.11.2 තාක්ෂණයන් සඳහා නිකුත් කරන වාර්ෂික බලපත්‍ර අලුත් කිරීම

ඊළඟ වසර සඳහා නර්ඩ් ආයතනයේ බලපත්‍ර ලාභීන් ලෙස සිය කර්මාන්තය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලාභීන් සඳහා බලපත්‍ර අලුත් කිරීම අවශ්‍ය වේ. 2016 වර්ෂය සඳහා විස්තර පහත දක්වා ඇත.

තාක්ෂණය	ලියාපදිංචි වූ බලපත්‍රලාභීන් සංඛ්‍යාව
- පිරිවැය එලදායි ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය	- 32
- බිත්ති ඉදිකිරීම සඳහා CCSB නිෂ්පාදනය	- 01
- CCSB නිපදවීමේ යන්ත්‍රයක් සෑදීම	- 04
- එළවළු විජලන යන්ත්‍රයක් සෑදීම	- 01
- පෙර සවි කොන්ක්‍රීට් අංගනය ස්ථාපිත කිරීම	- 05
- ආදාහනාගාර ඉදිකිරීම	- 06
- ජීව වායු ඒකක ඉදි කිරීම	- 06
- ජීවවායුව මගින් බත් පිසිනය	- 01
- කජු වියලනය	- 01
- සූර්යතාපකය	- 02

6.11.3 පේටන්ට් බලපත්‍ර සඳහා අයදුම් කිරීම

2016 වසර තුලදී පහත සඳහන් නව තාක්ෂණයන් සඳහා පේටන්ට් බලපත්‍ර අයදුම් කරන ලදී.

බලපත්‍ර අංකය	බලපත්‍ර	අයදුම් කල දිනය
18639	ජලපාලන අසවු දොරටු	2016.02.11
18792	මඤ්ඤොක්කා පෙති කැපීමේ යන්ත්‍රය	2016.05.16
18904	අප ජල පිරිපහදු පද්ධතිය	2016.07.28
18967	වී වගාව තුල වල් පැල ඉවත් කරන යන්ත්‍රය	2016.09.07
19102	නැවුම් තේ දළු වල මතුපිට තෙතමනය මැනීමේ උපකරණය	2016.11.30

07. සුභසාධන හා ආගමික කටයුතු

ආයතනික කාර්ය මණ්ඩලයේ අන්තර් පුද්ගල සබඳතා, සහයෝගීතාවය, කණ්ඩායමක් වශයෙන් කටයුතු කිරීම, ආයතනික පොදු කටයුතු සඳහා දක්වන කැපවීම යනාදිය වර්ධනය කරලීමේ අරමුණින් සේවක සුභසාධක හා ආගමික ක්‍රියාකාරකම් සඳහාද ආයතනය විසින් විශේෂ අවධානයක් ලබාදී කටයුතු කරනු ලබේ. ඒ අනුව, 2016 වර්ෂයේදී මධ්‍යස්ථානයේ සේවක සුභසාධක සංගමය හා ආගමික සංගම් විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් සාරාංශයක් ලෙස පහත සඳහන් වේ.

7.1 සුභසාධක සංගමය

2016 වර්ෂය තුලදී මධ්‍යස්ථානයේ සුභසාධක සංගමය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

- ආයතනයේ පුරෝගාමී සභාපතිවරයෙකු වූ විද්‍යාජෝති ඒ.එන්.එස් .කුලසිංහ මැතිතුමාගේ ජන්ම දිනය නිමිතිකරගෙන 2016.11.28 දින මධ්‍යස්ථානයේදී ලේ දන්දීමේ වැඩසටහනක් සංවිධානය කිරීම.
- 2016.11.19 දින නර්ඩ් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් වෙනුවෙන් ත්‍යාග ප්‍රදානය කිරීම.
- නර්ඩ් කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් 2016.12.29 දින සුහද හමුවක් සංවිධානය කිරීම.

7.2 ආගමික සංගම්

බෞද්ධ සංගමය හා කතෝලික සංගමය යන සංගම් දෙක මධ්‍යස්ථානය තුල ආගමික කටයුතු සම්බන්ධයෙන් ප්‍රමුඛව ක්‍රියාත්මක වේ. මධ්‍යස්ථානයේ සේවක මහත්ම මහත්මීන්ගේ අධ්‍යාත්මීය හා මානසික සංවර්ධනය සඳහා විවිධ වූ වැඩසටහන් මෙම සංගම් දෙකෙහි පුරෝගාමීත්වයෙන් සිදු කරනු ලැබේ. මධ්‍යස්ථානයේ සෑම සේවකයෙකුම ස්වේච්ඡාවෙන් මෙම සංගම් දෙකෙන් එකක සාමාජිකත්වය හිමිවීම විශේෂත්වයකි.

එම සංගම් 2016 වර්ෂය තුලදී පහත සඳහන් ආගමික හා සමාජ සත්කාර ක්‍රියාකාරකම්හි නිරතව ඇත.

7.2.1 බෞද්ධ සංගමය

- 2016.01.02 දින මධ්‍යස්ථානයේ නව වසරේ කටයුතු ඇරඹීම නිමිත්තෙන් සෙත් පිරිත් සජ්ඣායනයක් පැවැත්වීම.
- ගම්පහ පහලයාගොඩ සෙත් සෙවන සදහම් විහාරස්ථානයේ විහාරාධිපති, පහලයාගොඩ ශ්‍රී ස්වර්ණපාලි විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති කවිපති කාව්‍ය විශාරද ශිරෝමණී අතිපූජ්‍ය සන්නස්ගම බුද්ධප්‍රිය ස්වාමීන්වහන්සේ සහ අලවතුගොඩ සඳගිරි විහාරස්ථානයේ විහාරාමවාසී මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ ආචාර්ය අතිපූජ්‍ය අලවතුගොඩ මේධාවී ස්වාමීන්වහන්සේලා විසින් පවත්වන ලද යුගාසන කාව්‍යමය ධර්මදේශනය 2016.01.29
- පොසොන් පොහොය නිමිතිකරගනිමින් 2016.06.16 දින ජා ඇල ජයන්ති විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති ශාස්ත්‍රපති පූජ්‍ය කිඹුලාපිටියේ විමලානන්ද ස්වාමීන්වහන්සේ විසින් සුමධුර ධර්ම දේශනයක් පැවැත්වීම
- 2016.10.25 වන දින ජාඇල, වැලිගම්පිටිය ජයවර්ධන ළමා නිවාසයේ දරුවන් සඳහා දිවා ආහාරය හා පරිත්‍යාගයන් සිදුකිරීම.

7.2.2 කතෝලික සංගමය

- නර්ඩ් ආයතනයේ කාර්ය මණ්ඩලයේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් 2016.09.24 සහ 25 දිනවල මඩු දේවස්ථානයේ වන්දනා චාරිකාවක් සංවිධානය
- ආයතනයේ වාර්ෂිකව පවත්වනු ලබන නත්තල් දේව මෙහෙය 2016.12.20 දින මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පැවැත්වීම.

08. 2016.12.31 දිනට තත්ත්ව ප්‍රකාශය

(මූල්‍ය ඒකකය - රුපියල්)

	2016	නැවත ප්‍රකාශිත 2015
වත්කම්		
ජංගම වත්කම්		
මුදල් හා මුදල් සමාන දෑ	95,484,593.69	105,890,568.07
වෙළඳ ණය ගැතියෝ	27,969,438.62	14,788,493.00
තොග	8,195,538.40	8,380,528.01
කලින් ගෙවීම්	701,155.98	615,504.27
වෙනත් ජංගම වත්කම්	46,912,749.13	63,154,210.32
	179,263,475.82	192,829,303.67
ජංගම නොවන වත්කම්		
දේපල හා පිරියත	580,620,198.75	604,186,443.92
අනෙකුත් අස්පෘශ්‍ය වත්කම්	312,420.45	247,480.45
වෙනත් ජංගම නොවන වත්කම්	25,651,942.83	25,041,481.58
	606,584,562.03	629,475,405.95
මුළු වත්කම්	785,848,037.85	822,304,709.62
බැරකම්		
ජංගම බැරකම්		
වෙළඳ හා අනෙකුත් ගෙවියයුතු දෑ	33,877,432.09	43,496,287.61
මුළු ජංගම බැරකම්	33,877,432.09	43,496,287.61
ජංගම නොවන බැරකම්		
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	98,094,019.75	96,421,087.25
සුරක්ෂිත තැන්පතු	6,200.00	7,200.00
	98,100,219.75	96,428,287.25
මුළු බැරකම්	131,977,651.84	139,924,574.86
ශුද්ධ වත්කම්	653,870,386.01	682,380,134.76
ශුද්ධ වත්කම්/ස්කන්ධය		
විලම්භිත ආදායම්	103,962,903.00	120,285,393.23
රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්	250,560,299.26	257,002,660.64
ප්‍රත්‍යාගනන සංචිතය	535,275,831.83	535,275,831.83
සමුච්චිත අතිරික්තය/(ඌනතාවය)	(235,928,648.08)	(230,183,750.94)
මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය	653,870,386.01	682,380,134.76

....		....
ඉංජි. ඩබ් ජේ එල් එස් ප්‍රනාන්දු	ඉංජි. ඩී ඩී ඒ නාමල්	ඩී වී එස් පෙරේරා
සභාපති	අධ්‍යක්ෂ ජනරාල්	අධ්‍යක්ෂිකා මුදල්

09. 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් වර්ගීකරණය කාර්‍ය පදනම මත විදහා පෑම

(මූල්‍ය ඒකකය - රුපියල්)

	2016	නැවත ප්‍රකාශිත 2015
අයභාරය		
අනෙකුත් රාජ්‍ය අස්තිත්වයන්ගෙන් හුවමාරු	231,025,150.00	209,954,373.00
විලම්භිත ආදායම්	53,879,815.61	39,230,133.16
අනෙකුත් අයභාරය	27,311,316.95	29,968,832.81
මුළු අයභාරය	312,216,282.56	279,153,338.97
වියදම්		
පරිපාලන පිරිවැය	237,527,385.28	231,142,402.86
අනෙකුත් වියදම්	20,738,992.04	10,314,061.28
ක්ෂය	59,600,362.75	39,889,214.21
මූල්‍ය වියදම	94,439.63	46,315.71
මුළු වියදම	317,961,179.70	281,391,994.06
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය)	(5,744,897.14)	(2,238,655.09)

10. 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(මුල්‍ය ඒකකය - රුපියල්)

	2016	නැවත ප්‍රකාශිත 2015
මෙහෙයුම් මත ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ අතිරික්තය/ඌනතාවය	(5,744,897.14)	(2,238,655.09)
මුදල් නොවන වෙනස්වීම		
ක්ෂයවීම්	59,600,362.75	39,889,214.21
අඩමාන ණය සඳහා වෙන් කිරීම්වල වැඩිවීම	(1,042,716.03)	(52,387.81)
විලම්භිත ආදායම් (වැඩිවීම/ අඩුවීම)	(53,879,815.61)	(39,230,133.16)
ගෙවිය යුතු වියදම් වල වැඩිවීම/ අඩුවීම	(7,913,454.27)	8,482,434.22
සේවක පිරිවැය (වැඩිවීම/ අඩුවීම)	(33,468.75)	19,143,127.50
දේපල හා යන්ත්‍රෝපකරණ විකුණුම් (ලාභ/පාඩු)	1,523,208.79	10,205.65
අනෙකුත් ජංගම වත්කම් (වැඩිවීම/ අඩුවීම)	15,730,337.84	(11,635,745.80)
ලැබීම්වල (වැඩිවීම/ අඩුවීම)	(12,138,229.59)	(6,232,386.55)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය	(3,898,672.01)	8,135,673.17
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
පිරියත හා උපකරණ මිළට ගැනීම්	(37,622,266.37)	(27,798,491.11)
පිරියත හා උපකරණ විකුණුම්	-	2,207.20
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	(37,622,266.37)	(27,796,283.91)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය		
ප්‍රාග්ධන ලැබීම්	31,114,964.00	31,798,897.00
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	31,114,964.00	31,798,897.00
මුදල් හා මුදල් සමාන වත්කම් වල ශුද්ධ (වැඩිවීම/අඩුවීම)	(10,405,974.38)	12,138,286.26
කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා සමාන දෑ	105,890,568.07	93,752,281.81
කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ	95,484,593.69	105,890,568.07

11. 2016.12.31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ වත්කම්/ ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

01.

මූල්‍ය ඒකකය (රු.)

	ආරම්භක ප්‍රාග්ධනය	රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන	භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් නොවන ප්‍රදානයන්	විලම්භිත ආදායම්	අනෙකුත් මාර්ග වලින් ලද ප්‍රාග්ධනය	යලි සැකසූ ප්‍රත්‍යාගණන සංචිතය	සමුච්චිත ලාභ/ අලාභය	මුළු ශුද්ධ ස්කන්ධය	2015.12.31 දිනට යලි සැකසූ ශේෂය
2015.01.01 දිනට ශේෂය	1,000,000.00	61,378,800.39	43,350,000.00	122,461,854.77	119,985,089.87	354,564,874.91	(227,945,095.85)	474,795,524.09	494,180,401.66
2015 වර්ෂයේ වත්කම් ස්කන්ධයේ වෙනස්කම්								-	
ලද ප්‍රාග්ධන ප්‍රදානයන්		31,798,897.00						31,798,897.00	43,026,477.00
වාහන ප්‍රදානයන්			7,975,000.00					7,975,000.00	9,500,000.00
විලම්භිත ආදායමට මාරු කල ප්‍රාග්ධන ප්‍රදාන		(37,053,671.62)		(2,176,461.54)				(39,230,133.16)	(53,806,701.25)
අනෙකුත් මාර්ග වලින් ලද ප්‍රාග්ධනය					28,568,545.00			28,568,545.00	
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය)							(2,238,655.09)	(2,238,655.09)	(17,016,180.49)
ප්‍රත්‍යාගනන සංචිත අතිරික්තය						180,710,956.92		180,710,956.92	(1,088,472.83)
2015.12.31 දිනට ශේෂය	1,000,000.00	56,124,025.77	51,325,000.00	120,285,393.23	148,553,634.87	535,275,831.83	(230,183,750.94)	682,380,134.76	474,795,524.09
<u>2016 වර්ෂයේ ස්කන්ධයේ වෙනස්කම්</u>									
ලද ප්‍රාග්ධන ප්‍රදානයන්		31,114,964.00						31,114,964.00	31,798,897.00
වාහන ප්‍රදානයන්			-					-	7,975,000.00
විලම්භිත ආදායමට මාරු කල ප්‍රාග්ධන ප්‍රදාන		(37,557,325.38)		(16,322,490.23)				(53,879,815.61)	(39,230,133.16)
අනෙකුත් මාර්ග වලින් ලද ප්‍රාග්ධනය					-			-	28,568,545.00
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය)							(5,744,897.14)	(5,744,897.14)	(2,238,655.09)
ප්‍රත්‍යාගනන සංචිත අතිරික්තය						-		-	180,710,956.92
2016.12.31 දින ඉදිරියට ගෙන ගිය ශේෂය	**1,000,000.00**	**49,681,664.39**	**51,325,000.00**	**103,962,903.00**	**148,553,634.87**	**535,275,831.83**	**(235,928,648.08)**	**653,870,386.01**	**682,380,134.76**

'ථානය

12. මූලික ගිණුම් ප්‍රතිපත්ති

1. පොදු තොරතුරු

ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, 1957 අංක 49 දරණ කාර්මික සංවර්ධන පනත යටතේ සංස්ථාපිත ආයතනයකි. මෙම මධ්‍යස්ථානය 2016 වර්ෂයේ සිට විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ පවත්වා ගෙන යනු ලබයි. මධ්‍යස්ථානයේ ලියාපදිංචි කාර්යාලය ජාඇල, ඒකල, කාර්මික ජනපදයේ අංක 2පී/17බී දරණ ලිපිනයෙහි පිහිටුවා ඇත.

ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම් ස්වභාවය

- ශ්‍රී ලංකාවේ නව සොයා ගැනීම් සහ නිර්මාණ කුසලතාවන්ට ධෛර්ය දීමෙන්ද, ඒවායේ සංවර්ධනයට ආධාර දීමෙන්ද, දේශීය තාක්ෂණය සංවර්ධනය සඳහා අවශ්‍ය ආයතනික ක්‍රම ඇති කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම
- සාමූහික ප්‍රයත්නයන් ඵලදායී අයුරින් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ විවිධ කර්මාන්තයන්හි සහ ආයතනයන්හි තාක්ෂණික ශිල්පීය ඉංජිනේරු සහ පර්යේෂණ කුසලතාවයන් ඒකාබද්ධ කිරීම පිණිස පහසුකම් සැළස්වීම.
- රටේ සම්පත් දායාදයන්ට සහ ජාතික ක්‍රම සම්පාදනයේ අරමුණු වලට අනුකූල වන තාක්ෂණික ශිල්පීය ක්‍රම උපයුක්ත කිරීමට සහ ඒවා යොදා ගැනීමට වගබලා ගැනීම
- අවශ්‍ය වූ විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි උචිත ආයතනයන්ට ඍජු ආකාරයෙන් සහ වක්‍ර ආකාරයෙන් තාක්ෂණික ශිල්පීය ක්‍රම මාරු කිරීමේ උපක්‍රම පරීක්ෂා කිරීම සහ ඒ ආයතනයන්ට උපදෙස් දීම.
- උචිත තාක්ෂණික ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීමෙන් රටේ මානුෂික හා ද්‍රව්‍යමය සම්පත් වලින් විශේෂයෙන්ම ශ්‍රම සහ අමුද්‍රව්‍ය සම්පත් වලින් උපරිම උපයෝජණය අත්කර ගැනීමට අනුබල දීම.
- කාර්මික, වාණිජ සහ වෙනත් අරමුණු සඳහා යන්ත්‍ර භාවිතා කරන්නන් විසින් ඉල්ලුම් කරනු ලැබූවිට ආදර්ශ යන්ත්‍ර සහ නියමු යන්ත්‍රාගාර අරපිරිමැස්මෙන් යුක්තව සැළසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරීක්ෂා කර බැලීම.
- ඉංජිනේරු ශිල්පීය සැළසුම් පර්යේෂණ පිළිබඳ තාක්ෂණික දත්තයන් සහ ලේඛණානයනය ජාත්‍යාන්තර හා ජාතික නියෝජිත ආයතනයන්ගේ සහයෝගයෙන් යුක්තව අඛණ්ඩව සමීක්ෂණය කිරීම සඳහා කටයුතු පිළියෙල කිරීම.
- රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි ව්‍යවසායනයට අඛන්ඩ උපදේශක සේවාවන් සැලසීම, රටේ ඉංජිනේරු සහ කාර්මික සැළසුම් පදනම මෙන්ම පර්යේෂණ හැකියාවන් පුළුල් කිරීම සඳහා පර්යේෂණ කටයුතු භාර ගැනීම සහ පුහුණු කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම.
- ඉහත කී කරුණු වලට අදාළ ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සහ සම්බන්ධ කාර්යයන් සඳහා විධිවිධාන සැලැස්වීම.

2. මූල්‍ය වාර්තා සාදන ලද පදනම

මෙහි සමන්විත මූල්‍ය ප්‍රකාශන මත මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශය,ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සාදා ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලවය.

ප්‍රවර්තන ගිණුම් වර්ෂය ලෙස සලකා ඇත්තේ 2016.01.01. සිට 2016.12.31 කාලපරිච්ඡේදයය.

2.2 භාවිතා කරන ලද පදනම්

මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශය,ස්කන්ධය වෙනස්වීම පිළිබද ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම හා ඓතිහාසික පිරිවැය සංකල්ප මත පදනම්වය.

2.3 ගණුදෙණු ක්‍රියාත්මක වූ හා ඉදිරිපත් කරන මූල්‍ය ඒකකය

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි පිළිබිඹු වන ගණුදෙණු සිදු කර ඇත්තේ හා ඉදිරිපත් කර ඇත්තේ මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයෙහි භාවිතා වන මූල්‍ය ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. එසේ නොවන අවස්ථාවකදී ඒ පිළිබඳ වෙනම දක්වා ඇත.

2.4 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ 2015.12.31 දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදයටය. මෙහිදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය,ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ගිණුම්කරණ සටහන් ප්‍රවර්ථන කාලපරිච්ඡේදය හා සැසදිය හැකි වනු ඇත.

2.5 වැදගත් ගිණුම්කරණ නිශ්චය කරලීම, ඇස්තමේන්තු හා උපකල්පනයන්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුව මූල්‍ය ප්‍රකාශන හා සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්ති, වත්කම්, වගකීම්, ආදායම්, අසම්භව්‍ය වගකීම් හඳුනාගැනීම් සම්බන්ධයෙන් කළමණාකරණ විනිශ්චය කරලීම් ඇස්තමේන්තුගත කරලීම හා උපකල්පනයන් භාවිතා කර ඇත. කෙසේ නමුත් උපකල්පනයන් හා ඇස්තමේන්තු සම්බන්ධයෙන් වන අවිනිශ්චිතතාවයන් මත ඉදිරිපත් කරන ලද වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක ගැලපීම් ඉදිරි කාලපරිච්ඡේදයක සිදු විය හැක. මෙහිදී මධ්‍යස්ථානයේ ඉදිරි අනාගත අඛණ්ඩ පැවැත්ම හා සම්පත් ප්‍රමාණාත්මකභාවය පිළිබඳව කළමණාකාරිත්වය නිසි ඇගයීමක පිහිටා ඇත. තවදුරටත් මධ්‍යස්ථානයේ පැවැත්ම පිළිබඳව බලපාන අවිනිශ්චිත තත්වයක් හෝ සැකයක් කළමණාකාරිත්වය වෙත නොමැත. මෙනිසා මූල්‍ය ප්‍රකාශ සාදා ඇත්තේ අඛණ්ඩ පැවැත්ම යන පදනම මතය.

3. දේපල හා පිරියත

3.1 හඳුනාගැනීම හා ඇගයීම

පිරියත ලෙස ගෙන ඇත්තේ ඍජුව මිළදී ගැනීම් සඳහා අදාල වන වියදම්ය. මධ්‍යස්ථානය විසින්ම ගොඩ නංවා ගනු ලැබූ වත්කම්වල පිරිවැය ලෙස ඒවායේ අභිලාෂගත අරමුණු ඉටුවන මට්ටම දක්වා දරණ ලද අමුද්‍රව්‍ය, ඍජු ශ්‍රමය හා අනෙකුත් ඍජුව හඳුනාගත හැකි වියදම් පිරිවැය ලෙස සලකනු ඇත. ප්‍රාග්ධන ප්‍රතිසංස්කරණ ගොඩනැංවීම් වලදී ගොඩනැගිලි ඉවත්කරලීම් පිරිවැය හා අදාල පරිදි ණය පොලී පිරිවැය ප්‍රාග්ධනිත කරනු ඇත. යම් ප්‍රාග්ධන භාණ්ඩයක අනුෂාංගික කොටසක් ලෙස මෘදුකාංග පවතින විට එම මෘදුකාංග පිරිවැය අදාල භෞතික උපකරණය සමඟම ප්‍රාග්ධනිත කෙරේ. ප්‍රාග්ධන භාණ්ඩවල අනුයුක්ත කොටස් සඳහා වෙන වෙනම වූ ඵලදායී ජීවිත කාලයක් ඇති අවස්ථාවකදි එම භාණ්ඩයන් වෙන වෙනම හඳුනා ගැනේ. ස්ථාවර වත්කම් බැහැර කරලීමේ දී ජනිත වන ලාභ හෝ අලාභ හඳුනා ගැනෙන්නේ එම වත්කමේ විකුණුම් මිළ හා පොත්වල ඇති ශුද්ධ අගය සැසඳීමෙනි. මෙම උපලබ්ධි ලාභය/අලාභය අමතර ආදායම් හෝ අමතර වියදම් ලෙස හඳුනා ගැනේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් හරලන අවස්ථාව වන විටදී ඒ හා අදාල අගයක් ප්‍රත්‍යාගණන සංචිතය තුල පවතින්නේ නම් එය ඉදිරියට ගෙනා ලාභාලාභ ශේෂය සමග ගැලපේ.

3.2 ප්‍රත්‍යාගණනය

වත්කම් ප්‍රත්‍යාගණනය කරලීමේදි අදාල මුලු වත්කම් කාණ්ඩයම ප්‍රත්‍යාගණනය කෙරේ. ඒ තෝරා ගත් කොටස් පමණක් ප්‍රත්‍යාගණනය කරලීමෙන් වැළකීමට හා වත්කම් කොටසක් පිරිවැයට පැවතීමෙන් ඇතිවන මිශ්‍රණයෙන් වැලකීමටය.

වත්කම්වල සාධාරණ අගය ගනු ලබන අවස්ථාවකදි වෙළඳපල තොරතුරු පදනම්කර ගනී. එසේ සාධාරණ අගය තීරණය කරනු ලබන්නේ වත්කම් අගය කරලීමට වෘත්තීය නිපුණතාවයකින් යුක්ත වූ කමිටුවක් මගිනි.

ප්‍රත්‍යාගනණයකදි යම් වත්කමක අගය වැඩිවන්නේ නම් එම වැඩිවීම සෘජුවම ප්‍රත්‍යාගනන අතිරික්ත ගිණුමට බැර කරනු ඇත.

ප්‍රත්‍යාගනණයක ප්‍රතිඵලයක් ලෙස වත්කම් පංතියක අගයක් අඩු වූ කල්හි මෙම අගය අඩුවීම ප්‍රත්‍යාගණන සංචිතයට ගැලපීම, මෙම වත්කම් පංතියේම පූර්වයෙහි ඇති වුනාවූ අතිරික්තයක සීමාව දක්වා සිදු කෙරෙනු ඇත.

ප්‍රත්‍යාගනන යකදි ඇතිවන්නාවූ අතිරික්තයන් හා ඌනතාවයන් එකිනෙකට හිලව් කරලීම එම වත්කම් පංතියෙහිම වත්කම් අතර පමණක් සිදු කරන අතර එම පංතියට අයත් නොවන වත්කම් වලින් ගලපනු නොලැබේ.

3.3 **ක්ෂය කරලීම**

වත්කම් ක්ෂය කරලීම වත්කම් වල පිරිවැයෙන් සුන්බුන් අගය අඩු කරලීමෙන් අනතුරුව එන අගය මත පදනම් වනු ඇත. යම් වත්කමක් සංයුතියෙහි ඇති ප්‍රමාණාත්මක වැදගත් අංශයන්හි ප්‍රයෝජනවත් ජීවිත කාලය විවිධ වන අවස්ථාවලදී ඒවා වෙන වෙනම ක්ෂය කරලීමට භාජනය කරනු ඇත. වත්කම් වල ක්ෂය ඒවායේ ඇස්තමේන්තුගත ජීවිත කාලය තුල ලාභාලාභ ගිණුමෙහි පෙන්වනු ඇත. සලකා බලන වර්ෂයේදී හා පසුගිය වර්ෂයේදී මෙම ඇස්තමේන්තුගත අනුපාතයන් පහත පරිදිය.

වත්කම් කාණ්ඩය	**ක්ෂය%**
ගොඩනැගිලි	2.5
කාර්යාල උපකරණ	15
උපකරණ	15
ප්‍රදර්ශන භාණ්ඩ	15
පරිඝණක යන්ත්‍ර	33 1/3
රථ වාහන	15
ලී බඩු උපකරණ	10
යන්ත්‍රෝපකරණ සහ විද්‍යාගාර පහසුකම්	15
පුස්තකාල පොත්	05
යටිතල පහසුකම්	15
මෘදුකාංග	33 1/3

3.4 පොත්වලින් ඉවත්කරලීම

වත්කමක අගය පොත්වලින් ඉවත්කරලීම එහි අනාගත ඇස්තමේන්තුගත ප්‍රතිලාභ නොමැති විටදී හෝ එය ඉවත් කරනු ලබන විටකදී සිදු කරනු ඇත. වත්කම් බැහැර කරන අවස්ථාවකදී සිදුවන ලාභ හා පාඩු, වත්කම් වල විකුණුම් අගය හා ශුද්ධ අගය අතර වෙනස සැසදීමෙන් ගන්නා අතර එය මෙහෙයුම් වාර්තාවන්හි අනෙකුත් ආදායම් යටතේ දක්වනු ඇත.

3.5 අස්පෘශ්‍ය වත්කම්

මධ්‍යස්ථානය විසින් අත්පත් කරගන්නා ලද නිශ්චිත ජීවන කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් අගය කරනු ලබන්නේ පිරිවැයෙන් ඒවායේ සම්පූර්ණ හායනය හා මුලු අගය අඩුවීම්ද ගැලපීමෙනි. අනතුරුව ලැබෙන වියදම් ප්‍රාග්ධනිත කරනු ලබන්නේ එම වියදම නිසා අදාල අස්පෘශ්‍ය වත්කමෙහි අනාගත ප්‍රතිලාභ ලැබීම වර්ධනය වන ස්වරූපයක් ඇති නම් පමණි. හායනය කරනු ලබන්නේ පිරිවැය හා අන්ත අගය අතර වෙනසටය. හායනය අගය මෙහෙයුම් ප්‍රකාශයන්හි සරල මාර්ග ක්ෂය ක්‍රමයට අදාල අනුපාතය මත පෙන්නුම් කෙරේ. හායනය කරනු ලබන්නේ අස්පෘෂ්‍ය වත්කම මධ්‍යස්ථානයේ භාවිතයට ගත් දින සිටය. අස්පෘෂ්‍ය වත්කමෙහි ඇස්තමේන්තුගත අනුපාතයන් හා හායන වර්ෂයන් පහත පරිදිය.

- **මෘදුකාංග - 33 1/3 %**

හායන වර්ෂයත්, ඵලදායී ජීවිත කාලය හා අන්ත අගය සෑම කාලපරිච්ඡේදයකදීම සමාලෝචනය කරනු ඇත.

4. තොග

තොග අගය කර ඇත්තේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අවමය සලකාය. තොග පිරිවැය FIFO තොග නිකුත් කරලීමේ මූලධර්ම මත පදනම්ව ඇත. තොගයන් වර්තමාන ස්ථානයට හා තත්වයට ගෙන ඒම සඳහා දරනු ලැබූ වියදම් ඒවායේ පිරිවැය ලෙස ඇත.

5. ලැබිය යුතු වෙළඳ ශේෂ

වෙළඳ ශේෂ ප්‍රථමයෙන්ම සාධාරණ අගය මත පදනම්ව හඳුනා ගැනේ. අනතුරුව ඵලදායී පොලී අනුපාතය මත අගය හීනවීම වට්ටම් කරලීම හා අගය පිරිහීම මත වෙන් කරලීමක්ද කරනු ලැබේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්හි මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනා ගනු ලබන්නේ අතැති මුදල්, බැංකු මුදල්, තාවකාලික කැඳවුම් තැන්පතු හා රාජ්‍ය ආයතනවල අතිරික්ත තැන්පතු ගිණුම්ය.

7. දෙන ලද ණය හා ලැබිය යුතු ගිණුම්

යම්කිසි ස්ථාවර හෝ නිශ්චිත ගෙවීම් සිදු කරන හා වෙළඳපොල තුල සංසරනය නොවන ණය දීම් මුලින්ම සාධාරණ අගය මත පදනම්ව හඳුනා ගැනෙනු ඇත.

8. මූල්‍ය වගකීම්

ව්‍යුත්පන්නයන් නොවන මූල්‍යමය වගකීම් අනෙකුත් මූල්‍යමය වගකීම් ලෙස හඳුනා ගැනේ. මෙම අනෙකුත් මූල්‍යමය වගකීම් ලෙස නියෝජනය වන්නේ වෙළඳ ගෙවිය යුතු ගිණුම් හා සම්බන්ධිත පාර්ශවයනට (related parties) කල යුතු ගෙවීම්ය. මෙම වගකීම් ප්‍රථමයෙන්ම හඳුනාගනු ලබන්නේ සාධාරණ අගයට යම් සෘජුව හඳුනාගත හැකි පිරිවැය ගැලපීමෙනි. මූල්‍ය තත්ව ප්‍රකාශනයේදී මූල්‍ය වගකීම් හා මූල්‍ය වත්කම් එකිනෙකට හිලව් කර පෙන්වනු ලබන්නේ මධ්‍යස්ථානයට ඒ සඳහා නීතිමය අයිතියක් පවතින්නේ නම් පමණි.

9. **සේවක ප්‍රතිලාභ වගකීම්**
සේවය හැරයාමේ ප්‍රතිලාභ

සේවය හැරයාමේදී ගෙවනු ලබන ප්‍රතිලාභ ව්‍යවස්ථාපිතව දක්වා ඇති පරිදි සිදු කර ඇත. සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා මධ්‍යස්ථානයේ දායකත්වය පිළිවෙලින් 15% හා 3% ක් වේ. 1983 අංක 12 දරණ පනත ප්‍රකාරව පාරිතෝෂික වෙන් කර ඇත. පාරිතෝෂික වෙන්කරලීම සඳහා මහා භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන සපයනු ලැබේ. මෙම පාරිතෝෂික වෙන්කරලීම පහත පරිදි ගනනය කෙරේ. (අවසන් වරට ගත් මූලික වැටුප + ජීවන වියදම් දීමනාව) x (සපුරා ඇති වර්ෂ ගණන /2)

10. වෙන්කරලීම්

මින් නියෝජනය වන්නේ අතීතයේදී ඇතිවුනු සිද්ධියක් මත මධ්‍යස්ථානය වෙත වර්තමානයේදී හඳුනාගත හැකි නීතිමය හෝ ඵලදායි ස්වරූපයේ බැදීම් මත විශ්වාසනීයව පූර්වකථනය කරගත හැකි අනාගත මූල්‍ය පිටතට ගලා යාමිය.

11. **වෙන්කරලීම්, අසම්භාව්‍ය වත්කම් හා අසම්භාව්‍ය වගකීම්**

ශේෂපත්‍ර දිනට මධ්‍යස්ථානය වෙත ඇති ප්‍රමාණය ඇස්තමේන්තු කර ගත හැකි, අනාගත සම්පත් පිටව යාමක් විය හැකි බැදියාවන් සඳහා වෙන් කරලීම් තබනු ඇත. අසම්භාව්‍ය වගකීම් සඳහා ශේෂ පත්‍රයේ සටහන් ලෙස දක්වා ඇත.

12. ආදායම් හඳුනා ගැනීම

යම්කිසි ආදායමක් විශ්වාසවන්තව ගණනය කලහැකි නම් හා ඊට අදාල ආර්ථික ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා මධ්‍යස්ථානය වෙත හැකියාවක් ඇති අවස්ථාවේදී ආදායම් හඳුනා ගැනේ. ලැබී ඇති හා ලැබීමට ඇති අගයන්ගේ සාධාරණ අගයට වට්ටම් හා බදු ඉවත් කරලීමෙන් ආදායම් හඳුනා ගනී. ආදායම් හඳුනා ගැනීමේදී පහත දැක්වෙන විශේෂ ලක්ෂණයන් පදනම් කරගෙන ඇත.

a) සංවර්ධිත තාක්ෂණයන් විකිණීම

අදාල තාක්ෂණයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මකව ප්‍රතිලාභයේ හා අවදානමේ හිමිකාරිත්වයේ අයිතිය මාරු වීම සිදුවන අවස්ථාවේදී ආදායම හඳුනා ගනී. පවරනු ලැබූ තාක්ෂණයන් සම්බන්ධයෙන් පසු කාලීන කළමණාකාරිත්ව හෝ පාලන මැදිහත් වීමක් මධ්‍යස්ථානය දරණු නොලැබේ.

b) සේවා සැපයිම

සේවා ආදායම හඳුනාගනු ලබනුයේ අදාල සේවාව ජනනය වූ හෝ කරනු ලැබූ කාල පරිච්ඡේදයටය.

c) කොන්ත්‍රාත්තු ආදායම

කොන්ත්‍රාත්තුවක ආදායම එහි සමස්ථ ප්‍රතිඵලය විශ්වාසනීයව අගය කල නොහැකි විටකදී කර ඇති වැඩ ප්‍රතිශතය මත ලබා ගනී.

d) <u>බදු</u>

ව්‍යවස්ථාපිතව මධ්‍යස්ථානය ගෙවිය යුතු වන එකතු කල අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු යනාදිය මෙහිදී දක්වා ඇත.

e) <u>පොලී ආදායම</u>

උපචිත වන අවස්ථාවේදී පොළී ආදායම හඳුනා ගනී.

f) <u>ජංගම නොවන වත්කම් බැහැර කරලීමෙන් ලාභ හා අලාභ</u>

ජංගම නොවන වත්කම් වල විකුණුම් මිලෙන් එම වත්කම් වල ශුද්ධ පොත් අගය හා ඒවා බැහැර කරලීමට කරනු ලබන අනෙකුත් වියදම් ද අඩු කරලීමෙන් පසු ලැබෙන ප්‍රතිඵලය ආදායම ප්‍රකාශනයට ගනු ලැබේ. තවද ප්‍රමාණාත්මක වශයෙන් අඩු අගයකින් සමන්විත ජංගම නොවන වත්කම් වල ඉවත් කරලීම එකිනෙකට වෙන වෙනම නොව පොදුවේ ශුද්ධ අගය දක්වනු ලැබේ.

g) <u>අනෙකුත් ආදායම්</u>

අමතර ආදායම් ලෙස තාක්ෂණික පැවරුම් කටයුතු වල ශුද්ධ ලාභය, කැඳවුම් තැන්පතු හා බැඳුම්කර පොලී ආදායම කාල ප්‍රමාද දඩ මුදල්, ලබා දී ඇති ණය වලට පොලී, නැවත නොගෙවන තැන්පතු, සැපයුම්කරුවන් ලියාපදිංචි කරලීම, සුළු ආදායම්, හානි වූ තොග විකුණුම්, ජංගම නොවන වත්කම් බැහැර කරලීම් ආදායම හා පොදු කාර්ය අයකර ගැනීම ආදිය ඇතුලත් වේ.

h) <u>විලම්භිත ආදායම</u>

රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් අත්පත් කර ගන්නා ජංගම නොවන වත්කම් වලට අදාල ක්ෂය වෙන් කරලීම් වලින් විලම්භිත ආදායම සමන්විත වේ.

12. <u>ප්‍රදානයන්</u>

ප්‍රදානයන් ලෙස ආදායම් ප්‍රකාශන වල දක්වනු ලබන්නේ ලැබීම සඳහා සාධාරණ සහතික වීමක් ඇති හා ලබා ගැනීම උදෙසා මධ්‍යස්ථානය විසින් සියළුම කොන්දේසි සපුරා ඇති විටකදිය. ප්‍රදානයන් ලැබීමේදී එය අදාල කාල පරිච්ඡේදයේදි ආදායමක් ලෙස සලකා එමගින් ආවරණය වන වියදම් සමඟ ගලපා ඇත. යම්කිසි ස්ථාවර වත්කමක් ලබා ගැනීම සඳහා අදාල වන පරිදි ලැබී ඇති ප්‍රදානයන් මත විලම්භිත ආදායම් ගණනය කෙරේ. මධ්‍යස්ථානයට මූල්‍ය නොවන ප්‍රදානයන් ලැබීමේදී සාධාරණ අගය මත ගණනය කරනු ලැබේ.

13. <u>වියදම්, ආදායම් ප්‍රකාශනයන්හි ඉදිරිපත් කරලීම</u>

ආදායම් ප්‍රකාශන වලදි ආදායමට අදාලව ජනනය වී ඇති වියදම සමඟ ගලපා ඇත. මධ්‍යස්ථානයේ එදිනෙදා කටයුතු පවත්වා ගෙන යාමේ වියදම්, ජංගම නොවන වත්කම් වලට සම්බන්ධ ක්ෂය වැනි ආදායමට එරෙහිව ගොඩනැගෙන්නා වූ වියදම සලකනු ඇත.

14. පර්යේෂණ හා සංවර්ධන වියදම

පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා ප්‍රමුඛතම මූල්‍යකරණය භාණ්ඩාගාරය මගින් ඉටු කෙරේ. පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතියක් යම් සේවාදායකයෙකු විසින් මූල්‍යකරණය තරනු ලබන විට එහි පිරිවැයට එරෙහිව ආදායමක් ලෙස සටහන් කරනු ඇත. පිරිවැය ලෙස සෘජු පිරිවැය පමණක් සලකනු ඇත.

15. පර්යේෂණ සඳහා ත්‍යාග උදෙසා වෙන් කරලීම්

මධ්‍යස්ථානයේ පර්යේෂණයන් සඳහා ලැබුණා වූ ත්‍යාගයන් අදාල පර්යේෂණ ඉංජිනේරුවරුන් අතර පහත පරිදි බෙදා හැරලීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත.

a ත්‍යාගයන් ලැබීම සඳහා අදාල වූ පර්යේෂණයන් සඳහා සෘජුවම දායක වූ පර්යේෂණ ඉංජිනේරුවරුන් අතර එම ත්‍යාගයෙන් 60% ක ප්‍රමාණයක් බෙදා හැරීම. මේ සඳහා පර්යේෂකයන් ලෙසට අදාල ත්‍යාගය සඳහා අයදුම් කරනු ලැබූ පර්යේෂණ ඉංජිනේරුවරුන් තෝරා ගැනේ.

b. මෙම අගය බෙදා හරිනු ලබන්නේ අදාල ත්‍යාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසන් දින පැවති වැටුප් මත පදනම්වය.

c. මෙම ත්‍යාග පිරිනැමීම් ක්‍රමවේදය අතීත ප්‍රදානයන් හා අනාගත ප්‍රදානයන්ට යන දෙකටම අදාල වේ.

d. අතීත ත්‍යාගයන් සඳහා පිරිනැමීම් කරනු ලබන්නේ ඒවා පිරිනමන දින වන විට මධ්‍යස්ථානයේ සිටින්නා වූ පර්යේෂකයන්ට පමණි. (නමුත් ගණනය කරලීම සඳහා සියළුම කණ්ඩායම් සාමාජිකයන් සලකා බලනු ලැබේ.)

e. සේවයේ නොසිටින සේවකයන්ට හිමි කොටස හා ඉතිරි 40% ක ප්‍රමාණය නර්ඩ් මධ්‍යස්ථානයේ ඉදිරි පර්යේෂණ සංස්කෘතික දියුණුවට යොදා ගන්නා බව සභාපති තුමා අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දී ඇත.

13. 2016.12.31 දිනට ගිණුම්කරණ සටහන්

පූර්ව වර්ෂ ගැලපීම (අගය - රුපියල්)

අංකය යොමුව	විස්තරය	මෙහෙයුම් ප්‍රතිඵලයට වන බලපෑම		මූල්‍ය තත්තවයට බලපෑම
		2015	2015 වර්ෂයට පෙර	
1.1	RED/COM/2/95/14 2014 වර්ෂයේ විකුණු පසු සේවා අධිවෙන්කරලීම 2014/12/31දිනට ගැලපීමෙන් පසු අගය ආදායම: 537,200.00 537,200.00 පිරිවැය : 437,775.06 432,775.06 ශුද්ධ ලාභය 99,424.94 104,424.94		5,000.00	වගකීම් අඩුවීම
1.2	CIVIL/COM/86/11 පෙන්වා දුන් අඩුපාඩු පිලිසකර නොකිරීම මත පොලොන්නරුව කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවාගත් මුදල අත්හිටුවීම		300,755.00	වගකීම් අඩුවීම
1.3	දිරි දීමනා අධි වෙන්කරලීම - 2015	438,698.98		වගකීම් අඩුවීම
1.4	CIVIL/COM/86/11 කැබිනට් මණ්ඩල අනුමත අනුපාත කමිටුවකින් ලද අනුපාතික සංශෝධන මත ඇස්තමේන්තුගත වැඩ අගය වෙනස් වීම		(1,912,770.73)	ණයගැතියන් අඩුවීම
1.5	DFCI/COM/119/14- පිරිවැයේ අධිවෙන් කරලීම නිවැරදි කිරීම ශ්‍රම පිරිවැය 25,872.00 පොදු කාර්ය පිරිවැය 9,055.20 යාන්ත්‍රික පිරිවැය 49,780.00		(84,707.20)	කෙරීගෙන යන වැඩ අගය අඩු වීම
1.6	වර්ගීකරණ නිවැරදි කරලීම හා ක්ෂය වෙන්කරලීම් බලපෑම ගොඩනැගිලි ඌන වෙන්කරලීම = රු.1,656,030.81 ගොඩනැගිලි අනෙක් මූලාශ්‍ර මත ඌන වෙන්කරලීම = රු. 3,611.40 යටිතල පහසුකම් ඌන වෙන්කරලීම = රු.1,815,988.67 පුස්තකාල පොත් ඌන වෙන්කිරීම = රු.1,187,281.78		(1,656,030.81) (3,611.40) (1,815,988.67) (1,187,281.78)	සමුච්චිත ක්ෂය වැඩිවීම

1.7	CIVIL/COM/103/15 – ආදායම් ඌන වෙන්කරලීම - රු. 8,521.74 2014/12/31දිනට ගැලපීමෙන් පසු අගය ආදායම: 167,747.75 176,269.49 පිරිවැය : 114,500.00 114,500.00 ශුද්ධ ලාභය 53,247.75 61,769.49	8,521.74		ණයගැති වැඩිවීම
1.8	කුසලතා වැඩිකිරීම සඳහා ලැබීම් රු.3,918,417.00 2015 වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵල වාර්තාවේ ආදායම් යටතේ ගලපා ඇත.	3,918,417.00		ශුද්ධ වත්කම් ඉහල යෑම
1.9	APH/COM/3//79/14 – වියදම් සඳහා ඌන වෙන්කරලීම 014/12/31දිනට ගැලපීමෙන් පසු අගය ආදායම: 3,505,829.50 3,505,829.50 පිරිවැය : 2,706,830.96 2,692,406.55 ශුද්ධ ලාභය 798,988.54 813,422.73		14,424.41	ශුද්ධ වත්කම් ඉහල යෑම
1.20	2015 වර්ෂයේ රු.4,820.73 ක් වටිනා හොඳ තොග චලනය නොවන තොග ලෙස සැලකීම	4,820.73		තොග මට්ටම පහල යාම
1.21	ආපසු ලැබුණ භාණ්ඩ ලිපිද්‍රව්‍ය ගිණුමට මාරු කිරීම	15.00	106.00	ශුද්ධ වත්කම් ඉහල යෑම
1.22	RED/COM/106/2013 කෙරීගෙන යන වැඩ අධිගණනය		(34,050.00)	කෙරීගෙන යන වැඩ අඩුවීම
1.23	ELE//COM/6/55/2014 ආදායම් අධි ගණනය		(167,800.00)	ගණුදෙනුකාර අත්තිකාරම් අඩුවීම
1.24	RED/COM/121/14 2015 කෙරීගෙන යන වැඩ අඩුවෙන් තක්සේරු කිරීම	314,558.56		කෙරීගෙන යන වැඩ වැඩිවීම

2. සුරක්ෂිතයන් ලෙස තබන ලද ඇප තැන්පතු

ඇපකරය නිකුත් කරන ලද්දේ	ඇප අංකය/දිනය	සුරක්ෂිත ලෙස තබා ඇති සහතිකය	සුරක්ෂිතයෙහි වටිනාකම	බැංකුව	ඇප අගය
ටොයෝටා ලංකා පුද්ගලික සමාගම	Bank Guarantee - 15/2008-18/12/2014	C/33734579-507908	100,000.00	ලංකා බැංකුව ජාඇල	75.000.00

3. තාවකාලික කැඳවුම් තැන්පතු

සේවයෙන් ඉවත් වූ සේවකයින් විසින් ගෙවන ලද බැඳුම්කර වටිනාකම රු.8,994,089.90 ක් වූ අගය 2012/07/30 වන විට ලංකා බැංකුවේ රාජ්‍ය ආයතන වල තාවකාලික අතිරික්ත අරමුදලෙහි තැන්පත් කර තිබුණි. ඒ මගින් ඉපයූ ලාභාංශ සහ පොළිය ඇතුලුව රු.11,467,716.93 දක්වා ආයෝජනයේ වටිනාකම ඉහල ගොස් ඇත.

ගණුදෙනුකරුවන්ගෙන් ලැබුණා වූ අත්තිකාරම් තාවකාලික කැඳවුම් තැන්පතු ලෙස අදාල කාර්ය සඳහා උපයෝගී කර ගන්නා තෙක් රඳවා තිබුණි. මේවායින් ලැබුණාවූ පොළී ආදායම අනෙකුත් ආදායම් ලෙස දක්වා තිබුණි.

4. **බලශක්ති හා පාරිසරික කළමණාකරන අංශයේ ඇති වූ ගින්නෙන් සිදු වූ පාඩුව කපා හැරීම**

වායු සමනය යන්ත්‍රයක සිදුවන ලද විදුලි කාන්දුවක් නිසා 2016/04/05 දින බලශක්ති හා පාරිසරික කළමණාකරන අංශයේ ගින්නක් හට ගන්නා ලදි.

ඒ සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

* ජාඇල පොලීසියට පැමිණිලි කරලීම
* අධ්‍යක්ෂ ජනරාල් විසින් කමිටු 02 ක් පත්කරලීම
* සිද්ධිය සම්බන්ධයෙන් සම්පූර්ණ පරීක්ෂණයක් පැවැත්වීම
* අලාභය තක්සේරු කරලීම

<u>සිදු වූ පාඩුව</u>

වත්කම්වල පිරිවැය	රුපියල්
විදුලි පද්ධතියට වූ අලාභය	351,830.00
ගොඩනැගිල්ලට වූ අලාභය	1,051,650.00
විදුලි උපකරණ	165,416.67
උපාංගයන්	151,000.00
ලීබඩු හා සවිකරලීම්	95,665.00
පරිඝනක හා වෙනත්	10,000.00
	1,825,561.67
අඩුකලා :- සමුච්චිත ක්ෂය	(302,352.88)
	1,523,208.79

<u>සුළු ආම්පන්න සඳහා වූ අලාභය</u>

වීදුරු බඩු	8,182.78

ස්ථාවර වත්කම් ලේඛණයෙන් ඉවත් කරන ලද වත්කම්

Asset Code	Description	Category	Dept.	Date	Rate	Cost	Depreciation for the 2016	Cumulative Depreciation a up to disposal	Profit/(Loss)
FA0005203	Emc Building (Revaluation 31/12/2007)	BU	EMC	04/05/16	3	1,386,380.00	9,020.97	286,581.84	(1,099,798.16)
FA0002175	IR Colour SD Camera,HD Camera,8Channel Dual (Cctv)	OE	COM	04/05/16	15	17,100.00	667.60	667.60	(16,432.40)
FA0002484	21 Colour T V No 1- 25333.33"	OE	EMC	04/05/16	15	27,000.00	1,054.11	1,054.11	(25,945.89)
FA0002400	Vacuum Cleaner A - 2004 (Wet/Dry)	OE	EMC	04/05/16	15	11,000.00	429.45	429.45	(10,570.55)
FA0002142	Air Conditioner Split Type 36000	OE	EMC	04/05/16	15	112,416.67	4,388.87	4,388.87	(108,027.80)
FA0002272	Wall Fan 16 Kdk"	OE	EMC	04/05/16	15	5,000.00	195.21	195.21	(4,804.79)
FA0002273	Wall Fan 16 Kdk"	OE	EMC	04/05/16	15	5,000.00	195.21	195.21	(4,804.79)
FA0002274	Wall Fan 16 Kdk"	OE	EMC	04/05/16	15	5,000.00	195.21	195.21	(4,804.79)
FA0003558	High Temperature Probe Nos. 2, Thermocouple Thermometer No.1	EQ	EMC	04/05/16	15	115,000.00	4,489.73	4,489.73	(110,510.27)
FA0003047	Stop Watch	EQ	EMC	04/05/16	15	2,000.00	78.08	78.08	(1,921.92)
FA0003038	Impressure Meter 0-5 Ps C9505/190	EQ	EMC	04/05/16	15	22,000.00	858.90	858.90	(21,141.10)
FA0003022	Pressure Gauge 0.15 Bar, No 1 - 3656.25	EQ	EMC	04/05/16	15	3,000.00	117.12	117.12	(2,882.88)
FA0003023	Pressure Gauge 0.30 Bar, No 1 - 3656.26	EQ	EMC	04/05/16	15	3,000.00	117.12	117.12	(2,882.88)
FA0003282	Desicator 300Mm 12 Wheel Brand	EQ	EMC	04/05/16	15	6,000.00	234.25	234.25	(5,765.75)
FA0001792	Laboratory Stool (China)	FU	EMC	04/05/16	10.00	3,000.00	78.08	78.08	2,921.92
FA0001793	Laboratory Stool (China)	FU	EMC	04/05/16	10.00	3,000.00	78.08	78.08	2,921.92
FA0001505	Wall Cupboard Upper Floor (Lf 23.08)	FU	EMC	04/05/16	10.00	42,000.00	1,093.15	1,093.15	40,906.85
FA0001499	MDF Cupboard, NOS.4	FU	EMC	04/05/16	10.00	40,665.00	1,058.40	1,058.40	39,606.60
FA0001507	Cupboard 36 30"	FU	EMC	04/05/16	10.00	7,000.00	182.19	182.19	6,817.81
FA0000080	Intel Pentium Computer	CM	EMC	04/05/16	10.00	10,000.00	260.27	260.27	9,739.73
						1,825,561.67	24,792.01	302,352.88	(1,317,379.16)

4. වර්ෂය තුල මධ්‍යස්ථානයේ වාහන අනතුරු

වාහන අංකය	අනතුර වූ දිනය	ඇස්තමේන්තු ගත මුදල	රක්ෂණ නියොජිත	හානිපූරනය		
				භාරදුන් දිනය	වටිනාකම රු.	භාරගත් දිනය
62-4004	2016/11/ 17	164,000.00	NITF	2017/01/11	මෙතෙක් තීරණයක් නැත	
KX-7908	2016/11/10	58,647.70	SLIC	2016/12/30	58,647.69	2017/01/20
301-3740	2016/12/22	82,350.00	NITF	මෙතෙක් තීරණයක් නැත	මෙතෙක් තීරණයක් නැත	

5. බොල්ණය වෙන් කරලීම

බොල්ණය වෙන් කර ඇත්තේ පොලී අනුපාතය 11.81% ලෙස උපකල්පිතය

ණයගැති ආයතනය	මුදල	බොල් ණය වෙන් කරලීම
තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය	6,553,446.40	
ප්‍රාදේශීය සභාව, කළුතර	5,965.00	
හේලීස් ෆැබ්රික් ආයතනය	12,782.00	
ශික්ෂණ රෝහල, කුරුණෑගල	862,920.00	
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව	3,545,336.70	
කර්මාන්ත දෙපාර්තමේන්තුව	422,747.00	
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව	1,169.57	
වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය	46,023.17	
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය	1,368,236.73	
නගර සභාව, අම්බලන්ගොඩ	420,964.29	44,599.26
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට	70,435.00	7,462.27
ශික්ෂණ රෝහල, අනුරාධපුර	304,217.14	61,046.18
එකතුව	13,614,243.00	113,107.71

2017 වාර්තාකල දිනය දක්වා අයකර ගෙන ඇති ණයගැති ශේෂයන් හට බොල්ණය වෙන්කරලීම් සිදුකර නොමැත.

6. 2016 වර්ෂය තුල කපා හරින ලද ණයගැති ශේෂ

ණයගැති ආයතනය	මුදල	අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංකය	දිනය
හිරියාල ආර්ථික මධ්‍යස්ථානය	637,056.40	5-2016,3.2	2016/06/28
කාර්මික තාක්ෂණ ආයතනය	316,342.86	3-2016,3.2	2016/03/23
ඒ ඊ ප්‍රදීප් , "සංජීව නිවස"	7,200.00	5-2016,6.3	2016/06/28
ලක්ලිය කාන්තා ගොවි සංවිධානය	60,171.42	4-2016,3.8	2016/05/18
තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය	104,968.29	5-2016,6.3	2016/06/28
එස් එම් අෂාම්	42,048.83	9-2016,4.1	2016/10/25

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සටහන්

Figures in Rs.

	2016	2015
01. මෙහෙයුම් මත ක්‍රියාකාරකම් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
ලැබීම්	57,985,333.07	66,444,541.38
ප්‍රවර්තන හා පර්යේෂණ ලැබීම්	231,025,150.00	209,954,373.00
පොලිය ලැබීම්	4,904,542.35	3,975,587.71
අනෙකුත් ලැබීම්	1,716,378.23	1,073,498.79
ගෙවීම්		
සේවක පිරිවැය	(190,684,509.32)	(173,377,977.53)
විශ්‍රාම වැටුප්	(6,498,572.75)	(2,664,694.66)
සැපයුම්	(78,776,793.81)	(75,377,777.74)
අනෙකුත් ගෙවීම්	(23,570,199.78)	(21,891,877.78)
මෙහෙයුම් ක්‍රියා කාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය	(3,898,672.01)	8,135,673.17
ආයෝජන මගින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
පිරියත හා උපකරණ මිළට ගැනීම්	(37,622,266.37)	(27,798,491.11)
පිරියත හා උපකරණ විකුණුම්	-	2,207.20
ආයෝජන ක්‍රියා කාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	(37,622,266.37)	(27,796,283.91)
මූල්‍ය කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
ප්‍රාග්ධන ලැබීම්	31,114,964.00	31,798,897.00
මූල්‍ය ක්‍රියා කාරකම් වලින් වූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	31,114,964.00	31,798,897.00
මුදල් හා මුදල් සමාන වත්කම් වල ශුද්ධ (වැඩිවීම /අඩුවීම)	(10,405,974.38)	12,138,286.26
කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා සමාන දෑ	105,890,568.07	93,752,281.81
කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ	95,484,593.69	105,890,568.07

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සටහන

2. මුදල් නොවන ගණුදෙනු

(අගය - රුපියල්)

	2016	2015
භාණ්ඩාගාරයෙන් වාහන ලැබීම	-	7,975,000.00
	-	7,975,000.00

3. මුදල් හා සමාන වත්කම්

ජංගම ගිණුම් අංක 404949 ලංකා බැංකුව ජාඇල ශාඛාව	2,173,287.47	392,345.92
ජංගම ගිණුම් අංක 405005 ලංකා බැංකුව ජාඇල ශාඛාව	106,284.36	159,300.51
ජංගම ගිණුම් අංක 404956 ලංකා බැංකුව ජාඇල ශාඛාව	429,001.16	904,924.84
ජංගම ගිණුම් අංක 1667 ලංකා බැංකුව, ආයතන ශාඛාව	1,222,056.52	2,140,477.33
අතැති මුදල්	91,473.87	1,055,802.54
තාවකාලික කැඳවුම් තැන්පතු - ජාඇල ශාඛාව	39,800,000.00	55,770,000.00
තාවකාලික කැඳවුම් තැන්පතු - ආයතන ශාඛාව	39,500,000.00	34,000,000.00
රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදල	12,162,490.31	11,467,716.93
	95,484,593.69	105,890,568.07

14. 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීඊසී/බී/එන්ඊආර්ඩීසී/1/16/46 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 සැප්තැම්බර් 24 දින

සභාපති,

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 29 වගන්තියේ 2 උප වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් මධ්‍යස්ථානයේ සභාපති වෙත 2017 ජූලි 13 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

AGDSL

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

විගණකාධිපති දෙපා
Auditor General's D
AGDSL

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර් සංවර්ධන මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ලැබිය යුතු ගිණුම්

ආයතනය විසින් නිමකර භාරදී තිබු දෝෂ වගකීම් කාලය අවසන් වී ඇති වාණිජ ව්‍යා රු. 749,110 ක් වූ රඳවාගත් මුදල් විගණන දිනය වූ 2017 ජුලි 30 දින වන වි අයතනවලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙ වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,744,897 ක ඌනතාවයක් වූ අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,238,655 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.3,506,242 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් ව සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන රු.21,070,777 කින් හා ක්‍රමක්ෂ රු.14,649,682 කින් වැඩි වී තිබුණද, මෙහෙයුම් වියදම් රු.36,569,186 කින් ව වෙනත් ආදායම් රු.2,657,516 කින් අඩුවීම මෙම ඌනතාවය වර්ධනය වීමට ප්‍රධාන බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2012 වර්ෂයේදී රු.26,982,577 ක් වූ ඌනතාවය 2015 වර්ෂය වන විට රු.2,238,655 ක් දක්වා අඩුවී තිබුණ ද, 2016 වර්ෂයේ දී එය නැවතත් රු. 5,744,897 ක් දක්වා වර්ධනය වී තිබුණි. එසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ දී රු. 179,994,271 ක් වූ මධ්‍යස්ථානයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේ දී රු. 260,341,682 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1974 අගෝස්තු 14 දිනැති හා 124/6 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන පරමාර්ථ වනුයේ,

- ශ්‍රී ලංකාවේ නවීකරණ සහ නිර්මාණ කුසලතාවන්ට ධෛර්යය දීමෙන් ද, ආධාර දීමෙන් ද, තාක්ෂණික විද්‍යාවේ සංවර්ධනය සඳහා අවශ්‍ය ආයතනික ක්‍රම ඇති කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.
- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විවිධ කර්මාන්තයන්හි සහ ආයතනයන්හි තාක්ෂණික ශිල්පීය, ඉංජිනේරු හා පර්යේෂණ කුසලතාවයන් ඒකාබද්ධ කිරීම පිණිස පහසුකම් සැලැස්වීම.
- රටේ සම්පත් දායාදයන්ට සහ ජාතික ක්‍රම සම්පාදනයේ අරමුණුවලට අනුකූලවන තාක්ෂණික ශිල්පීය ක්‍රම උපයුක්ත කිරීමට සහ ඒවා යොදා ගැනීමට වගබලා ගැනීම.
- රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි උචිත ආයතනයන්ට ඍජු ආකාරයෙන් සහ වක්‍ර ආකාරයෙන් තාක්ෂණ ශිල්පීය ක්‍රම මාරු කිරීමේ උපක්‍රමය පරීක්ෂා කිරීම සහ ඒ ආයතනයන්ට උපදෙස් දීම .
- උචිත තාක්ෂණික ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීමෙන් විශේෂයෙන් ශ්‍රම සහ අමුද්‍රව්‍ය සම්පත් වලින් උපරිම උපයෝජනය අත්කර ගැනීමට අනුබල දීම.
- ඉල්ලුම් කරනු ලැබූ විට ආදර්ශ යන්ත්‍ර සහ නියමු යන්ත්‍රාගාර අර පිරිමැස්මෙන් යුක්තව සැලසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරීක්ෂා කර බැලීම.
- ඉංජිනේරු ශිල්පීය සැලසුම් සහ පර්යේෂණ පිළිබඳව තාක්ෂණික දත්තයන් සහ ලේඛන අඛණ්ඩව සමීක්ෂණය කිරීම සඳහා කටයුතු පිළියෙල කිරීම.
- රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි ව්‍යවසායනයට අඛණ්ඩ උපදේශක සේවාවන් සැලසීම, ඉංජිනේරු සහ කාර්මික සැලසුම් පදනම මෙන්ම පර්යේෂණ හැකියාවන් පුළුල් කිරීම සඳහා පර්යේෂණ කටයුතු භාර ගැනීම සහ පුහුණු කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම.

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සමග කාර්යසාධනය පරීක්ෂා කිරීමේ දී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී තාක්ෂණ පැවරුම් බලපත්‍ර 70 ක් නිකුත් කිරීමෙන් රු. 502,000 ක් හා බලපත්‍ර 137 ක් අළුත් කිරීමෙන් රු. 200,000 ක ආදායමක් ඉපයීමට ඉලක්ක කළද, ඇතැම් තාක්ෂණයන් සාර්ථකව නිම කිරීමට නොහැකි වීමත් ඇතැම් තාක්ෂණයන් සඳහා ඉල්ලුමක් නොවීමත් හේතුවෙන් බලපත්‍ර 18 ක් නිකුත් කිරීමෙන් රු. 76,000 ක් සහ බලපත්‍ර 60 ක් අළුත් කිරීමෙන් රු. 89,000 ක ආදායමක් පමණක් උපයාගැනීමට හැකි වී තිබුණි.

(ආ) මධ්‍යස්ථානය විසින් හඳුන්වා දුන් තාක්ෂණය භාවිතයෙන් අඩු වියදම් ඉදිකිරීම් සහ අළුත්වැඩියා සේවාවන් 24 ක් සැපයීමෙන් රු. 68,000,000 ක ආදායමක්, ගොඩනැගිලි ඉදිකිරීම් 22 ක් සඳහා උපදේශන සේවා සැපයීමෙන් රු. 6,160,000 ක ආදායමක් හා භාණ්ඩ/යන්ත්‍ර හා කොන්ක්‍රීට් උපාංග සැපයීමෙන් රු. 7,800,000 ක ආදායමක් ඉපයීමට ඉලක්ක කළද, නව ඉදිකිරීම් ආකර්ෂණය කර ගැනීමට අපොහොසත් වීමත්, ඉංජිනේරු හා තාක්ෂණ ශිල්පීන් රඳවා ගැනීමට නොහැකි වීමත් හේතුවෙන් ලඟාකරගත් ඉලක්කය වූයේ ඉදිකිරීම් 12 කින් රු. 21,165,000 ක, යන්ත්‍ර සැපයීමෙන් රු. 2,400,000 ක හා උපදේශන සේවා 16 කින් රු. 2,780,000 ක ආදායමක් පමණි.

(ඇ) සැලසුම් නිර්මාණ හා කර්මාන්ත සඳහා උපදේශන සැපයීමේ අංශය මගින් සිදුකරන විවිධ අච්චු නිර්මාණය කිරීමේ වැඩ ඇණවුම් 140 ක් ලබාගැනීමෙන් රු. 7,500,000 ක ආදායමක් ඉපයීමට ඉලක්ක කලද, නිසි අවස්ථාවේදී යන්ත්‍ර අළුත්වැඩියා නොකිරීමෙන් සේවාවන් 40 ක් සැපයීමෙන් රු. 1,967,000 ක ආදායමක් පමණක් උපයා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී අවසන් කිරීමට අපේක්ෂා කළ ව්‍යාපෘති 12 ක භෞතික ප්‍රගතිය සියයට 32 සිට සියයට 90 දක්වා පරාසයක වූ අතර සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සියයට 55 ක සියයට 72 ක් සහ සියයට 78 ක ප්‍රගතියක් අපේක්ෂා කළ ව්‍යාපෘති 03 ක් ලඟාකරගත් ප්‍රගතිය පිළිවෙලින් සියයට 16 ක්, සියයට 55ක් හා සියයට 30 ක් පමණක් විය. මධ්‍යස්ථානයේ ඉංජිනේරුවරුන් සහ තාක්ෂණ ශිල්පීන් ඉවත්වයෑම සහ බාහිර පාර්ශවයන් සමග විධිමත් එකඟතාවයක් ඇතිව පර්යේෂණ සිදු නොකිරීම මේ සඳහා හේතු වී තිබුණි.

(ඊ) ආනයනික බැටරිවල ප්‍රමිතිය පරීක්ෂා කිරීමේ වාණිජ ව්‍යාපෘතියෙන් ලද ආදායම 2013 වර්ෂයට සාපේක්ෂව 2014, 2015 හා සමාලෝචිත වර්ෂයේ දී පිළිවෙලින් සියයට 79 කින්, 87 කින් හා 60 කින් අඩු වී තිබුණි. ඇතැම් පරීක්ෂණයන් සඳහා පහසුකම් නොමැතිකමත්, පරීක්ෂණ වාර්තා ප්‍රමාද වීමත් හේතුවෙන් ප්‍රධාන සේවාදායක ආයතනය වන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ලැබෙන ඇණවුම් ප්‍රමාණය අඩු වී තිබුණි. තවද, ඇණවුම් ලබා ගැනීම සඳහා ප්‍රධාන සේවාදායක ආයතනය සමග එකඟතාවයකට එළඹීමකින් තොරව මෙම ව්‍යාපෘතිය සඳහා 2011 වර්ෂයේදී, රු. 10,669,625 ක පිරිවැය වූ බැටරි පරීක්ෂා උපකරණයක් මිලදී ගෙන තිබුණද, එම උපකරණය ඌන උපයෝජිතව පැවතුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රත්තොටුවිල මිදිගමුව ඇලෙහි ස්වයංක්‍රීය පියන සහිත ගේට්ටුව සවිකිරීමේ වාණිජ ව්‍යාපෘතිය 2013 නොවැම්බර් මාසයේ දී ආරම්භකර 2014 පෙබරවාරි මාසයේ දී නිමකිරීමට අපේක්ෂාකලද, අවසන් කිරීම සඳහා 2017 ජූලි දක්වා වර්ෂ 03ක් ගත වී තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත ආදායම රු. 227,000 ක් සහ ඇස්තුමේන්තුගත වියදම රු. 187,838 ක් වුවත්, නිසි අධ්‍යනයකින් පසු ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් රු. 412,417 ක තථ්‍ය පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

(ආ) මධ්‍යස්ථානය විසින් රන්ටැඹේ ශිෂ්‍යභට බලකා මධ්‍යස්ථානයෙහි ජීව වායු ඒකකය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 2014 අගෝස්තු මාසයේ දී ආරම්භ කර 2015 පෙබරවාරි මාසයේ දී අවසන් කිරීමට අපේක්ෂා කළද, විගණිත දිනය වූ 2017 ජූලි වන විටත් අවසන් කර නොතිබූ අතර, ව්‍යාපෘතිය අක්‍රිය ව්‍යාපෘතියක් ලෙස පැවතුණි. දෙපාර්ශවය අතර විධිමත් ගිවිසුමක් හෝ අමතර පිරිවැය දැරීම සම්බන්ධ පැහැදිලි එකඟතාවයකට එළඹ නොමැති අතර ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත ආදායම රු. 104,995 ක් හා ඇස්තමේන්තුගත වියදම රු. 95,450 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ අවසාන වනවිට රු.122,063 ක පිරිවැයක් දරා තිබුණි.

4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) මධ්‍යස්ථානයේ ප්‍රධාන තොග ගබඩාවේ රු. 404,404 ක් වූ තොග අයිතම 104 ක් වර්ෂ 05 ක සිට නිෂ්ක්‍රියව පැවතිණි.

(ආ) සැලසුම් නිර්මාණ සහ උපදේශන සැපයීමේ අංශයේ රු. 10,459,163 ක් වටිනා උපකරණ 05 ක් 2015 වර්ෂයේ සිට නිෂ්ක්‍රියව හා රු. 51,267,312 ක් වටිනා උපකරණ 05 ක් සමාලෝචිත වර්ෂයේ දී ඌන උපයෝජිතව පැවතුණි.

4.4 හඳුනාගන්නා ලද පාඩු

නිසි අවස්ථාවේදී යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා නොකිරීමත්, ඇස්තමේන්තු ප්‍රමාණවත් නොවීමත්, බාහිර පාර්ශව සමග වියිමත් ගිවිසුම්වලට එළඹ නොතිබීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී අවසන් කරන ලද වාණිජ ව්‍යාපෘති 04 කින් ලද රු. 5,643,133 ක ආදායම ඉක්මවා රු. 7,929,857 ක වියදමක් දැරීමට සිදුවීමෙන් රු. 2,286,724 ක අලාභයක් සිදු වී තිබුණි.

4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

බාහිර පාර්ශව සමග වියිමත් ගිවිසුමක් හෝ එකඟතාවයක් නොමැති වීමත් 2015 හා සමාලෝචිත වර්ෂය තුළදී අවසන් වීමට නියමිතව තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු. 15,158,706ක් වූ ව්‍යාපෘති 04 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිටත් අවසන් කර නොතිබුණු අතර එම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය තුල අක්‍රීය තත්ත්වයේ පැවතුණි. එම ව්‍යාපෘති නිමකළ යුතු දින දීර්ඝ කිරීමට හෝ එම ව්‍යාපෘති අවසන් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 අයවැය පාලනය

අයවැයගත හා තථ්‍ය අගයන් අතර, සියයට 15 සිට සියයට 67 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

8

15. විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පැහැදිළි කිරීම්

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

මේ සඳහා පිළිතුරු උපශීර්ෂ අංකයන් විගණකාධිපති තුමාගේ 2017 සැප්තැම්බර් 24 දිනැති ලිපිය හා බැඳේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

....

2.2 ලැබිය යුතු ගිණුම්

....

මෙහි සඳහන් කර ඇති ව්‍යාපෘති තුන වනුයේ සයින්දමරුදූ විදාතා මධ්‍යස්ථානය ඉදිකිරීම, දිඹුලාගල හා ඇලහැර ආදාහනාගාර ඉදිකිරීමයි. සයින්දමරුදූ විදාතා මධ්‍යස්ථානය වෙනුවෙන් රඳවාගත් මුදල් ලැබිය යුතු වන්නේ අප අමාත්‍යාංශයෙන් වන අතර, අමාත්‍යාංශයෙන් ඉල්ලීම් සිදු කර ඇති ඇත, එම මුදල් ලබාදීමට කටයුතු කරන බව අප වෙත දන්වා ඇත. එසේම අදාහනාගාර සඳහාද රඳවාගත් මුදල් ලබා දෙන ලෙස ලිඛිතව හා වාචිකව ඉල්ලීම් සිදු කර ඇතත් මේ දක්වා ලැබී නොමැත. මේ සම්බන්ධව අප තවදුරටත් කටයුතු කරමින් සිටී.

3. මූල්‍ය සමාලෝචනය

....

3.1 මූල්‍ය ප්‍රතිඵල

....

මූල්‍ය ප්‍රතිඵල නිරීක්ෂණයන් සමග එකඟ වේ.

සාමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 4 ක දායකත්වය හා එකඟ වේ.

4. මෙහෙයුම් සමාලෝචනය

....

4.1 කාර්යසාධනය

....

(අ) පැවරිමට බලාපොරොත්තු වූ සමහර අළුත් තාක්ෂණයන් සාර්ථකව නිම කිරීමට නොහැකි වූ බැවින්ද, බලාපොරොත්තු වූ ආකාරයට සමහර තාක්ෂණයන් සඳහා ඉල්ලුමක් නොතිබුණු බැවින්ද, ඉලක්ක කරා ලඟා වීමට නොහැකි විය. කෙසේ වෙතත් ඉදිරියේදි මෙම තත්වය වැඩි දියුණු කර ගැනීමට පියවර ගනිමින් සිටි.

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පැවති මන්දගාමී ස්වරූපය හා ආයතනයේ ඉංජිනේරු වරුන් හා තාක්ෂණ ශිල්පීන් බඳවාගැනීමේ හා රඳවාගැනීමේ තිබූ දුෂ්කරතාවය යන හේතු නිසා ඉහත ඉලක්ක කරා ලඟා විමට නොහැකි විය.

(ඇ) ඩයි හා අච්චු නිපදවීමේ යන්ත්‍රාගාරය 2000 වර්ෂයේදි අප පිහිට වූයේ එම වකවානුවේ නවීනතම වූ මෙම තාක්ෂණය ලංකාව තුළ ප්‍රචලිත වී නොතිබූ බැවින්, එය ප්‍රචලිත කිරිම සඳහාය. මෙම යන්ත්‍රාගාරය පිහිටුවා එමගින් එම තාක්ෂණය සම්බන්ධ ලාංකික කර්මාන්ත කරුවන් දැනුවත් කිරීමෙන් අනතුරුව, මේ වන විට පෞද්ගලික ව්‍යවසායකයින් කීප දෙනෙක් මෙවැනි යන්ත්‍රාගාර මහාපරිමාණයෙන් පිහිටුවා සේවාවන් ලබා දෙමින් පවතී. මෙම යන්ත්‍රාගාරය පිහිටවීමෙන් අපගේ පරමාර්ථය වූයේ ද මෙයයි. මෙලෙස පුද්ගලික අංශයේ වැඩි පහසුකම් හා වැඩි යන්ත්‍ර සූත්‍ර පවතින යන්ත්‍රාගාර පැවතිම හේතුවෙන් අපහට ලැබෙන ඇනවුම් අඩු වී ඇත. එසේම අප සතුව පවතින සී ඒන් සී යන්ත්‍ර වලින් යන්ත්‍ර දෙකක ඇතිවූ දෝෂයන් නිරාකරණය කිරිමට පියවර ගනිමින් පැවතින. මේ නිසාද ලබාගත හැකි ඇණවුම් ප්‍රමාණය අඩු වී ඇත.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට අවසන් කිරීමට අපේක්ෂා කළ ව්‍යාපෘති 12 පහත දැක්වේ.

1. RED/RES/124/2014 - Development of an Aquatic Weeder
2. E&EM/RES/76/2014 - Smart Parking Monitoring System
3. MD/RES/145/2014 - Field Trial & Dissemination of Milking Machine
4. MD/RES/80/2015 - Development of Automated Water Regulation Method for Flap Gate
5. E&EM/RES/77/2014 - Study & Development of Image Processing
6. A&PHT/RES/77/2016 - Modified Version of Semi-Automatic String Hopper Machine
7. A&PHT/RES/74/2016 - Development of Smoked fish Processing Unit
8. RED/RES/78/2016 - Advancement of NERD Cremator for Improved
9. RED/RES/81/2016 - Development of a Roof Tile Drier
10. CVL/RES/111/2016 - Pre-stressed Masonry Retaining Wall
11. MD/RES/79/2016 - Data Acquisition Module
12. DF&CI/RES/91/2016 - Artificial Arm for Disables

ඒවායින් පහත සඳහන් ව්‍යාපෘති අට සඳහා අපේක්ෂිත ප්‍රගතිය ලඟාකර ගැනීමට නොහැකි වූ ව්‍යාපෘතිවලට බලපාන ලද පොදු කරුණුවේ. ඒවා පහත දැක්වේ.

1. RED/RES/124/2014 - Development of an Aquatic Weeder
2. E&EM/RES/76/2014 - Smart Parking Monitoring System
3. MD/RES/80/2015 - Development of Automated Water Regulation Method for Flap Gate
4. A&PHT/RES/77/2016 - Modified Version of Semi-Automatic String Hopper Machine
5. A&PHT/RES/74/2016 - Development of Smoked fish Processing Unit
6. CVL/RES/111/2016 - Pre-stressed Masonry Retaining Wall
7. MD/RES/79/2016 - Data Acquisition Module
8. DF&CI/RES/91/2016 - Artificial Arm for Disables

පර්යේෂණ ව්‍යාපෘතින් සිදුකර ගෙනයාමේදී අනෙකුත් ව්‍යාපෘතිමෙන් නොව අපේක්ෂිත ඉලක්ක පදනම් කරගෙන සිදුකරගෙන ගියත් ඉලක්කයන් ලඟාකර ගැනීම බොහෝවිට නොහැකිවේ. අප විසින් පර්යේෂණය සිදුකරගෙන යන තාක්ෂණික ක්‍රමවේදය, තෝරා ගන්නා ලද අමුද්‍රව්‍යවල තත්වය සහභාගී වන ශ්‍රමිකයන්ගේ දැණුම සහ පළපුරුද්ද උපකල්පනය කරන ලද කරුණු මත පර්යේෂණයේ ප්‍රගතිය තීරණය කරණ සාධකවේ. ඉහත පර්යේෂණ ව්‍යාපෘතිවල සැලසුම් කල ක්‍රියාකාරි සැළසුමට සිදුකරගෙන යාමේදී අදාල අවස්ථාවලදී අපේක්ෂිත ප්‍රතිපල නොලැබීමෙන් කාලය ගෙවීගියද භෞතික ප්‍රගතිය වෙනස් නොවේ. ඉහත ව්‍යාපෘතිවල අපේක්ෂිත ප්‍රගතිය සඳහා බලපා ඇත්තේ ඉහත පෙන්වන ලද කරුණුවේ. එයට අමතරව අදාල ව්‍යාපෘතිභාර ඉංජිනේරුවන් සහ තාක්ෂණ නිලධාරීන් සේවයෙන් ඉවත්වීමත් ඒ සඳහා වෙනත් ඉංජිනේරුවරයෙකු යෙදවීමට නොහැකිවීමත් නිසා ව්‍යාපෘතිවල ප්‍රගතිය ඉලක්ක කරගෙන යාමට අපට නොහැකිවීමට ඉතා තදින් බලපානු ලැබූ කරුණුවේ.

9. MD/RES/145/2014 - Field Trial & Dissemination of Milking Machine

ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය සහ නර්ඩ් මධ්‍යස්ථානය ඒකාබද්ධව සිදුකරන ව්‍යාපෘතියකි. දැනට යන්ත්‍ර 10ක් නිෂ්පානය කර ඇති අතර ක්ෂේත්‍ර පර්යේෂණ සිදු කිරීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරියට සුදුසු ස්ථාන සොයා ගැනීමට සැළසුම් කල කාලය තුළදී සොයා ගැනීමට නොහැකි වූ බැවින් ප්‍රගතිය අඩුවී ඇත. කොසේවුවද නර්ඩ් ආයතනය මගින් මේ වන විට සුදුසු ස්ථාන තෝරාගෙන ක්ෂේත්‍ර පරික්ෂණ සිදු කරමින් පවතී.

10. E&EM/RES/77/2014- Study & Development of Image Processing

රෝගීනගේ තුවාල ඡායාරූප මගින් දත්ත ලබාගෙන විශ්ලේෂණය කර රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. දැනට අවශ්‍ය මූලික උපකරණය නිමවා ඇති අතර, ක්ෂේත්‍ර පරීක්ෂා සඳහා රෝහලක සුදුසු වාට්ටුවක් / සායනයක් සොයා ගැනීමට මේ වනතෙක් අපහසුවී ඇත. මේ වනවිට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් තුමා දැණුවත් කර ඇති අතර රෝහලක සුදුසු සායනයක් ලැබුණු පසුව අප විසින් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීමෙන් පසු මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට හැකිවනු ඇත.

11. RED/RES/78/2016- Advancement of NERD Cremator for Improved environmental performances

මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ නර්ඩ් ආදාහනාගාර වල තාක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා වන අතර අප විසින් වැඩි දියුණු කරන ලද තාක්ෂණය අත් හදා බැලීම සඳහා නව ආදාහනාගාරයක් අවශ්‍යවේ. ඒ සඳහා නව ආදාහනාගාරයක් ඉදිකිරීමට කුරුණෑගල ප්‍රාදේශීය සභාව මගින් සිදුකළ අතර පසුව අතරමඟ නවතා දමන ලදී. ආදාහනාගාරය නියමිත වේලාවට ඉදිනොකිරීම නිසා පර්යේෂණ ව්‍යාපෘතිය ඉතා අඩු ප්‍රගතියකින් යුක්ත වූ අතර නැවතත් කුරුණෑගල ප්‍රදේශීය සභාව මේ සඳහා කැමැත්ත ප්‍රකාශ කර ඇත. දැනට ආදාහනාගාර ගොඩනැගිල්ල නිමවී ඇති අතර අවබෝධතා ගිවිසුම අත්සන් කළ පසු පර්යේෂණ ව්‍යාපෘතිය නැවත යථාතත්වයට පත්කර ගත හැක.

12. RED/RES/81/2016 - Development of a Roof Tile Drier for traditional roof tile industry: A collaborative project with NERDC, Ministry of Industry and Commerce (MOIC), and Roof Tile Industry Association (RTIA)

මෙම ව්‍යාපෘතිය සඳහා ලබා ඇති ප්‍රගතිය 40%කි. මෙම ව්‍යාපෘතිය සඳහා කර්මාන්ත හා වානිජ අමාත්‍යාංශය සහ උළු නිෂ්පාදකයන්ගේ සංගමයද සහභාගිවේ. නර්ඩ් මධ්‍යස්ථානය, උළු නිෂ්පාදකයන්ගේ සංගමය සහ වානිජ කර්මාන්ත අමාත්‍යාංශය අතර ගිවිසුම පිළියෙල කිරීම සහ අත්සන් කිරීම සඳහා සැලසුම් කරන ලද කාලය තුල නිම කිරීමට නොහැකිවිය.

මෙහි පසුව දක්වා ඇති ව්‍යාපෘති තුන වනුයේ :

1. Design and Fabrication of a Hyperbaric Oxygen Chamber for Hyperbaric Oxygen Therapy

මෙම ව්‍යාපෘතිය 2010 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාල ප්‍රගතිය ලඟා කරගැනීමට නොහැකිවූයේ පහත සඳහන් හේතු නිසාය .

සමහර කොටස් නිෂ්පාදනය කිරීම සඳහා සැළසුම් කරන ලද කාලයට වඩා කාලයක් වැයවීම. මෙම උපකරණය තුලට රෝගින් ඇතුලත් කර නිෂ්චිත පීඩනයක් යටතේ ප්‍රතිකාර කරනු ලැබේ. මෙම උපකරණයේ නිරවද්‍යතාව හා ආරක්ෂාව ඉතාමත් ප්‍රමුඛ ස්ථානයක් ගන්නා නිසා විශේෂිත වූ අමුද්‍රව්‍ය භාවිතා කරන ලදී. එම අමුද්‍රව්‍ය තෝරාගැනීමටත් අවශ්‍ය වෛද්‍ය උපදෙස් නියමිත වෙලාවට නොලැබීමත් අපගේ ඉලක්කවලට ලඟාවිය නොහැකි විය. 2017 වර්ෂයේදී මෙම ගැටළුව නිරාකරණය විසදාගෙන ව්‍යාපෘතිය කරගෙන යනු ලැබේ.

2. Development of an automated water regulating method with flap gate to mitigate flood and salt water intrusion to uplands through canal opened to sea in coastal planes

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් යුක්තය.

1. ලවන සහිත මුහුදු ජලය නියඟයේදී වාරි ,ඇලක වර්ෂා කාලයේදී ගංවතුර පාලනය කිරීම සඳහා නර්ඩ් ආයතනය විසින් හඳුන්වාදී ඇති ජලපාලන ගේට්ටුවක් සවි කිරීම.

මෙම ගේට්ටුව සවි කිරීම සඳහා වැය වන මුදල් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ගෙවනු ලබන අතර ගේට්ටුව සවි කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් සිදු කිරීමට නියමිතය .

2. මෙම ජල පාලන ගේට්ටුව සවිකළ පසු රට ඇතුළට මුහුදු ජලය, ඇල ඔස්සේ ගලා යාම පාලනය කිරීම සඳහා සිදු කරණු ලබන පර්යේෂණ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය අප මගින් සිදු කිරීමට නියමිතයමෙම කාර්යයන් සඳහා ගොවිජන ස .ේවා
දෙපාර්තමෙන්තුව මඟින් ගාල්ලවග්ගල්මෝදර ස්ථානයක වාරි ඇලක් තෝරා ගන්නා ලද අතර අප ,
එහෙත් එම ස්ථානය භාර . ජල පාලන ගේට්ටුව සාදා නිම කරන ලදීවිසින් එම ස්ථානය සඳහා අවශ්‍ය
පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව අතර මේ සම්බන්ධයෙන්
තිබූ සම්බන්ධීකරණයේ අඩුපාඩුවක් නිසා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් මේ ස්ථානයට
සාමාන්‍ය උස් පහත් කරන ගේට්ටුවක් වෙනත් ආයතනයක් මඟින් සාදා සවි කොට ඇතමේ නිසා .
පාර්තමේන්තුව විසින් අප හට අපගේ මුල් පර්යේෂණයට අදාල දොරටුව සවි කිරීම ගොවිජන සේවා දෙ
සඳහා බෙන්තොට වී පර්යේෂණ ආයතනයේ ජල අපවාහනය කරන ඇලක් තෝරා දෙන ලදී .
වෙනස්කම් සිදුකර ඇති අතර අදාල අනතුරුව අප විසින් එම ස්ථානයට අදාල දොරටුවේ අවශ්‍ය
එහෙත් මේ දක්වා .දෙන ලදීපාර්තමේන්තුවට ලබාහයේ මිනුම් ගොවි ජන සේවා දෙට් ව්‍යූකොන්ක්‍රී
හය ඔවුන් විසින් සාදා නොට් ව්‍යූමෙම කොන්ක්‍රීමැතහය සෑදීමෙන් අනතුරුව ට් ව්‍යූමෙම කොන්ක්‍රී .
.පෘතිය කරගෙන යෑමට බලාපොරොත්තු වේව්‍යා අපගේ පර්යේෂණ

3. Study and Development of Image Processing Solution for Wound Treatment

රෝගීන්ගේ තුවාල වල වර්ණ ඡායාරූප ගෙන ඒවා අදාල තුවාලයේ තත්වය පරික්ෂා කිරීමට වෛද්‍යවරුන්ට පහසු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වූ අතර ප්‍රතිකාර කරණ වෛද්‍යවරයාගේ අවශ්‍යතාවය මත ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

අප විසින් මේ සඳහා තාක්ෂණ ක්‍රමවේදයක් සොයාගත් අතර මෙම ක්‍රමවේදය මගින් ක්ෂේත්‍ර පරික්ෂණ සිදුකිරීම ව්‍යාපෘතියේ ඊළඟ අදියරේ වේ. සීදූව විජයකුමාරතුංග රෝහල තුළ මූලික පර්යේෂණයන් සිදුකළ අතර එහි ඇති අධික රෝගී තදබදය නිසා සහ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම වැනි ගැටළු පැන නැගුණි.

මේ සඳහා අප විසින් කොළඹ ජාතික රෝහලේ පහසුකම් ලබාගැනීමට විවිධ වෛද්‍යවරුවන් සහ අදාල ආයතන සමඟ සාකච්ඡා කිහිප වතාවක් පැවැත් වූ අතර ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් නොලැබුණි.

අවසානයේදී අපගේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් තුමා සමඟ සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී අපගේ ඉල්ලීම ඉටුකිරිමට ඔහු එකඟ වූ නමුදු විටින් විට විමසීම් සිදුකළ ද ඔවුන්ගෙන් ද අපගේ ඉල්ලීම ඉටු නොවීය.

වෛද්‍ය පර්යේෂණ ආයතනය මේ සඳහා සහයෝගය ලබාදීමට නොහැකි බව අප සමග සිදු කරන ලද සාකච්ඡා වලදී පවසා ඇත. මෙම තත්වය මත මෙම ව්‍යාපෘතිය කරගෙන යාමට නොහැකි විය.

කෙසේවුවද 2016 වර්ෂය අවසානයේදී මෙම ව්‍යාපෘතිය සඳහා රු.8700 ක් පමණක් වියදම් කර ඇත. 2017 වර්ෂයේදී අදාල සෞඛ්‍ය අංශ වලින් දායකත්වය ලබාගෙන ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කරන අතර එසේනොමැති නම් මෙම ව්‍යාපෘතිය නවතා දැමීමට කටයුතු කරනු ලැබේ.

(ඊ) මෙම බැටරි ටෙස්ටරය ස්ථාපිත කිරීමට පෙර වාර්තා නිකුත් කිරීමේ ප්‍රමාදයක් තිබුණි. (වසර 5 කට පමණ පෙර) පසුගිය වසර දෙක තුළදි කිසිදු ප්‍රමාදයක් නොතිබුණි. ආදායම අඩු වූයේ අප හට ලැබෙන ඇණවුම් ප්‍රමාණය අඩු වීම නිසාය. මෙලෙස ඇණවුම් අඩු වීම මත මෙම උපකරණය ඌණ උපයෝජිතව පවතී.

4.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

....

(අ) මෙය වාණිජ ව්‍යාපෘතියක් වුවත් මෙහිදි සිදු වුයේ නවමු ක්‍රමවේදයක් අනුගමනය කිරීමකි. ඇලක ජලය පවතිද්දීම ලවණ පාලන දොරටු සවිකිරීම මෙහිදි සිදුවිය. අදාල ස්ථානය පිහිටියේ අදාල දොඹකර ආදිය ගෙන යෑමට ඉතා දුෂ්කර ප්‍රදේශයක වීමත්, වරින්වර ඇතිවූ ගංවතුර තත්වයන්ද නිසා සහ අදාල ඉදිකිරීම අපේක්ෂිත පරිදි එකවරම කර ගත නොහැකි වූ නිසා ප්‍රමාදය සහ වියදම වැඩිවීම සිදුවිය.

(ආ) මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත කරන ලද්දේ මෙම ජීරක ටැංකි පරීක්ෂා කරන අවස්ථාවේදී මල අපද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම හිස්කර ටැංකිය ඇතුලත පිරිසිදුකර කර සුළු අලුත්වැඩියා කටයුතු කිරීම සඳහාය.

අලුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම මෙම ජීරක ටැංකි සම්පූර්ණයෙන්ම හිස්කර පිරිසිදු කර පරික්ෂා කරන ලදී. එහිදී ජීරක ටැංකි බිත්ති වල විශාල පැලුම් ඉරි දක්නට ලැබුණු අතර, ඒවා අප ඇස්ත්මේන්තුගත කල කාලයට හා මුදලට කල නොහැකි බව අවබෝධ වූ අතර, මේ පිලිබඳව රන්ටැබේ ශීෂ්‍යබට බලකායේ නිලධාරින් දැනුවත් කර අප විසින් ඉතා පරීක්ෂාකාරීව අළුත්වැඩියා කටයුතු සිදුකරගෙන ගිය අතර, ටැංකි 2ක අලුත්වැඩියා කටයුතු නිම කරන ලදී.

අයවිය යුතු ඉතිරි මුදල් ලබා ගැනීම සඳහාත් අලුත්වැඩියාවන් නිමකිරීමටත් අනුමැතිය කිහිපවරක් අප විසින් අදාල නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිමුත් මේ වන තුරු ඔවුන්ගෙන් කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත. 2014 වර්ෂයේ සිට මේ දක්වා අප විසින් මෙම මුදල ලබා ගැනීමට කිහිප වතාවක් උත්සාහ කල අතර, ඒ සඳහා ව්‍යාපෘතියට අයත් නිලධාරීන්ගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලැබී ඇති බැවින් මෙම වර්ෂයේදී මෙම ගැටලුව නිමා කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

....

(අ) මධ්‍යස්ථානයේ තොග ගබඩාවේ ඇති සමහර අයිතමයන් චලනය නොවන බවට පත් වී ඇත්තේ ඊට අදාල උපකරණ භාවිතයෙන් අයින් වී ඇති බැවිනි. ඉදිරියේදි මේවා තොග ගබඩා වලින් ඉවත් කිරිමට කටයුතු කරණු ලැබේ.

(ආ) මෙහි නිෂ්ක්‍රීයව පැවතින බව දක්වා ඇති උපකරණ අනෙකුත් ප්‍රධාන යන්ත්‍ර වැඩ කරන විටින් විට අවශ්‍යවන්නා වූ සහායක උපකරණ වේ. මෙම සහායක උපකරණ ප්‍රධාන යන්ත්‍රවල ක්‍රියාකාරීත්වයට අත්‍යාවශ්‍ය වන අතර, එම උපකරණ වල ඉහල උපයෝගීතාවයක් බලාපොරොත්තු විය නොහැක. මෙම යන්ත්‍ර නිෂ්ක්‍රීයව නොමැති අතර, අවශ්‍ය අවස්ථාවලදි භාවිතා කර ඇත. මෙම ඌණ උපයෝජිතව පැවති යන්ත්‍ර 5 සම්බන්ධව හේතු වී ඇත්තේ පහත කරුණුය.

වසර 2000 දී මෙම අංශය ආරම්භ කළ අතර එම කාලයේ වැඩ ඇණවුම් බොහෝ ප්‍රමාණයක් ලැබුණි.එම කාලයට අනුපාතිකව ඇස්තමේන්තු කර බලාපොරොත්තු වූ වැඩ ඇණවුම් ප්රමාණය අප වෙත ලැබී නැත. එයට හේතුව වනුයේ තාක්ෂණයේ දියුණුවත් සමඟ බොහෝ ආයතනවල CNC තාක්ෂණය සහ යන්ත්‍රසූත්‍ර භාවිතය ආරම්භ වී ඇත. එම නිසා අපවෙත ලැබෙන ඇණවුම් ප්‍රමාණය අඩු වී ඇත. එය අපගේ යන්ත්‍රසූත්‍ර ඌන උපයෝජිත වීමට හේතු වී ඇත.

එමෙන්ම අපගේ ප්‍රධාන යන්ත්‍ර දෙකක් වන Wire Cut සහ EDM යන්ත්‍ර වල කාර්මික දෝෂ ඇති වීම නිසා එම දෝෂ නිරාකරණය කරන තෙක් අප වෙත ලැබුණු සමහර වැඩ ඇණවුම් භාර නොගැනීමට සිදුවිය. එම නිසා ද මෙම යන්ත්‍ර ඌන උපයෝජිත තත්ත්වයට පත්වී ඇත.

Scanning යන්ත්‍රය බොහෝ විට භාවිතා කරනුයේ ඇඟලුම් ක්ෂේත්‍රයට අදාල අච්චු නිර්මාණ කටයුතු සඳහා වන අතර එම අච්චු නිර්මාණය කළ පසු නැවත බොහෝ කාලයක් ඒවා භාවිතා කරගෙන නිෂ්පාදන කරගෙන යා හැකි බැවින් නැවත අච්චු නිෂ්පාදනය කිරීම අඩු වේ. එබැවින් අපට ලැබෙන ඇණවුම් ප්‍රමාණය අඩුවේ. එම නිසා Scanning යන්ත්‍රය ඌන උපයෝජිත තත්ත්වයට පත්වී ඇත.

4.4 හඳුනාගන්නා ලද පාඩු
....
මෙලෙස පාඩු වි ඇතයි දක්වා ඇති ව්‍යාපෘති 4 වනුයේ

1. Design& Manufactures Modules & Dies
2. Flat gate Athuruwella
3. Flap Gate Vilgoda
4. Bio gas digesters Kurunagala

Design & Manufactures Modules & Die
අප විසින් මෙම ඇණවුම භාර ගැනීමේදී රුපියල් ලක්ෂ හයක් පමණ වන වියදම් ඇස්තමේන්තුව සකස් කර ඇත්තේ ආයතනයේ යන්ත්‍ර සූත්‍ර සහ මානව සම්පත් යොදාගෙන කාර්යය නිම කරන බව සලකා ගෙනය. නමුත් මෙම ඇණවුම් නිම කිරීමේදී අපගේ අදාල යන්ත්‍ර කිහිපයක් ක්‍රියා විරහිතවීම නිසා වෙනත් ආයතනයක සේවය ලබාගැනීමට සිදුවිය. ඒ සඳහා අපට රු.200,772.00 ගෙවීමට සිදුවූ අතර එම මුදල් ප්‍රමාණය අප විසින් මුල් ඇස්තමේන්තුවේ ඇස්තමේන්තුගත ප්‍රමාණයට වැඩි ප්‍රමාණයකි. අදාල පාරිභෝගිකයාගේ දැඩි අවශ්‍යතාවය මත බලාපොරොත්තු වූ දිනට මෙම කාර්යය නිම කර දීමට සිදුවූ නිසා ද අතිකාල දීමනා ගෙවීම සඳහා තවත් මුදල් ප්‍රමාණයක් වියදම් විය. එම නිසා ඇස්තමේන්තුගත වියදමට වඩා වියදමක් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වැය විය.

Flap gate Athuruwella
මෙම වාණිජ ව්‍යාපෘතියේ පාඩුව රු. 385,306/-ක් වී ඇත්තේ වැලි කොට්ට දමා අදාල ඇලේ ජලය කොටස් වශයෙන් ඉවත් කිරීමට බලාපොරොත්තු නොවූ තරම් කාලයක් සහ ශ්‍රමයක් වැයවූ නිසාය.

Flap gate Vilgoda
මෙහිදී නන්නාඳුනන පිරිසක් විසින් දොරටුව අදාල සීරුමාරු නොසලකා එකවර (ජලශයේ ජලය පිරී ඇති විට) විවෘත කෙරුම නිසා දොරටුව ක්‍රියාත්මක වන යන්ත්‍රණයට හානි වී තිබූ නිසා එය නැවත පිළිසකර කොට දොරටු යථා තත්වයට පත් කිරීමට මට සිදුවූ නිසා කාලය හා ශ්‍රමය වැය විය.

Biogas Digester Kurunegala
ජීරක සෑදීම සඳහා මුලින්ම තීරණය කරන ලද ස්ථානය රෝහලේ අවශ්‍යතාවය පරිදි වෙනස් කිරීමට සිදු වූ බැවින් ජීරක සෑදීමට තීරණය කරන ස්ථානය වෙත බැකෝ යන්ත්‍ර යොදා වලවල් හෑරීම අපහසු විය (රෝහලේ වාට්ටු දෙකකට පිටුපස ජීරක සෑදීමට තීරණය වූ බැවින්).

එබැවින්, ජීරක වලවල් හෑරීම සඳහා බැකෝ යන්ත්‍ර යොදා ගැනීමට ඇස්තමේන්තුවට ඇතුලත් කලද බැකෝ යන්ත්‍ර වැඩබිම තුලට ඇතුලු කිරීම නොහැකි වූ බැවින් මිනිස් ශ්‍රමය යොදා එම කාර්යය සිදු කිරීමට වුනි.

ජීරක වලවල් හෑරීමෙන් පසුවද, අධික වාර්ෂාව පැවතුණු බැවින් වලවල් වල ඉවුරු කඩා වැටී ජීරකවලවල් තුල පස් සහ ජලය පිරුනි. පසුව ඒවාද මිනිස් ශ්‍රමය යොදා ඉවත් කිරීමට සිදුවුනි.

ජීරක සෑදීමට අවශ්‍ය අමුද්‍රව්‍ය වැඩ බිම අසලට ප්‍රවාහනය කිරීමට අපහසු වූ බැවින් හා වර්ෂාව නිසා අමුද්‍රව්‍ය ලබා ගැනීම දුෂ්කරවූ බැවින්ද එම කටයුත්තද මිනිසුන් යොදා කිරීමට සිදුවුනි.

බලාපොරොත්තු නොවූ මෙවැනි හේතූන් නිසාවෙන් කම්කරු කුලී, සහ ඔවුන්ගේ අනෙකුත් දීමනා සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවීම හේතුවෙන් ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදලට වඩා මුදලක් වැය වුනි. මෙම අතිරේකව වැයවූ මුදල අප විසින් රෝහලේ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටි නමුදු ඒ සඳහා ඔවුන්ගෙන් යහපත් ප්‍රතිචාරයක් නොලැබුනි.

කෙසේ වුවත්, මෙම ව්‍යාපෘතිය රෝහලේ අපද්‍රව්‍ය (ඉතිරිවන ආහාර සහ මුලුතැන්ගෙය එකතුවන කසල) භාවිතා කර ජීවවායුව භාවිතයට යොදා ගැනීම සඳහා රෝහල් බලධාරීන් විසින් සිදු කල ව්‍යාපෘතියකි. මෙවැනි ව්‍යාපාති මගින් තාක්ෂණය ප්‍රචලිත වීමත්, එමගින් ජාතික වශයෙන් සිදුවන මෙහෙවරත් සලකා අප විසින්

මෙම ව්‍යාපෘතිය දිගටම කරන ලදී.

4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

....

මෙලෙස ප්‍රමාදව පැවතුන බව සඳහන් කර ඇති ව්‍යාපෘති 4 වනුයේ

RED/RES/92/2013 Implementing fuel wood chip feeding system

තේ වියලීමේදී තාපය ලබා දීම සඳහා ග්ලිඩිසියා දර කැබලි දර පෝරණුව වෙත යොමු කිරීම පිණිස අප ආයතනය මගින් නිර්මාණය කරන ලද යන්ත්‍රය බලංගොඩ New Hope well තේ කර්මාන්ත ශාලාවේ සවිකර, ක්‍රියාත්මක කර ප්‍රදර්ශනය (demonstration) කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.

බලංගොඩ New Hope well තේ කර්මාන්ත ශාලාව සමඟ එක්ව මෙම ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් කරන ලද අතර, එම කර්මාන්ත ශාලාව පාර්ශවයෙන් මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අවස්ථාව ලබා නොදීම නිසා මෙම ව්‍යාපෘතිය බලාපොරොත්තු වූ පරිදි 2015 වසරේදී අවසන් කිරීමට නොහැකි විය.

ඉන්පසු මෙම ව්‍යාපෘතිය සක්‍රීය කිරීම සඳහා තේ කර්මාන්ත ශාලාව සමඟ සාකච්ඡාවේදී මෙම ව්‍යාපෘතිය මෙම කාර්මාන්ත ශාලාවේ කරගෙන යාම සඳහා අකමැත්ත පල කරන ලදී. යෝජනාවූ විකල්පයන් සඳහාද දෙපාර්ශවයම එකඟ නොවූ බැවින්, මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා කටයුතු සූදානම් කර ඇත.

2016 වසරේදි ප්‍රගතියක් පෙන්වීම සඳහා මෙම ව්‍යාපෘතිය සක්‍රීයව නොතිබූ බැවින් කල් දිගුවක් ලබා නොගන්නා ලදී.

RED/COM/11/121/2014 - Flap gate for Waggalmodara

මෙම දොරටුව සකසා නිමකර තිබූ අතර එය සවිකිරීම පමණක් සිදුවී නොතිබිණි. එයට හේතුවූයේ මෙම දොරටුව සවි කිරීමට නියමිතව තිබූ ස්ථානය මෙහි පාර්ශවකරුවූ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වෙනස් කිරීම නිසාය (ගාල්ල වග්ගල්මෝදර සිට බෙන්තොට වී පර්යේෂණ ආයතනයේ අපවහන ඇල දක්වා). ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මෙම ස්ථානයේ කොන්ක්‍රීට් ව්‍යුහයක් සෑදීමට නියමිතව තිබුණත් ඔවුන් විසින් එම කටයුත්ත අවසන් කර නොතිබුණි. එමනිසා මෙම දොරටුව සවිකර නිමකිරීමට නොහැකි විය. මෙම කොන්ක්‍රීට් ව්‍යුහය ඔවුන් විසින් සාදන තෙක් අවශ්‍ය කළයුතු කාර්යයක් නොමැති වූ බැවින් ව්‍යාපෘතියෙ කාලය දීර්ඝ කිරීමක් සිදු නොකරන ලදී.

RED/COM/02/95/2015 - Repairing of stack of incinerator of Kurunegala hospital

අදාල කාලය තුලදි ව්‍යාපෘතිය පහත සඳහන් හේතු මත අවසන් කිරීමට නොහැකි විය.

1 කුරුණෑගල ආරෝග්‍ය ශාලාව දාහක යන්ත්‍රය දිගටම භාවිතා කරමින් පැවතීම නිසා අලුත් වැඩියාවන් සඳහා එය නතර කිරීම හා අවශ්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා දිනයක් ලබා ගැනිමට අපහසු වීම

2 අප ආයතනයේ සේවක මහතුන් හා සම්පත් විශාල ප්‍රමාණයේ වාණිජ ව්‍යාපෘතින් කිහිපයක යොදවා තිබීම.

3 අතරතුර කාලය තුලදී ඔවුන් දින දෙකක් ලබා දුන්නද අපගේ කාර්ය බහුලත්වය නිසා එම දිනවල මෙම කාර්යය නිම කිරීමට නොහැකි වූ අතර, තුන්වන අවස්ථාවේදී මෙම ව්‍යාපෘතිය 2017 මාර්තු මස අවසන් කරන ලදී.

RED/RES/81/2016 - Development of roof tile drier

කර්මාන්ත අමාත්‍යාංශය හා අප ආයතනය සම්බන්ධව කරනු ලබන, මෙම ව්‍යාපෘතිය 2016 ජනවාරි මස ආරම්භ කිරීමට නියමිතව තිබුනු අතර ව්‍යාපෘතියට අදාල සැලසුම් සහ ද්‍රව්‍ය ලැයිස්තු 2016 වසර තුලදී නිම කෙරුනි. අදාල අවබෝධතා ගිවිසුම (නර්ඩ් ආයතනය සහ කර්මාන්ත අමාත්‍යාංශය අතර) 2016 දෙසැම්බර් මස අත්සන් කරන ලද අතර, ඉදිකිරීම් ආරම්භය 2017 ජනවාරි මස සිදුවිය. 2017 දෙසැම්බර් මස වන විට මෙම නියමු ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතය.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

....

5.1 අයවැය පාලනය

....

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය තිබෙන අංගයන් අතර වැඩිම විචලායයක් නිරූපනය වනුයේ තාක්ෂණ සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහාය. සැලසුම්ගත ආකාරයට අලෙවිය පිළිබඳ පුළුල් ප්‍රචාරයක් දීමට අපොහසත් විය.

තවදුරටත් ආයතනයේ පාලනාධිකාරිය වියදම් පිළිබඳව දැඩි පාලනයක් කරා යොමු වෙමින් පවතින බැවින් අයවැය ලේඛණයක් වෙන්කරලීම් සිදුකලද ඒවා පාලනයක් යටතේ සිදු වේ.

ඉංජි. ඩී ඩී ආනන්ද නාමල්
අධ්‍යක්ෂ ජනරාල්

ඉංජි. ඩබ් ජේ එල් එස් ප්‍රනාන්දු
සභාපති